ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

03 කතෝලික පූජක හා පැවිදි පිරිස් දේශපාලනයේ යෙදෙත් ?



08 ලෝක ධර්මදූත ඉරුදින



13 කතෝලිකයාගේ දේශපාලනය



# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07

www.colombocatholicpress.com

ඔක්තෝබර් 19 දා තේවත්ත ජාතික බැසිලිකාවේ පැවැත්වෙන "ජාතික තරුණ රැළිය" සජීවීව සියැලි හඬ සහ සියැලි දසුන් ඔස්සේ
www.lankacatholic.com
වැඩි විස්තර සඳහා අමතන්න
077-0353773, 077-1577779

ක්‍රි.ව. 2013 ක් වූ ඔක්තෝබර් 13 ඉරිදා 148 වෙළුම 20 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/51/NEWS/2013

## ජාතික ජපමාල රැළිය ඔක්තෝබර් 16 දා කුරුණෑගල දී



2013 වසරේ ජාතික ජපමාල රැළිය මෙවර ඔක්තෝබර් 16 දා දේශයේ සියළු පදවිවල සහභාගිත්වයෙන් කුරුණෑගල දී පැවැත්වේ. මරි මවුන්ගේ මැදහත්කමින් අප දේශයට ජේසු සමිඳුන්ගේ ආශිර්වාදය පතා ජපමාලය වටා එකට එක්වී යදින්නට සියළු දෙනාට ආරාධනා කරන බව කුරුණෑගල පදවි පූජක සංඝය පවසයි.

එදින උදේ 9.30 කුරුණෑගල සා. ආනා විදුහල් භූමියෙන් ජපමාල රැළියේ පෙරහර ආරම්භ වී නගරය හරහා ගමන් කර කුරුණෑගල මාලිගාපිටියේ දී අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ඇතුළුව රදගුරු හිමිපාණන් වහන්සේගේ සහභාගිත්වයෙන් පැවැත්වේ.

## "සැමට සරණ" රජත ජයන්තිය සමරයි

දේව රැකවරණය කෙරේ පූර්ණ විශ්වාසය තබමින් මීට විසිපස් වසරකට පෙර බීජයක් ලෙස රෝපණය වූ සැමට සරණ දයා සේවාව ඉකුත් දා සිය සේවාවේ රජත ජයන්ති සමරුව සැමරීය. 15 පිටුවට »



නිර්මාතෘවරිය වන ස්වර්ගස්ථ ගරු බර්නි සිල්වා පැවිදි සොයුරිය සමඟ අතිගරු ජෝ ද මැල් පියතුමා

## අන් කවරදාටත් වඩා යහපත් ලෙස

# කතෝලික සභාව වර්තමානයේ වර්ධනය වෙනවා!

### අති උත්තම ප්‍රැන්සිස් සසුනිසුරාණෝ වතිකානයේදී පවසති

**"කතෝලික සභාව බිඳ වැටී නැත. අන් කවරදාකටත් වඩා යහපත් ලෙස වර්තමානයේ ගමන් කරමින් සිටින බව පැවසීමට මම බිය නොවන්නෙමි" යැයි අති උත්තම ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා අවධාරණය කරයි.**



රෝම රදගුරු වසමේ පූජක පිරිසක් සමඟ සාන්ත ජෝන් ලැතරානු බැසිලිකාවේ පැවැති රැස්වීමක දී සසුන් පියා මේ බැව් පළ කළේය. සභාවට එරෙහි කුමන්ත්‍රණ මගින් සභාවේ ශුද්ධවන්තභාවයට හානි පැමිණවිය නොහැකි බවත්, දෙවියන් වහන්සේගේ ප්‍රේමය තුළ පූජක කැඳවීම ජීවමාන ගනිමින් ශුද්ධවන්තභාවය තුළින් සියලු කුමන්ත්‍රණ බිඳ දා අභියෝග ජය ගැනීමට හැකි බව සහතික යැයි උන්වහන්සේ පැවසූහ.

සභාව මේ වනවිටත් සාන්තුවරුන් බිහිකරමින් සිටින්නේ යැයි සිහි ගැන්වූ සසුන් පියා තෙරේසා මව්තුමිය බඳු විශාල ප්‍රසිද්ධියක් ලත් අය අතර කිසිදු ප්‍රසිද්ධියක් නැති අය ද වන බව සිහිපත් කළේය.

## දහම් පාසල් අවසාන සහතික පත් විභාගය

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය ඔක්තෝබර් 19, 20 යන දිනවල පැවැත්වීමට කටයුතු යොදා ඇත.

විභාග ප්‍රවේශ පත්‍ර මීසම් සේවක පියතුමන්ගෙන් ලබා ගත හැකි අතර විභාගය සඳහා පෙනී සිටින්නන්ට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් වටිනා සහතිකයක් පිරිනැමේ.

## ජේසු නිකායික වී. පර්නියෝලා පියතුමාගේ ශාස්ත්‍රීය සේවය අගයා උපහාර උළෙලක්

නිර්මාල් මධුසංඛ විසිනි



දිවි මගෙහි ශතකයක අභිමන් ලැබූ ජේසු නිකායික වී. පර්නියෝලා පියතුමාගේ ශාස්ත්‍රීය සේවාවට උපහාර සමාචාරය පුද කරමින් කැළණිය විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ ක්‍රිස්තියානි සංස්කෘතික, බෞද්ධ හා පාලි, සංස්කෘතික හා භාෂා යන අධ්‍යයන අංශයන් හා සමාජීය පීඨයේ ඉතිහාස අධ්‍යයන අංශයේ සංවිධාන දායකත්වයෙන් එම විශ්ව විද්‍යාල පරිශ්‍රයේදී බිනර මස 30 වැනි දින දී උපහාර උළලක් අති උත්කර්ෂවත් අන්දමින් පවත්වනු ලැබූහ.

ඉතිහාසඥයකු, වාග් විද්‍යාඥයකු, භාෂා විශාරදයකු හා නිහඬ පඬිරුවනක් වූ පර්නියෝලා පියතුමා ඉතාලි ජාතිකයකු වුවද ශ්‍රී ලංකාවට 15 පිටුවට »

## කොළඹ - කටුනායක අධිවේගී මඟෙහි කුමරි මරියාවන්ට ගෞරවනීය පෙරහරක්

ආවරණය වන ගම්වල මීසම් වාසීන්ට එක්වන මෙන් ආරාධනා! 15 පිටුවට »

## පාසල් අයදුම්පත් නිකුත් කැරේ

කොළඹ සා. බෙනදික් විදුහලේ 2014 - 6 ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ අයදුම්පත් නිකුත් කිරීම ඔක්. 14, 15 දෙදින ප.ව. 1.30 සිට ප.ව. 3.00 දක්වා විද්‍යාලීය කාර්යාලයේදී සිදු කැරේ. අයදුම්පත් ලබා ගැනීමේදී දරුවාගේ උප්පැන්න සහතිකය සහ ක්‍රිස්තියානි සහතිකය ඉදිරිපත් කළ යුතු බව අධ්‍යක්ෂ සහෝදරතුමා දැනුම් දෙයි.

මීගමුව ලොයොලා විදුහලේ 2014 වසරේ 06 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම සඳහා අයදුම්පත් නිකුත් කිරීම ඔක්. 14, 15, 17 දිනවල ප.ව. 2.00 සිට ප.ව. 4.00 දක්වා විදුහල් කාර්යාලයේ දී සිදුකැරේ. අයදුම්පත් ලබා ගැනීම සඳහා දරුවාගේ ක්‍රිස්තියානි සහතිකය හෝ පවුල් පොත සහ උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතු බව අධ්‍යක්ෂ පියතුමා දන්වයි.

## ගිහි සහභාගිත්වයේ සුවදාන මෙහෙයන් හා පොත පත පල කිරීම විමසීමට ලක් විය යුතුයි

විමල් කහතුඩුව විසිනි

කිතු දන පුබුදුවේ සාමාජිකයින්ව සිට ඉන්පසු එයින් වෙන්වී තැන තැන ආරම්භ කළ ගිහි නායකත්වය තුළ සහභාගිත්වයේ සුවදාන මෙහෙයයන් පිළිබඳව දැඩි විමර්ශනයක් අවශ්‍ය බව ජාතික ගිහි කොමිසම් සාමාජිකත්වය අවධාරණය කරයි.

විශේෂයෙන්ම විදේශ සංචාර මුල්කොට ගෙන මෙම සුවදාන මෙහෙයන් ආරම්භ වී ඇති නිසා ඒවා කැබලි වලට කැඩී වෙන්වී මූලධර්මවාදයට අත වනන නිසා ඒ පිළිබඳව දැඩි විමසීමක් මෙන්ම ඔවුනට දේවස්ථාන හා පාසල් ගොඩනැගිලි ලබා දීම ගැනත් දෙවරක් සිතිය යුතු බව තවදුරටත් ඔවුන් පවසා සිටී. එලෙසම පාප්තුමන්ගේ කුරුසිය වටා නයෙක් ගෙතූ පින්තූර සහිතව පත්‍රිකා බෙදන සමහර කණ්ඩායම් දේව දයාවේ 15 පිටුවට »

## මුළු ලෝකය මරි මව්ට කැප කිරීම අදයි



මුළු ලෝකය මරියතුමියගේ නිර්මල හෘදයට කැපකිරීමේ විශේෂ මෙහෙය ඔක්තෝබර් 13 ඉරිදා (අද) වතිකානයේ දී අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන් අතින් පුද කැරේ.

පෘතුගාලයේ පාතිමා හි ආශ්චර්යවත් දේවමාතා ප්‍රතිමාව වර්ෂ 1920 දී එය ස්ථාපිත කිරීමෙන් පසු 11 වන වරට ඔක්තෝබර් 12 වැනිදා රෝමයට රැගෙන ආ අතර ඊයේ රාත්‍රිය පුරා සර්ව රාත්‍රි යැදුම් මෙහෙයක් ද පැවැත්වීමට නියමිතව තිබිණ.

## වැඩමුළු සියයයි

ඥානාර්ථ ප්‍රදීපය හා ළමා ප්‍රදීපය සහය සංස්කාරකවරයකු වන කුමර නයනජිත් මහතා පසුගියදා තලවිල පවත්වනු ලැබූ වැඩමුළුවත් සමඟ ලේඛක හා පෝෂක වැඩමුළු සියයක් සම්පූර්ණ කරන ලදි. ළමාවිය, යොවුන් විය සහ බැදි වැඩසටහන් සම්පාදනය මේ වැඩමුළුවල මූලික ඉලක්කය විය.

**"අපි ස්ථිරව සිටිමු නම්, උන්වහන්සේ සමඟ රජකම් කරන්නෙමු." (2 තිමෝති 2:8-13)**

පදවියෙන් පදවියට



තල්විල සා. තෙරේසා මුනි දේවස්ථානයේ නව සේවක මඬුල්ලක් පත්කර ගත් අතර මීසම් සේවක ගරු ෆ්‍රෑන්ක් තිසේරා සහයක ගරු ඩෙනිස් ගයාන් පියතුමන් සමග ප්‍රදීප කැමරාවට මුහුණ දුන් අයුරු.

ඩබ්. ඒ. ඩී. ඩේවිඩ් අප්පුහාමි

# දෙවිඳුන් මහිමයට පත් කරන්න ඔබ ලජ්ජා විය යුතු නැත

## කුරුණෑගල රදගුරු හිමිපාණෝ පවසති

**ඔබේ මුතුන් මිත්තන් රැකගත් විශ්වාසය ඔබ ඔබේ දරුවන්ට දායාද කරන්න, දෙවිඳුන් මහිමයට පත්කරන්න. නිරන්තරයෙන් එයට සාක්ෂි දරන්න. ඔබ ලජ්ජා විය යුතු නැතැයි දෙහිගහපිටිය ශු. තෙරේසා මුනි දේවස්ථාන 80 සංවත්සර මංගල දේව මෙහෙයේදී කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ පැවසූහ.**

එහිදී උන්වහන්සේ මෙසේද පැවසූහ. ඔබ ඔබේ දරුවන් විශ්වාසය තුළ ගොඩනගනවාද? ඔබ ඔබේ දරුවා පෞද්ගලික ටියුෂන්පන්තියට යවන්න දක්වන උනන්දුව දේවස්ථානයේ දහම් පාසලට යවන්න දක්වන්නේ නැහැ නේද? දරුවා අධ්‍යාපනයෙන් ඉහලට යනවා. වෛද්‍යවරයෙක්, ඉංජිනේරුවෙක් වෙනවා. එහෙත් අධ්‍යාත්මයක් නොමැති කමින් ඔහු ඔබව වැඩිහිටි නිවාසයකයි නවත්තන්නේ.

මෙවර මංගල්‍ය සඳහා මීසම් සංසය මෙහෙයවනු ලැබුවේ මීසම් සේවක ගරු ජූඩ් අමිල ප්‍රනාන්දු පියතුමන් විසිනි.

ජයසිරි ප්‍රනාන්දු

## වකුගඩු රෝගියකුගෙන් ආයාචනයක්!



හලාවත පදවියේ කට්ටකඩුව මීසමේ 29 වියැති ඩෙනිසන් සිල්වාගේ වකුගඩු දෙකම අක්‍රියවී ඇති නිසා ඔහුට වකුගඩුවක් බද්ධ කළ යුතු බව වෛද්‍යවරුන් නිර්දේශ කර ඇත.

ඔහුට අවශ්‍ය O+ (පොසිටිව්) වර්ගයේ වකුගඩුවක් දීමට කැමති පරිත්‍යාගශීලියකු වේනම් 0719766083, 0729413152 අමතන ලෙසත්, ඔහුගේ ප්‍රතිකාරවලට අධික මුදලක් වැය වන නිසා මුදලින් ආධාර කිරීමට කැමති අය හැටන් නැෂනල් බැංකුවේ 003020617674 ගිණුමට මුදල් බැරකරන ලෙසත් ඉල්ලා සිටී.

## කුරුණෑගල පදවි මරිය හමුදා ධර්ම විවේකය කුඩාගම දී

කුරුණෑගල පදවි මරිය හමුදා වාර්ෂික ධර්ම විවේකය පසුගිය සති අන්තයදී කුඩාගම නිර්මල ලූර්දු දේව මාතා සිද්ධස්ථානයේදී පැවැත් විය. යාච්ඤාව සහ යාච්ඤාවේ ජීවිතය තම ජීවිත ඇසුරෙන් පැහැදිලි කරමින් මරිය හටයින් දැනුවත් කළේ මීසම් සේවක ගරු ජීවන්ත පීරිස් පියතුමාය.

පාදනමස්කාරය, දිව්‍ය පූජාව, සුව මෙහෙය, පෞද්ගලික යාච්ඤාව සඳහා මෙහිදී මරිය හටයින්ට සහභාගි වීමට අවස්ථාව සලසා තිබුණි. පදවියේ මරිය හටයින් සියයකට අධික පිරිසක් මේ සඳහා සහභාගි වූහ. කුරුණෑගල පදවි මරිය හමුදා අධ්‍යක්ෂ ගරු ලයනල් ප්‍රනාන්දු පියතුමාගේ අදහසකට අනුව මෙවර වාර්ෂික ධර්ම විවේකයේ සියලු කටයුතු සංවිධානය කොමිටිසියම් සභාපති මලලිකා රුද්‍රිගු සොයුරියගේ මූලිකත්වයෙන් සිදු කරනු ලැබීය.

ටී. එම්. පී. සන්ධ්‍යා කුමාරි



ජාඇල තුඩැල්ල ක්‍රිස්තුරාජ ජාතික පාසලේ 70 වන සංවත්සරය නිමිත්තෙන් කනිෂ්ට ආදි ශිෂ්‍ය සංගමය මගින් සංවිධානය කළ 'කිතුරද අබිමන් පා ගමන' පසුගියදා විදුහල් ක්‍රීඩාංගනයෙන් ආරම්භ වී මීගමු පාර ඔස්සේ වැලිගම්පිටියට ගොස් නැවත විදුහල කරා ගමන් කළේය. විදුහල්පති ගරු නිහාල් රුද්‍රිගු පියතුමා සමග පළාත් සභා මන්ත්‍රීවරුන් වන ආනන්ද හරිස්චන්ද්‍ර, සිරිකමල් ද සිල්වා හා ශ්‍රිනාත් පෙරේරා යන මහත්වරුන් පා ගමනේ ගමන් කළ අයුරු.

ඇන්ටන් ජයසූරිය

## රාජගිරියෙන් ඉරණපලෙයි කරා නෑ ගමනක්!

කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් අගරදගුරු වසමේ ජනතාවගෙන් ඉල්ලා සිටි පරිදි උතුරේ පවුල් හා සහයෝගිතාවය ගොඩනගා ගැනීමේ අරමුණින් රාජගිරිය මීසමේ භාග්‍යවන්ත ජුසේවාස් වැඩිහිටි සුබසාධක සංගමයේ සාමාජිකයන් 20 දෙනෙක් පුදුකුඩිඉරිප්පු මීසම් සේවක ගරු අරුල්වෙල්වන් පියතුමාගේ මඟපෙන්වීම මත ඉරණපලෙයි පාතිමා අප ස්වාමිදු දෙව්මැඳුර කරා ගියහ.

රාජගිරියෙන් ගිය පිරිස කණ්ඩායම් තුනකට බෙදී පීඩාවට පත්ව හිඳින පවුල් විසිපහක් බැහැදැකීමට ගියහ. අවසානයේදී මීසම් පාසලට රැස්කළ පවුල්වලට එක පවුලකට රුපියල් 4000/= වටිනාකමින් යුතු වියළි ආහාර ද්‍රව්‍ය මළු බෙදා දුනි. මීට අමතරව පීඩාවට පත් පවුලකට නිවසක් තනා ගැනීමට රුපියල් 250,000/= මුදල් පරිත්‍යාගයක්ද පිරිනැමිණි. කුඩා දරුවන්ට විනෝදය පතා විවිධ ක්‍රීඩා පැවැත්විය.

රයිලි පෙරේරා

## සා. ආනා බැතියේ පැති කඩක්!

අප සමාජයේ එදා වගේ අදත් විශේෂයෙන් කුඩා කල ආත්තම්මාට නැත්නම් ආච්චිඅම්මාට දක්වන්නේ පුදුම සෙනෙහසක්. අප එදා කුඩා කල ආච්චි අම්මාට තුරුලුවී කතාන්තර අහන්න. යාච්ඤාවන් පුරුදු වන්න හරිම ආසයි. අපට සුරතල් බස් කියමින් ලෙන්ගතු කමින් අපට සංවේදි වනවා. මෙය අප සමාජය තුළ සමාජගත වෙලා තියනවා. ආගමික වශයෙනුත් අපගේ ප්‍රශ්නවලට පිහිට උපකාර ලබන්නට දුක් ගැනවිලි කියන්න ඉබේම පුරුදු වෙලා තියෙන්නෙ ආනා මුනිවරියගේ පිහිට උපකාරයි. සාන්ත ආනා මුනිවර බැතියේ වර්ධනයට මෙයද පැතිකඩක් වන්නේයයි රත්නපුර කුරුවිට පැරඩයිස් හි සා. ආනා මුනිවරිය දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍ය පවත්වමින් අක්කරෙයි පත්තු ආරෝග්‍ය මාතා දෙව්මැඳුරේ සේවය කරන රත්නපුර පදවියේ ගරු ඉන්දික අයාල් ප්‍රනාන්දු පියතුමා පැවසීය.

රත්නපුර මීසම් සේවක ගරු රන්ජන් මාල් මොරායස් සහ සහයක ගරු ගේබ්‍රියෙල් නිකුලස් යන පියවරුන්ගේ සහභාගිත්වයෙන් මංගල දේව මෙහෙය පැවත්විණි.

තියබෝල්ඩ් සමරතුංග



මහජන චෝදනා අවම කරමින් සාමකාමී ජනතාව හා සහයෝගයෙන් දූෂණ, අපරාධ හා නීති විරෝධී ක්‍රියාවන්ගේ මර්දනයට අවංකවම උපරිම කැපවීමෙන් බැතිමත් කිතුනුවකුවූ පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සුරේෂ් ද සිල්වා මහතා ප්‍රමුඛ පමුණුගම පොලිසියේ කාර්ය මණ්ඩලය ඉටුකරන සේවාව ඉතා විශිෂ්ට යැයි පොලිස් දිනය නිමිත්තෙන් උස්වැටකෙයියාව සා. මරියා දෙව්මැඳුරේ පැවැති විශේෂ දේව මෙහෙයේදී උස්වැටකෙයියාව මීසම් සේවක ගරු අයිවන් පීටර්ස් පියතුමා පැවසීය. මෙම විශේෂ දේව මෙහෙය ගරු ජයන්ත ප්‍රනාන්දු පියතුමා සිදුකළ අතර පමුණුගම පොලිස් ස්ථානාධිපති තුමා ඇතුළු පොලිස් නිලධාරීන්ද, ප්‍රජා පොලිස් ආරක්ෂක කමිටු නිලධාරීන් හා සාමාජිකයන්ද ප්‍රදේශයේ බැතිමතුන්ද මේ අවස්ථාවට සහභාගි වූහ.

ජෝ. සංගපාලආරච්චි

## බුළුතොට ඉංග්‍රීසි අධ්‍යාපන වැඩසටහන ඇරැඹේ

අපට ඇවිදින්න කකුල් දෙකම අවශ්‍ය වගේම ඔබ ජීවිතේ අධ්‍යාත්මිකය අමතකකර එක් පැත්තක් පමණක් සම්පූර්ණ කර ගත්තොත් ඔබට ඇවිදින්න වෙන්නේ කොර ගසමින් යැයි රත්නපුර පදවියේ ලේඛකාධිකාරි බෙලිහුල්ඔය මීසම් සේවක අතිගරු ටෙන්සින් පෙරේරා පියතුමා බුලුතොට ඉන්ටග්‍රල් ඇකඩමියේ ඉංග්‍රීසි අධ්‍යාපනය සඳහා නවක සිසුන් බඳවා ගැනීමෙන් පසු පැවැති දිව්‍ය පූජා යාගයේදී පැවසීය.

තවදුරටත් අදහස් දක්වමින් මෙම ස්ථානය ඉංග්‍රීසි පමණක් උගන්වන ස්ථානයක් නොවන බවත්, මෙය ආධ්‍යාත්මික වර්ධනයක් ඇතිකරන ස්ථානයක් බවත් පැවසීය.

මෙම දිව්‍ය පූජාවට ඇකඩමියේ අධ්‍යක්ෂ ගරු එමිල් ප්‍රනාන්දු පියතුමා, රක්වාන මීසම් සේවක ගරු පෝල් ප්‍රනාන්දු පියතුමා, රදගුරු ලේකම් පියතුමා, ගරු මාග්‍රට් පැවිදි සොයුරිය සමග නවක සිසුන්ගේ දෙමාපියෝද එක්වූහ.

සුමිත් මාර්ක් ද සිල්වා



කොළඹ විශ්ව විද්‍යාලයේ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන 'සබත් දිනය' පසුගියදා විශ්ව විද්‍යාල පරිශ්‍රයේදි පවත්වනු ලැබීය. සබත් දිනය යනු කොළඹ අගරදගුරු පදවියේ ඇති අනෙකුත් විශ්ව විද්‍යාලයන්හි කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරවල සිසුන් සමග පැවැත්වෙන සුහද හමුවකි. මොරටුව සා. සෙබස්තියන් විදුහල්පති ගරු බොනි ප්‍රනාන්දුපුල්ලේ පියතුමන්ගේ දේශනයකින්ද, දිව්‍ය පූජාවකින්ද සමන්විත වූ මේ දිනය සිසුන් ඉදිරිපත් කළ ගීත, නර්තන, නාට්‍ය සහ විනෝද ක්‍රීඩා වලින් වර්ණවත් විය.

තුසිත ජයකොඩි

ඥානාර්ථ ප්‍රදීපය
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com
ක්‍රිස්තු වර්ෂ 2013 ඔක්තෝබර් 13 ඉරිදා

# ලේබල අලවා ගත් කතෝලිකයන්ට මේ 'ප්‍රායෝගික රෝහලේ' ඉඩ නැත

අති උත්තම ප්‍රැන්සිස් සසුන් පියාණන් විසින් 'La Civilta Cattolica' නැමැති ජේසු නිකායික සඟරාවේ ඉතාලි ජාතික සංස්කාරක ගරු ඇන්ටෝනියා ස්පාඩාරෝ පියතුමන් සමග කළ සම්මුඛ සාකච්ඡාව අද ලොව පුරා ප්‍රචලිත විවිධ වූ ජනමාධ්‍ය ධාරාවන් වල ප්‍රධාන මාතෘකාව බවට පත්වී ඇත. ශීල ධර්මතාවයත් සුවිශේෂයේ ඉගැන්වීමත් සමබර කොට සදහම් දැක්ම ජීවිතය කර ගත යුතු කතෝලිකයා ධර්ම ගවේෂී ප්‍රවනතාවයක සිට දහම අත් දැකිය යුතු බවට තිරසාර බලාපොරොත්තුවක් එම සම්මුඛ සාකච්ඡාව තුළින් සසුන් පියා නිවැරදිව ගෙන හැර දක්වයි. මේ සම්මුඛ සාකච්ඡාවේ සම්පූර්ණ විස්තරය ඉදිරි 'ප්‍රදීපය' කලාපයකින් ඉදිරිපත් කෙරුමටද අප අදහස් කොට ඇත.

ශ්‍රී ලාංකේය කතෝලිකයා විශ්ව ගත මේ කතෝලික දැක්මට දැන් විවෘත විය යුතු කාලය එළඹී ඇත. අද වන විට විශ්ව කතෝලික සභාවේ නිද්‍රාශීලි ස්වාභාවයෙන් කටයුතු කළ නිදහස් නැතිනම් ලිබරල් මතවාදින් අවදි වී සිටී. පසෙකින් සංස්ථිතික නැතිනම් ගතානුගතික කතෝලිකයන් අවදි වෙමින් පවතී. තවත් පැත්තකින් චිරන්තන නැතිනම් සම්ප්‍රදායික කතෝලිකයන් අඩවන් වූ දෑස් විවෘත කොට නිදි ගැට පිසලමින් සිටී. සියල්ලෝම එකම මාවතකට පැමිණෙමින් සිටිත්ද? එය එසේ විය යුතු බවට ඉඟි ඉතාමත් නිවැරදිව අතිඋත්තම ප්‍රැන්සිස් සසුන් පියා සමස්ත සාකච්ඡාව තුළ පවසා සිටි බව විමර්ශකයින්ගේද ඒකායන විග්‍රහයයි. අවංක භාවයත්, පරිස්සම්වීමත් සමස්ත සාකච්ඡාව පුරා විනිවිදව පැවතිනි. තමන්වහන්සේ නිරපේක්ෂකව බලයට යටත්වීම අපේක්ෂා නොකරන්නකු බවද සසුන් පියා පෙන්වා දී ඇත.

පසුගිය දශක ගණනාවක් පුරා බටහිර ලෝකය තුළ කතෝලික දහම නිර්වචනය වී තිබුනේ වදන් කිහිපයකට පමණි. ගබ්සාව, සමලිංගිකතාව, උපත් පාලන ප්‍රවනතා හා අපචාර යන වචන කිහිපයකට කොටු කළ කතෝලික විශ්වීයත්වය එයින් මුදා සුවිශේෂයේ දහමින් පෝෂිත ශීල ධර්මතාවයක් කරා කතෝලිකයා රැගෙන යාමට සසුන් පියා පියවර ගෙන සිටී. එහෙත් කිසිම ලෙසකින් ඉහත සඳහන් සංකල්ප හමුවේ ජීවිත පාරිශුද්ධත්වය අවතක්සේරු කරන්නට කිසිම වදනක් සසුන් පියා සාකච්ඡාවේදී උපයෝගි කොට නැත.

ශ්‍රී ලංකාව තුළ පවා කතෝලිකයින් අතර ලේබල් කතෝලිකයන් ගෙවුනු දශක ගණනාවක් පුරා බිහිවෙමින් පැවතිනි. සාම්ප්‍රදායික, සංස්ථිතික, නිදහස් මෙන්ම විමුක්තිකාමී දේශපාලන සංදර්භයක් තුළ සිරවුන කතෝලිකයින්ද මේ රට තුළ අපි දැක ඇත්තෙමු. කතෝලික සමාජ දර්ශනය හදාරන්නට සිත් වූවන් විමුක්තිකාමී ලේබලය බලෙන් පවරා ගත් ස්වරූපයක් තුළ අතරමං වී සිටි අයුරු අපි දැක ඇත්තෙමු. නිදහස් මතධාරී කතෝලිකයන් යයි පවසාගනිමින් හුදෙක් සභා නිල නායකත්වයටම පහර ගසන්නට දහමත්, වචනයත්, පැවැත්මත් කැප කළ උදවිය අප අතර හිඟ නොවූ බවද අපි දැක ඇත්තෙමු. නැවත ඉපදුනු කතෝලිකයින් යැයි පවසමින් ශුද්ධාත්ම ආනුභාවය අනුහස් රැල්ලක් තුළ අතරමං කොට කැබලි වලට කැඩී ගිය කණ්ඩායම් වල වල්මත්වූ කතෝලිකයින්ද අපි දැක ඇත්තෙමු. ගතානුගතික වත්පිළිවෙත් පමණක් හිස් මුදුනින් පිළිගෙන දහම චාරිත්‍ර ඉටුකිරීමට පමණක්ම සීමා කළ කතෝලිකයින්ද අපි දැක ඇත්තෙමු. ආසියාවේ දෙවි දහමක් යැයි පවසමින් පක්ෂ දේශපාලනයේ අසූචි වලට වැටී දඟලන කතෝලිකයන්ද අපි දැක ඇත්තෙමු.

මේ ලේබල ඔවුනොවුන් ගසා ගත්තා වැනියි. මානව හිමිකම් රැකීම යනු බලය ඇත්තන්ගේ චරිත ඝාතනය කොට බලය නැත්තන් ඒ අයුරින්ම ජීවත් කරවීම නොවේ. දේශපාලනය කළ කතෝලිකයන් මෙය වරද්දා ගත්තේ වරක් දෙවරක් නොවේ. එය එසේ වුයේ ඒ පවරා ගත් ලේබලයට ඔහු/ඇය මුවා වී තම වපසරිය පටු කරගත් නිසයි. ශීල ධර්මය තුළ අනිසි බලපෑම් මතුකොට දහමට වඩා නීතිය උසස් කොට සැලකුවේ ඒ ලේබලයට ඔහු/ඇය මුවාවී සැඟවීමට උත්සහ කළ නිසයි.

විවිධ කතෝලිකයින් අලවා ගෙන සිටින මේ විවිධ ලේබල ගලවා දමන්නට කාලය උදාවී ඇති බව සසුන් පියා පවසන්නේ වර්තමාන කතෝලික සභාව "ප්‍රායෝගික රෝහලකටද" සමාන කරමිනි. රදගුරු තුමන් හා පැවිදි පූජක උතුමන් එහි වෛද්‍යවරුන් පමණක් නොවිය යුතු අතර ගිහියා සාත්තු සේවකයින් බවට පමණක්ම පත් විය යුතු නැත.

එහෙත් ඒ සැමගේ ක්‍රියාකාරිත්වය එකතුවිය යුත්තේ සභාව කරා පැමිණෙන සියල්ලන්ගේ තුවාල සුව කරන්නටයි. හදවත් උණුසුම් කරන්නටයි. ඒ පැවැත්මෙන් සභාව යළි ගොඩනැගිය යුතු බවට සසුන් පියා කරන ආරාධනාවට අපත් ශ්‍රී ලාංකේය සභා නිර්වචනයක් යොදා ගත යුතු නොවේද? ලේබල වලින් තොරව කතෝලිකයා එකමුතු විය යුතුයි. මන්ද සසුන් පියා පවසන පරිද්දෙන්ම කතෝලිකාගම තහංචි පැනවීමේ යල් පැන ගිය එකතුවක් නොවේ. එය ධනාත්මකව තෝරා ගැනීමක්මයි.

දැන් අපි සියල්ලෝම අති උතුම් ප්‍රැන්සිස් සසුන් පියාගේ "ප්‍රායෝගික රෝහලේ" උපස්ථායකයින් වී සිටිමු. එය එසේ නොවේද?

# වෙරළබඩ තීරයේ මීසම් සේවක පියවරුන් වෙත කෙරෙන ආයාචනයකි

ධීවර සංඝයන් (Communities) තමන්ගේ උදාරත්වය, තම නිත්‍යානුකූල අවශ්‍යතාවයන්, ආශා, පැතුම්, දුෂ්කරතාවයන් හා අවංක සැබෑ එඩේරික සැළකිල්ලක් ලබාගැනීම පිළිබඳව වඩ වඩා සංවේදී බවකින් හා අවධානයෙන් සිටින බව මගේ විමසුම් ඇසට ලක්විණි.

එහෙයින් වෙරළබඩ තීරයේ මීසම් සේවක පියවරුන් වෙත මා ආයාචනා කරන්නේ මා ඉදිරිපත් කරන යෝජනාවන් සහභාගිත්වයේ ස්ප්‍රීතුවෙන් සළකා බලන ලෙසය.

ඔබ, ධීවර සංඝයන් සමග ඔවුන් වෙනුවෙන් රැඳී සිටිත්වා. ධීවර සංඝයන්, ඔවුන්ගේ ඉතිහාසය, සම්ප්‍රදායයන් හා සමාජයීය මානසිකත්වයන් සහිත විශේෂිත සමාජ කණ්ඩායමක් බව සළකන්න. ධීවර ජනතාවට, සාධාරණ, සමානාත්මතාවෙන් හා සහෝදරත්වයෙන් යුත් වඩා යහපත් ජීවිත තත්ත්වයකට එළඹෙන්නට බාධා පමුණුවන, ඔවුන් මැඩ පවත්වන බලවේග යක් විග්‍රහකර හඳුනාගන්න.

ඔවුන්ගේ දැවෙන අවශ්‍යතාවනට, ගැඹුරු ආශාවනට, දුෂ්කරතාවනට, ප්‍රීති සන්තෝෂ හා බලාපොරොත්තුවලට සවන් දෙන්න.

අධ්‍යාපනයේ අවශ්‍යතාවය (ළමා, තරුණ, වැඩිහිටි) තරයේ ඒත්තු ගන්වන්න. වටිනාකම් පිළිබඳ අධ්‍යාපනයක් ලැබීමට ඔවුන් දිරිගන්වන්න. ඔවුනට (ළමා, තරුණ, වැඩිහිටියන්) එකට එක්වී, වඩා මානුෂිකවූ පූර්ණ ජීවිතයක් සඳහා තමන්ම තීරණ ගනිමින් වැඩකටයුතු සංවිධානය කිරීම සඳහා ඔවුන්ගේම ස්වෙච්ඡා සංගම් පිහිටුවන්න. තමන්ගේම සංඝයන්ටත්, සමාජයටත්, සභාවටත් සේවය කරන්නට හැකිවන පිණිස ඔවුන් අතරින්ම නායකයන් පුහුණු කරන්න.

ශු. බයිබලය පිළිබඳ දැනුමක් ඔවුනට දෙන්න. යාච්ඤා කිරිමට හා දේව වචනය ජිවත් කරවීමටත් ඔවුනට මඟපෙන්වමින් සක්‍රමේන්තු තුළ උත්ථානවූ කිතු තුමන් හමුවීමට ඔවුන් පොළඹවන්න. පවුල් දිවියට පිවිසෙන තරුණ තරුණියනට අධ්‍යාපනික හා ධර්මෝපදේශික වැඩසටහන් දියත් කරන්න.

තරුණ තරුණියනට වෘත්තීය මඟපෙන්වීම සඳහා අවස්ථාවන් සළසන්න.

ජේසුතුමන් තුළින් හා එතුමන් මගින් ප්‍රකාශිතවු දෙවිඳුන්ගේ කොන්දේසි විරහිත ආදරය හෙළිදරවු කිරීම සඳහා ධීවර සංඝයන්හි දක්ෂ පුද්ගලයන්ගේ සහයෝගය (Collaboration) සහභාගිත්වය ලේඛනගත කරන්න.

ඒකාග්‍රතාවය හා විශ්වාසවත් කම පූජක තුමකුගේ ජීවිතයේ ඉතා වැදගත් වන අතරම මුදල් පිළිබඳ කටයුතු වලදී විනිවිද පෙනෙන ස්වභාවයත්, වගවීමත් ධීවර සංඝයන්ගේ විශ්වාසය දිනාගැනීමට ඉවහල්වන බව මතකයේ තබාගන්න. දේව ජනතාවට දේශනා කිරීමට, ඉගැන්වීමට, හා මඟපෙන්වීමට ඔබගේ අගනා කාලය, ශක්තිය හා ශුද්ධවත්වූ ජ්වලිතකම යොදවන්න. අන්‍යොන්‍ය විශ්වාසයේ, ප්‍රේමයේ හා සේවයේ කිතුනු සංඝ ගොඩනගන්න.

ඉහත දැක්වූ යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍යවන මීසම් සේවක පියතුමන්ලාට, පත්තඩුවන (පොල්වත්ත) දෙව්අරණ දූතසේවා සජීවික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ පියතුමාගෙන් විමසන්න.

**ගරු එම්මානුවෙල් ප්‍රනාන්දු (නි.ම.නි) පියතුමා**

# කතෝලික පූජක සහ පැවිදි පිරිස් දේශපාලනයේ යෙදෙත් ?

**පසුගිය ඉරිදා දිනක ඥානාර්ථ ප්‍රදීපයේ මුල් පුවත වූයේ සුදතුම් පියතුමා කතෝලික පූජකවරුන් සහ පැවිදි කොටස් වලට දේශපාලනයේ නිරත වීම කැපවූ දෙයක් බව කියවෙන පුවතකි.**

ශ්‍රී ලංකාව වැනි රටක 'දේශපාලනය' යන්නට දෙන අර්ථ කථනයට අනුව මෙය කෙනෙකු වැරදි ලෙස වටහා ගත හැකිය. සුදතුම් පියතුමා 'දේශපාලනය' යනුවෙන් අද අපේ රටේ ක්‍රියාත්මක වන බලය ලබා ගැනීම සහ බලයේ රැඳී සිටීම සඳහා කරනා පටු දේශපාලන ක්‍රියාකාරකම් අදහස් කරන්නේ නැතිබව ඉතා පැහැදිලිය. මෙහිදී උන්වහන්සේ විශේෂයෙන් පූජක සහ පැවිදි පිරිස් සෘජුවම දේශපාලනයේ නිරත විය යුතු බවද පවසති. මේ පිළිබඳව අදහසක් ප්‍රකාශ කිරීමට පෙර 'දේශපාලනය යන්නෙහි සැබෑ අරුත අප වටහා ගත යුතුය. දේශපාලනය මූලික වශයෙන් සෘජුව රාජ්‍ය පාලනය හා බැඳේ. රාජ්‍යය පාලනය කිසියම් රටක පවතින යථාර්ථයන්ට අනුකූලව ඥානාන්විතව සහ දූරදර්ශිව කළයුතු වන අතර එසේ කිරීම අපි දේශපාලනය ලෙස හඳුන්වමු. සැබවින්ම රටක යහපාලනය නියමාකාරයෙන් සිදුකිරීමේ ක්‍රියාවලිය දේශපාලනය ලෙස අපිට හැඳින්විය හැකි. ඕනෑම සංදර්ශනයක් තුළ අපට දේශපාලනය අත්දැකිය හැකිය. එසේම රාජ්‍ය පාලනය සහ රටක කටයුතු කළමනාකරණය කරනු ලබන ආකාරයට අනුව ඒ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය සහ පැවැත්ම තීරණය වේ. ජනතාවගේ ජීවිතවලට සෘජුවම 'දේශපාලනය' බලපෑම් කරන්නේ නම් දේශපාලනයේ යෙදීම කතෝලික පූජකවරුන්ගේ සහ පැවිදි පිරිස්වල බරපතලම වගකීමක් වන බව නැවත - නැවත කිව යුතු වන්නේ නැත. මක්නිසාදයත්, යහපත් රාජ්‍යයක් බිහිවීම තුළ අනිවාර්යයෙන්ම යුක්තිගරුක, සාධාරණ සහ සමානාත්මතාවයේ දේශයක් බිහිවනු ඇත.

මේ රට තුළ වෙනත් ආගම් වලට සම්බන්ධ පූජක, පූජ්‍ය සහ පැවිදි කොටස් එකිනෙක දේශපාලන පක්ෂ වලට සෘජුව සම්බන්ධවී ක්‍රියාකාරී පක්ෂ දේශපාලන කටයුතු වල යෙදෙන බවත් කතෝලික සභාවේ පූජක සහ පැවිදි පිරිස් සැමවිටම තමන්ගේ දේශපාලන අදහස් සහ ක්‍රියාකාරකම් වලදී කිසියම් ස්වාධීනත්වයක් පවත්වාගෙන යාම ඉතාමත් ආඩම්බරයට කරුණකි. එසේම අවශ්‍ය මොහොතේ ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් පක්ෂ භේදයකින් තොරව මඟපෙන්වීම් කිරිමට කටයුතු කරති. වසර 30 කට අධික කාලයක් පුරා මේ රටේ ඇවිලී තිබූ යුද්ධයේ දී සැමවිටම කතෝලික සභාවේ පූජක සහ පැවිදි පිරිස්, පුද්ගලයින් හා කණ්ඩායම් ලෙස ඉතාමත් ස්වාධීන මතයක් දැරූ අතර පීඩාවට පත්වූවන් වෙනුවෙන් පෙනී සිටීමට බිය වූයේ ද නැත. මේ නිසාම යුද්ධය පිළිබඳව අතීතවාදී අදහස් දරනා කණ්ඩායම් කතෝලික සභාවටත් එහි පූජක සහ පැවිදි පිරිස් වලටත් විවිධ ලේබල් ඇලවීය.යුද්ධය අවසන්වූ පසු සංහිඳියාව සහ යළි ගොඩ නැගීම පිළිබඳව කතිකාවක් සඳහා පත්කරනු ලැබූ කොමිසම ඉදිරියේ කතෝලික සභාවේ පූජක සහ පැවිදි පිරිස් නොබියව සාක්ෂි ඉදිරිපත් කිරිම ඔවුහු දේශපාලනයේ යෙදීමට හොඳම සාක්ෂියකි. මෙසේ ඉදිරිපත් කරනු ලැබූ බොහෝ කරුණු සහයෝගිතා කොමිසමේ අවසාන වාර්තාව තුළින් පිළිගැනීම විශාල ජයග්‍රහණයකි.

සුදොතුම් පියතුමා කතෝලික පූජක සහ පැවිදි කණ්ඩායම් දේශපාලනයේ යෙදීම අනිවාර්යයෙන්ම කළ යුතු යැයි සඳහන් කරන්නේ මෙවැනි දේශපාලනයක් පිළිබඳවය.

**අරුණ ශාන්ත නෝනිස්**

කැමිලස්ගේ — තිත්ත ඇත්ත



මීසමෙන් මීසමට

# ජීවිත කුරුස තුළ විශ්වාසයෙන් සන්නද්ධ වෙමු

**සෑම කන්දක් අවසානයේ පල්ලමක් ඇතුවා සේ සෑම කුරුසියක් පසුපසම ජයග්‍රහණයක් ඇති බව අප අවබෝධ කරගත යුතුයි. අවශ්‍ය වන්නේ සිය විශ්වාසයේ දිවිය පළුදු කර නොගෙන දිනෙන් දින ධර්මය තුළ පරිණත වීම යැයි පල්ලෙවෙල සිරි කුරුසියේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල දේව මෙහෙයේදී බලංගොඩ මීසම් සේවක ගරු සර්ජියස් ප්‍රනාන්දු පියතුමා ප්‍රකාශ කළේය.**

පෙරදින සන්ධ්‍යාවේදී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ රැගත් පෙරහර ගම හරහා සංචාරය කළ අතර මීසම්වාසින්ගේද සහයෝගය ඇතිව කීරපත්දෙණිය මීසම් සේවක ගරු ශ්‍රී ලාල් ප්‍රනාන්දු පියතුමා මංගල කටයුතු මැනවින් සංවිධානය කර තිබිණ.

බී. එල්. වීටස් ඇනස්ලි



හැඳල බලගල සදාසරණ දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍ය මහ පූජාව සඳහා කොළඹ අගරදගුරු පදවියේ නැගෙනහිර කලාපීය නාහිමි අතිගරු සිරිල් ගාමිණී පියතුමා සහ කොළඹ කතෝලික මුද්‍රණාලයේ අධ්‍යක්ෂ ගරු එඩ්රිච් රුද්‍රිගු පියතුමා බලගල මීසම් සේවක ගරු ජූඩ්රාජ් ප්‍රනාන්දු පියතුමා සමග දෙව්මැඳුර වෙත පැමිණි අවස්ථාව මෙහි දැක්වේ.

නිමල් පෙරේරා

## මරිය වසරට පේරලන්දේ සූදානමක්!

"ජපමාල මාසය" නිමිත්තෙන් පේරලන්ද මීසම් සේවක ගරු ලියනගේ පැට්රික් පෙරේරා නි.ම.නි පියතුමන්ගේ පූර්ණ මඟපෙන්වීම ඇතිව මීසමේ ගෙන්ගෙට ජපමාල දෙව්මාතා ප්‍රතිමාව වැඩම කිරීමේ වැඩපිළිවෙලක් ආරම්භ විය.

පේරලන්ද දෙව්මැඳුරු බල ප්‍රදේශයේ ගෙන්ගෙට ප්‍රතිමාව වැඩම කිරීමෙන් අනතුරුව ඔක්තෝබර් මස අවසාන ඉරුදින සියළු ප්‍රතිමා දෙව්මැඳුරට පෙරහරින් වැඩම කරවා එහිදී ජපමාල මංගල්‍යය සිදුකරන බවත් මෙය "මරිය වසර" ට පෙර සූදානමක් බවත් පියතුමා පැවසීය.

සී. ආර්. ඩික්සන් ඇන්ටනි

පමුණුගම සේදඋයනට ඇතුලුවන පාලම මංසන්ධියේ සවිකර ඇති දර්ශණීය නාම පුවරුව මෙම සේයාරුවෙන් දැක්වේ. සියලු සාන්තුවරයන් නමින් කැපවුණු මෙම ස්ථානයේ මීගමුව කලපුව පසුබිම කරගෙන සාන්තුවරයන්ගේ ප්‍රතිමා තැබීමට කටයුතු යොදා ඇති අතර ඒ සඳහා දායකවීමට ආරාධනය කෙරේ. මෙම ස්ථානයේ සවස්වරුවේ භාවනානුයෝගිව යාච්ඤාවේ නිරතවීමට අවශ්‍ය පසුබිම සකස්කර ඇති අතර මෙහි මංගල්ලය නොවැම්බර් මස පළමුවන දින පැවැත්වීමට ගරු ආනන්ද විතාන පියතුමා සමග සේදඋයන සංවිධායක මණ්ඩලය සැලැසුම් කර ඇත.




බෙන්ජමින් කිරිහෙට්ටි

## එකමුතුකම ඔප්නැංවූ මංගල උලෙළක්

නාලවලාන ශුද්ධවූ මිඛායෙල් අග්‍රදූතයාණන්ගේ වාර්ෂික මංගල්‍යය ඇතුගල්පුර පදවි පරිපාලන නාහිමි අතිගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමන් විසින් පවත්වන ලදී.

කිතුනු දූත සේවා මණ්ඩලය පෙරටුව තරුණ සමිතිය මගින් පොල් තොරණක්ද, කිතුනු දෙටු හවුල හා අනිකුත් සමිති උනන්දුව මත ශුද්ධවූ පවුලේ පැවිදි සොයුරියන්ගේ මඟපෙන්වීම යටතේ බොදුනු අයගේ සහයෝගය ඇතිව සාර්ථක උත්කර්ෂවත් මංගල්‍යයක්ද නිමා විය.

කාමන් සකුන්තලා

## කෝට්ටේ දිසා විසෙන්ති පාවුලා වැඩිහිටි දිනය



රාජගිරිය, බත්තරමුල්ල, තලංගම, කෝට්ටේ, නුගේගොඩ, මහරගම සහ පන්නිපිටියයන කොන්ෆරන්ස් වලින්සමන්විත ශාන්ත වින්සෙන්තිද පාවුලු සංගමය විසින් වාර්ෂිකව පවත්වනු ලබන වැඩිහිටි දිනය ඉකුත්දා තලංගම ශුද්ධ වූ ජුවාම් දල්බස්තෝනි දේවස්ථානයේදී වැඩිහිටියන් 75 කය අධික පිරිසකගේ සහභාගීත්වයෙන් පැවැත්විනි. විවිධ විනෝදාත්මක වැඩසටහන්, ආහාර සමග තෑගිද පිරිනැමීය.

## කොරළවැල්ලේ වෛද්‍ය සායනයක් සහ ලේ දන්දීමක්

කොරළවැල්ල, ග්‍රාමවාසින්ගේ සුවසෙත පිණිස සා. මිඛායෙල් අග්‍රදූතයාණන්ගේ දෙව්මැඳුරු පරිශ්‍රයේදී දෙව් මැඳුරේ වාර්ෂික මංගල්‍යය නිමිත්තෙන් කොරළවැල්ලේ සා. මයිකල් කිතුනු යොවුන් හවුල මීසම් දායක සභාව එක්ව මොරටු එලිය සිංහ සමාජයේ සහයෝගයෙන් කොරළවැල්ලේ මීසම් සේවක ගරු එරික් මදුරාවල පැතුනි පියතුමාගේ මාර්ගෝපදේශකත්වයෙන් ඉතා සාර්ථක වෛද්‍ය සායනයක් සහ ලේ දන්දීමේ වැඩසටහනක් පවත්වන ලදි.

මෙම සායනයේ දී ශල්‍යකර්ම සහ කාච ලබාදීම සඳහා රෝගීන් තෝරා ගත් අතර පෙනීම දුර්වල අයගේ ඇස් පරීක්ෂාකර ඇස් කන්නාඩි සපයන ලදි. ළමා රෝග, ඇදුම හා පෙනහළු ආශ්‍රිත රෝග දියවැඩියාව, දන්ත හා වෙනත් රෝග සඳහා රෝගීන් පරීක්ෂාකර අවශ්‍ය බෙහෙත් සහ උපදෙස් ලබාදුනි. ඇතැම් අයගේ සැඟවුණු රෝග නිශ්චය කොට, වෛද්‍යවරුන් විසින් වැඩිපුර පරීක්ෂණ සහ ප්‍රතිකාර සඳහා රෝගීන් රෝහල් වලට යොමුකරන ලදි. සා.



මයිකල් යොවුන් හවුල විසින් සාර්ථක ලේ දන්දීමේ කඳවුරක් ද පවත්වන ලදි.

ක්‍රිස්ටි ප්‍රදිනාන්දු

## දිප්පිටිගොඩ පාතිමා දෙව්මැඳුර



දළුගම මීසමට අයත්, දිප්පිටිගොඩ පාතිමාවේ අප ස්වාමිදු දෙව් මැඳුරේ වාර්ෂික මංගල්‍යය ඔක්තෝබර් 13 (අද) පැවැත්වේ. දෙව් මැඳුරේ ඉතිහාසය සොයා බැලීමේදී එය 1949 මාර්තු මස 09 වැනිදා කුඩා දෙව්මැඳුරක් ලෙස ඉදිකොට ඇති අතර ඒ සඳහා දිප්පිටිගොඩ ග්‍රාමවාසි කිතු බැතිමතුන් අතර ප්‍රකට වින්සන් පෙරේරා, ජෝන් පෙරේරා වැනි පැරැන්නන් මෙන්ම ග්‍රාමවාසි කිහිප දෙනකු දැඩි වෙහෙසක් දරා ඇති බවත් මොනවට පැහැදිලිවේ.

ගරු මර්සලීනු ජයකොඩි පියතුමාගේ වදනකට අනුව 'කුඩා බෙත්ලෙහෙම' ලෙසින් විරුදාවලි ලත් මෙම ගම් පියසේ ජීවත්වූ, එවකට තරුණ වියේ කිතු බැතිමතකු වූ වැන්සස් පෙරේරා තරුණයා විසින් එවකට දළුගම මීසම්පතිව සිටි ඇම්. අපොන්සු ගරු පියතුමාගෙන් කරන ලද ඉල්ලීමක් අනුව, ඔහුගේ පියා වූ පී. වින්සන් පෙරේරා මහතා විසින් පරිත්‍යාග කරන ලද ඉඩම් කොටසක පළමුවෙන්ම පාතිමාවේ අපස්වාමිදු වෙත කැප කරන ලද කුඩා දෙව් විමනක් ඉදිකරන ලදී. 1950 - 1960 කාලය තුළ නව දෙව්මැඳුරක අවශ්‍යතාවය මතුවූයෙන් තරුණ පිරිසකගේ හා ගම්වාසින්ගේ බලවත් උනන්දුව නිසා 1972 දී එවකට සහයක රදගුරු අතිඋතුම් එඩ්මන් ප්‍රනාන්දු හිමිපාණන් විසින් මුල්ගල තබා 1978 දී නව දෙව්මැඳුර ගොඩනැගී අතිඋතුම් නිකලස් මාකස් අගරදගුරු හිමිපාණන් විසින් ආසිරි ගන්වා ඇත. එවකට දළුගම මීසම් සේවක ගරු ලියෝ පෙරේරා පියතුමා සේවය කළේය.

ජුබිලි සමයේදී දෙව්මැඳුරට පාතිමාවේ අප ස්වාමිදු නව ප්‍රතිමාවක්, දිව්‍ය සත්ප්‍රසාද මංජුසාවක් ස්ථාපනය කැරිණ. මුල් අවධියේ ස්ථාපනය කළ ප්‍රතිමා අදත් එහි දිස්වේ.

සෑම මසක පළමු සෙනසුරාදා දින පැවැත්වෙන ආගමික මෙහෙයන් කිතු බැතිමතුන් අතර පාතිමාවේ මෑණියන්ගේ ගෞරවයට හේතුවනු නො අනුමානය. වත්මන් මීසම් සේවක ගරු ජූඩ් ෂාමෙන් පියතුමා ප්‍රමුඛ දිප්පිටිගොඩ සංඝය දෙව්මැඳුරේ මංගල්‍ය කටයුතු සඳහා ආයකත්වය දරති.

ලියෝ එෆ්. දිසානායක

## දළුපොත විසෙන්ති පාවුලා මංගල උලෙළක්

සා. වින්සෙන්තිද පාවුලා මුනිඳුගේ මංගල්‍යය උත්කර්ෂවත් අන්දමින් පවත්වන්නට දළුපත ශුද්ධ වූ අන්තෝනි කොන්ෆරන්සිය කටයුතු කළේය. ජපමාල උච්චාරණය සමගින් සා. වින්සෙන්තිද පාවුලා ප්‍රතිමාවට විශේෂ ස්ථානයක් හිමිවිය. කුඩ, කොඩි, සේසත් පෙරටුව අල්තාරය වෙත පුද පඬුරු පෙරහරක්ද පැවැත්වීය. එදිනම සවස මංගල උලෙළ අරභයා දිළිඳුනට වියලි ආහාර පාර්සල් බෙදාදෙන ලදී.

මෙයට සමගාමීව ඊළඟ සතියේදී පළාත් වාසීන්ට වෛද්‍ය සායනයක්ද පැවැත්විය. එහිදී ඇස් කණ්නාඩි, දියවැඩියාව හා සර්වාංග රෝග සඳහා නොමිලේ ප්‍රතිකාර කිරීමට වෛද්‍යවරුන් පැමිණි අතර ඒ සඳහා ආයකත්වය මීගමු සිංහ සමාජයෙනි.

කේ. ඒ. රෝලන්ඩ් ලෙස්ලි



හපුගොඩ ආශ්චර්යවත් දේවමාතා මංගල්‍යය මරිමවුන් තුළින් දෙවිසමිඳුන් වෙතට තේමා කරගෙන මීසම් සේවක ගරු රසික ඉවාන් කුරේ පියතුමන්ගේ ආරාධනයෙන් ජාතික දෙව්සත්හලේ කථිකාචාර්ය ගරු විමල් තිරිමාන්න පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය. මීසම් සහයක ගරු අජිත් සුරංග පියතුමාගේ සහ ගරු ප්‍රදේශවාසි පැවිදි සොයුරියන්, සහෝදර තුමන් සමග බැතිමතුන් රැසකගේ සහභාගිත්වයෙන් පැවැත්විණ.

එච්. ඒ. කල්දේරා

## ලියුකේමියා රෝගී දරුවා අවසන් ගමන් යයි

පසුගිය සතියේ පළවූ ලියුකේමියා රෝගී විෂ්ණුවර්ධන් දරුවා ඉන්දියාවේදි අවසන් සුසුම් හෙළා ඇති බව දෙමාපියෝ දැනුම් දුන්හ. එමනිසා තවදුරටත් ඒ දරුවාට ආධාර අවශ්‍ය නොවන බව කරුණාවෙන් සලකන්න.

## මෝදර ස්නාවක ජුවාම් මංගල්ලෙන් ගමේ පිබිදීමක්!

වසර 180 කට වඩා පැරණි කොළොම්තොට මෝදර ශු. ස්නාවක ජුවාම් මුනිඳුන්ගේ වාර්ෂික මංගල්‍යය මෙවර මහත් උත්සවාකාරයෙන් පැවැත්වුණි.

සත්‍යයේ නාමයෙන් ජීවිත බිලි පූජාවක් කිරීමටත්. සිය දේව කාර්යය නියමා කාරයෙන් ඉටු කිරීමටත්, ජේසුස් වහන්සේගේ පෙර මඟ සලසන්නා ලෙස සිය දිවි පිදීමටත්, කතෝලික සභාව මගින් සත්‍ය ප්‍රකාශ කිරීමට ගොස් සිය ජීවිත බිලිදුන් පළමුවෙනියා වීමේ භාග්‍යය ලැබීමටත් ශු. ස්නාවක ජුවාම් මුනිතුමා වාසනාව ලැබූ බව කලුතර මීසම් සේවක ගරු සුරන් අත්තිඩිය පියතුමා පැවසීය.

මේ මංගල්‍යය ඉතාමත් අර්ථවත්ව පැවැත්වීමට මීසම් සේවක ගරු හේෂාන් නිලන්ත ප්‍රනාන්දු පියතුමා ඇතුලු තරුණ සමිතිය, තරුණ ක්‍රිස්තියානි ව්‍යාපාරය, නොවාන නායක නායිකාවන් සහ මෝදර සැදැහැවත් ජනතාව එක්වූහ.

රනිල් රාජපක්ෂ

## සමුගැනීමක් සමග පිළිගැනීමක්!



ගල්කිස්ස මීසම් සේවක ගරු ලියෝ පෙරේරා පියතුමාට සමුදීමත්, නව මීසම් සේවක ගරු සුසිත් ද සිල්වා පියතුමා පිළිගැනීමත් ගල්කිස්ස සා. අන්තෝනි මුනිඳුන්ගේ දේවස්ථානයේදී සිදුවිණ.

වචනයෙන් විස්තර කළ නොහැකි කාර්යභාරයක් ඉටුකළ ගරු ලියෝ පෙරේරා පියතුමා අවුරුදු 6 ක් තුළ මීසම් වාසින්ගේ ප්‍රශ්නවලට විසඳුම් දීමේදී සමාව දීම මූලිකව අගය කළ අතර එතුමා තුළ වූ මහඟු කරුණාවන්තකම මෙන්ම තමාව ප්‍රතික්ෂේප කළ අය තමා සමීපයට ගැනීම තුළින් කතෝලිකයන් මෙන්ම අන්‍යාගමිකයන් අතරද කැපී පෙනෙනා චරිතයක් විය.

සේයා - රොහාන් ඩැනියෙල්

සේය - ප්‍රේමා හීනටිගල

## "මරිය වසර" ප්‍රකාශයට තව මාසයයි

# ජීවිතය දුන් ජේසුනී...

**දෙවි මහෝත්තමයාණන් වහන්සේගේ ජීවමාන වැඩ සිටීම සුපැහැදිලිව සනාථ කිරීම සඳහා මෙහි මා විසින් පළ කරන්නාවූ සිද්ධිය 2007 වසරේ සිදුවූ සත්‍ය සිදුවීමකි.**

මා දරුවන් දෙදෙනකු සිටින කතෝලික ස්වාමිපුරුෂයකුගේ බෞද්ධ බිරිඳකි. හැම ඉරිදාම මහත්තයත් සමඟ හිඟුරක්ගොඩ "ක්‍රිස්තු රජාණන්ගේ දේවස්ථානයට" යන මා උන්වහන්සේ කෙරෙහි දැඩි ලෙස විශ්වාස කළා.

උන්වහන්සේ කෙරෙහි පැහැදුනා. කතෝලික දහම හොඳින් ඉගෙන ගත්තා. මා හට පුදුම විදිහේ විශ්වාසයක් ඇති වුණා. මහත්තයාගේ කිසිම බලපෑමක් නොමැතිව මාගේ කැමැත්තෙන්ම මා කතෝලික ආගම වැළඳ ගත්තා. අද මම හැම ඉරිදාමත් හැකි සෑම දවසකත් පල්ලියට ගොස් ජේසුස් වහන්සේ ලබන කෙනෙක්. ඉරිදාට මම පල්ලි නොගොස් ගෙදර ඉන්නා දවසක් නැති තරම්.

මා පළමු දරුවා ලැබී දෙවැනි දරුවා ලැබීමට 2007 වසරේ පොළොන්නරුව රෝහලට ඇතුළත් වුණා. නිසි පරිදි දරුවා නොලැබීම හේතුවෙන් මා සිසේරියන් සැත්කමට ගන්නා ලෙස වෛද්‍යවරු තීරණය කළා. මට නිරෝගී දරුවකු ලැබුණා. එහෙත් මට එදා සිට කෑම ගැනීමට කිසිම ප්‍රියතාවයක් තිබුණේ නෑ. මා හට හැමදාම උණ. දින පහ ගෙවුනු පසු මා හට නිවසට පැමිණීමට ඉඩ ලැබුණා. කිසිම වැඩක් කිරීමට, නැගිටීමටවත් මට ශක්තියක් නැහැ. කෑම කන්න බෑ. පවුල් සෞඛ්‍ය සේවිකාව මා පරීක්ෂා කර නැවත හිඟුරක්ගොඩ රෝහලට ඇතුළත් කළා. දෙවිඳුන් දුන් මහා තිළිණයක් ලෙස මගේ මහත්තයාත්, නැන්දම්මාත් මට ගොඩක් ශක්තියක් වුණා. දෙමාපියන් දෙදෙනාම අහිමි මට ඔවුන් දෙමාපියන් ලෙස අදටත් කටයුතු කරනවා. "ජේසුනි ඔබට ප්‍රශංසා වේවා"

මා හිඟුරක්ගොඩ රෝහලින් නැවතත් පොළොන්නරුව රෝහලට මාරු කර යැවුවා. මාගේ නැන්දම්මත්, දරුවත් මා සමඟ එහි ගියා. මගේ මුළු ඇඟම අඩපණ වෙලා. ක්ලාන්තය. නැගිටලාවත් යන්න බෑ. ඇඟ කහ වෙලා. මා දිහා බැලූ වෛද්‍යවරු බය වුණා. නැවතත් මා පරීක්ෂා කළ විශේෂඥ වෛද්‍යවරයා මාගේ කුසේ ලේ කැටයක් ඉතිරි වී තිබෙන බවත් එය නැවතත් ශල්‍යකර්මයට භාජනය කළ යුතු බවත් පැවසුවා. විටෙක මගේ හුස්ම හිරවෙනවා. නහයෙන් ලේ ගලනවා. ජේසුනී මට කුමක් වුණා ද? මම කෑ ගහලා ඇඬුවා. මා දිහා බලාගෙන අම්මත් අඬනවා. ඇයත් දෙවියන් වහන්සේ දැඩිව විශ්වාස කරන කෙනෙක්. මම හැම වෙලාවෙම කොට්ටේ යට තිබෙන මගේ යාච්ඤා පොත අරගෙන යාච්ඤා කරනවා. මට නැගිටින්නටවත් ශක්තිය නෑ. දරුවාට කිරි පොවන්නවත් මට ඉඳගන්න බෑ. අත හැම තැනටම කටු ගහලා. සේලයින් බලෙන් මම ජීවත් වුණා. මම දරුවා තුරුළු කරන් ඇඬුවා. ඇස් දෙක රිදෙන කල් ඇඬුවා. මහත්තයත්, දරුවෝ දෙදෙනත් මතක් කර "ජේසුනී" කියා ඇඬුවා.

අප මීසම් සේවක පියතුමා මට රෝහලට පැමිණ සත්ප්‍රසාද වහන්සේ ලබන්නට දුන්නා. මට එය ලොකු ශක්තියක් වුණා. පසුදා මාව නැවත ශල්‍යකර්මයට ගත්තා. මම ට්‍රොලියේ යන ගමන් යාච්ඤා කළා. මම ජේසුටම කතා කළා. ශල්‍යකර්මයෙන් පසුව මාව බැලීමට පමණක් විශේෂඥ වෛද්‍යවරයා දිනකට 3 න් පාරක් වාට්ටුවට එනවා. ඒත් මට සුවයක් නෑ. දින 3 - 4 ක් වුණා මට ඒත් උණ. මම අඬමින් යාච්ඤා කළා. මම ජේසුටම කිව්වා. වෛද්‍යවරයා 5 වෙනි දවසෙත් මාව පරීක්ෂා කළා. මට කිව්වා අම්මේ මේ ශල්‍යකර්ම එකක් කෙරුවහම දින 2 -3 ක් යනකොට උණ බහින්න ඕනෑ. ඒත් ඔයාට එහෙම නෑ. අපේ ශල්‍යකර්මය සාර්ථකයි එක ස්ථිරයි කිව්වා. අපි බලමු කියා ඔහු පිටවී ගියා. දෙවියනේ මට කාගේ පිහිටක් ද? මට මොනවා හරි වුණොත් මගේ දරුවෝ දෙන්නයි, මහත්තයයි තනි වෙනවා. මේ ලිපිය ලියන මොහොතෙත් මම එදා ඒ විඳපු වේදනාවලට දැනුත් දැසින් කඳුළු වැටෙනවා.

මම රෑ අමාරුවෙන් කොට්ටේ යටට අත දාලා ශ්‍රී කුරුසියේ යාච්ඤා පොත අරන් ජේසුට කිව්වා. මම උන්වහන්සේ ගැනම විශ්වාසය තිබ්බා. මම අන්‍යාගමිකයෙක්. එහෙත් ඔබවහන්සේගේ පිහිට බලාපොරොත්තුවෙන් ඔබවහන්සේව දැඩි ලෙස විශ්වාස කරනවා. ඔබවහන්සේ මට ආදරෙයි නම් මට පිහිට වෙන්න. හෙට උදේ වෙනකොට මගේ උණ බහින්න ඕනෑ කියා මා යාච්ඤා කළා. මම අඬලා කිව්වා. මම "ජේසුනි" කියලා කිව්වා. පොත ඉඹලා කොට්ටය යටින් තියාගෙන උන්වහන්සේ ගැනම විශ්වාසයෙන් මා නිදා ගත්තා.

හරිම පුදුමයි. උදේ මගේ ඔළුවෙන් වතුර ගලනවා වගේ දාඩිය වැටෙනවා. කොට්ටය තෙමිලා. ඔළුව තෙත් වෙලා. "ජේසුනි ඔබට ප්‍රශංසා වේවා" ඇඟට පුදුම සැහැල්ලුවක්. අම්මා කෑම කවන්න හදනකොට මම වෙනදා එපා කියනවා. එදා මම කෑම චුට්ටක් කෑවා. වෛද්‍යවරයා පැමිණ මාව පරීක්ෂා කළා. අද නම් ටිකක් හොඳයි කිව්වා. ලේ දීමට සූදානම් කර තිබූ මට ඇගේ ලේ ඇති හොඳට කෑම කන්න කිව්වා. දවසින් දවස මට සුව වුනා. මම දරුවත්, නැන්දම්මත් සමඟ මාසයකින් පමණ ගෙදර පැමිණියා. මගේ ලොකු දරුවා බදාගෙන මම ඇඬුවා. ජේසුට ස්තුති කළා.

අද අපි ඉතාමත් සතුටින් ජීවත් වෙනවා. අපි හැම ඉරිදාම පල්ලි යනවා. ගෙදර යාච්ඤා කරනවා. ජේසුස් වහන්සේ අපේ ජීවිතය කරගෙන සතුටින් ජීවත් වෙනවා. මාගේ අත්දැකීම උන්වහන්සේ "ජීවමානව වැඩ සිටින බවයි" උන්වහන්සේගේ ආදරය අප ලබන්නාවූ වටිනාම දීමනාවයි. ජේසුනී සදාකාලයෙන් සදාකාලයටම "ඔබවහන්සේට ප්‍රශංසා වේවා".

**✍ හිඟුරක්ගොඩ**
**එන්. ප්‍රියදර්ශනී**



### දහම් සිතිවිලි

*"අපි ජීවිත වලට පැමිණෙන දුක්, පීඩා කරදර, ආශිර්වාදයන් සේ සලකමු. ඒවා තුළින් දෙවියන් වහන්සේ අපව ආධ්‍යාත්මික "පරිණතභාවයට" පමුණුවා ගැළවීමේ මාර්ගය කරා ගෙන යන සේක.*

**(ගෝනවල - ලූෂන්)**

## අපගේ සුරලොව අම්මා

| | |
|---|---|
| සුරලොව සිට පැමිණි දෙව්දුතු ගේබ්‍රියෙල් පැවසු | ලෙස |
| දෙව්පුතුගේ මෙලොව මුල් නිවහන වුයේ ඔබගෙ | කුස |
| මිනිස් විමුක්තිය ලැබදීමේ මුල් පියවර | ලෙස |
| දෙව්ලොව හා අපෙ මනු ලොව එක්වුයේ ඒ | ලෙස |
| දෙව්පුතු ලෙසම ලොව ගැලවුමට දයක වු දෙව් මව් | අම්මා |
| ඥති සොයුරි එලිසබෙත් වර ලැබ තිබුනි ලැබුමට පදවිය | අම්මා |
| කරදර මැද වුවත් ඇය බලනට ගියේ අප පෙම්බර | අම්මා |
| සිය යුතුකම් ඉටු කරනට යොමු වූ සුරලොව | අම්මා |
| සුරැකි පියගෙ වැඩවලටත් අතහිත යොමුකළ | අම්මා |
| පොඩි දෙව් පුතු ද පිය සහයට යෙද වූ ආදර | අම්මා |
| සාමය, සතුට, සොම්නස මුළු පවුලට ලැබ දුන් | අම්මා |
| සුරැකි පියගෙ වියොවින් පසු පුතු රැකුනේ ඔබගේ දැතිනි | අම්මා |
| ජුදයින් විසින් කපාල මුදුනේ කුරුස ගත කළ ඔබේ | පුතු |
| අප මව් පදවිය ඔබ හට පුද කළේ ලෙසටම ඔබ | පැතු |
| කුරුසෙන් බා සිරුර උකුලට ගෙන කඳුලින් පිරි නෙතින් | යුතු |
| මෙවැනි ඝාතන නොමවන්නට පැතුවා නොවෙද මෙයින් | මතු |

**✍ ඩී. ඇන්ටනි වික්‍රමසිංහ**

## ජපමාල මාසයෙන් "මරිය වසර"ට

මේ ගත වන්නේ ඔක්තෝබර් මාසය යි. කතෝලික සභාව ඔක්තෝබරය හඳුන්වන්නේ "ජපමාල මාසය" ලෙසිනි. එදා "ජපමාල මාසය" අදට වඩා බෙහෙවින් වෙනස් ස්වරූපයක් ගැණිනි. එදා ජපමාල මාසය හැර මාසයේ වෙනත් මාස වල ද සෑම කතෝලික නිවෙසකම සැඳෑ යාමයේ පවුලේ බහුතරය ඒකරාශී වී ගෙයි මැද සාලයේ ජපමාලය උච්චාරණය කළේ අභිරහස් මෙනෙහි කරමින්, දේවමාතා ප්‍රාර්ථනය හා මළවුන් වෙනුවෙන් ද යාච්ඤා කරමිනි. යාච්ඤා කිරීමෙන් අනතුරුව බාලයන් විසින් වැඩිහිටියන් නමැද "ජේසු පිහිටයි" යනුවෙන් කීම අනිවාර්ය අංගයක් විය.

එදා කතෝලික පවුල්වල දෙමාපියන් අතර ද සහෝදර සහෝදරියන් අතර ද තිබුණේ ඉතා හොඳ සබඳතාවයකි; සමඟියකි; අන්‍යෝන්‍ය එකමුතුකම කි. මේ හේතුන් නිසා එවන් පවුල්වල තිබුණේ "මිහිර"කි. එකිනෙකාට ගෞරව කිරීම කැපී පෙනුනු අංගයක් විය. යාච්ඤාවේ ජීවිතයේ අග්‍රඵලයක් වූ මේ තත්ත්වය කතෝලිකයා සෙසු අයගෙන් වෙන් වී කැපී පෙනීමට හේතු සාධකයක් ද විය.

එදා ඔක්තෝබරය තුළ පවුල් යාච්ඤාව තිව්‍ර කරන්නක් විය. මීසම් සේවක ගරු පියවරු ජපමාල මාසය පුරා විවිධ වූ වැඩසටහන් දියත් කළහ. ජපමාල මාසය ආරම්භය උදාවත්ම මීසම් සේවක ගරු පියවරුන්ගේ සංවිධානයෙන් යුතුව නුවාන කොට්ඨාශ තුළ දේවමාතා ප්‍රතිමාව ගෙයින් ගෙට වැඩම කිරීම ද සිදුවිය. අවට පවුල් සමඟ එකතු වී ජපමාලය ඇතුළු යාච්ඤා මෙහෙයයක් සිදු කිරීම සිදු කෙරිණි. මාසය අවසානයේ දෙව්මැඳුරට දේව මාතා ප්‍රතිමා වැඩම කරවා පොදුවේ මීසම් වාසීන් ගරු පියතුමා සමඟ "ජපමාල මංගල්‍යය" සිදු කෙරිණි.

අද ද මීසම් රැසක ඉහත කියැවෙන වැඩසටහන ජපමාල මාසය සැමරුම හා මංගල්‍යය සිදු කිරීම සිදුවීම දක්නට ඇත. එසේ වුවද එය ගරු පියතුමාගේ සංවිධානයෙන් සිදු කෙරෙන නමුත් එය ජපමාල මාසයට සීමා වන බවක් දක්නට ලැබීම කනස්සල්ලට හේතුවක් වී ඇත.

☛ 15 පිටුවට

**✍ පේරලන්ද - සී. ආර්. ඩික්සන් ඇන්ටනි**

## වරක් ගයන්නා දෙවරක් යදින්නෙකි

**වරක් ගයන්නා දෙවරක් යදින්නෙකි. එය එසේම ය. වර්තමානයේ අපේ යැදුම සමහර විට ගිරවුන් සේය. එය අපේ සිත් තුළ නැත. හදවත් තුළ නැත. ගායනය එසේ නොව, එක්තරා ලතාවකට අනුව ගායනය කෙරෙද්දී මුහුදේ රළ මෙන් වරින් වර උස් පහත් වෙයි. එය සිතට කා වදී. හදවතේ තැන්පත් වූවා සේය. බැතිබරින්, බැතිබවින් පිරී ඇත.**

අපි වසරකට වරක් පාස්කු කාලය සමරන්නෙමු. මෙහිදී ශුද්ධවූ පැය පැවැත්වීම පාද නමස්කාරය සහ පසන් ගායනය විශේෂය. ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ප්‍රාප්තිය කුරුසියේ දිවි පිදීම මුල්කරගෙන ගයන ගීතිකා අතර කුරුසේ නැග අත්විහිදා යන දුක් ගීය ගායනා කරන විට අප හදවත් තුළ ජනිත කරවන, තැන්පත් වන, දුක වේදනාව, මනස්ථාපය කොතරම් ප්‍රබල ද? යාච්ඤා කිරීම යැදුම ප්‍රබල නොවේය කියනවායි නොසිතන්න.

පුංචි කාලයේ සිට මා ගායනයට ඉතා ආශා කළෙමි. ගැයුවෙමි. අදත් ගයන්නෙමි. මා කුඩා අවධියේදි අපේ දෙව්මැඳුරේ දිව්‍ය පූජාව මංගල්‍ය පූජාව පැවැත්වූයේ ලතින් භාෂාවෙනි. පූජාවට උදව්වන දරුවකු ලෙස පියතුමාට පියතුමාගේ යාච්ඤාවට පිළිතුරු යැදුවේ ද ලතින් භාෂාවෙන් වුවද, ලතින් භාෂාවෙන් ගැයූ "තාන්තුම් ඒර්ගෝ, ආවේ මාරිස්තෙලා" ආදි ගීතිකා තවමත් මහදේ රැව්දේ අදත් එය තනියම වුවද ගයන්නෙමි. පුංචි අපට එදා ගී ගයන්නට හුරු පුරුදු කළේ ද මේ පැරැණි ගීතයන්මය. සාන්ත ආනා මෑණියන්ට ගයන ගීතිකාව ද මරිය තුමියට ගැයූ "මා මව්නි" ගීතිකාව ද එලෙසම අනෙක් ගීතිකා ද කොතරම් අර්ථාන්විත ද? ආකර්ශනීය ද? සිත තුළ උපදින භක්තිය කොපමණ ද?

අතීත සිදුවීම් අතර මෙය ද මසිතට මතකයට නැගේ. ස්වර්ගස්ථ අති උතුම් එඩ්මන් පීරිස් රදගුරුතුමා, "ආසියාවේ රිදී සීනුව" නම් විරුදාවලිය ලත් ස්වර්ගස්ථ අති උතුම් ප්‍රැන්ක් මාකස් රදගුරුතුමා දිව්‍ය පූජා යාගය පුද කරද්දී ලතින් භාෂාවෙන් ගැයූ ඒ ගීත කොතරම් මිහිරිද? වැඩිහිටි අපට නම් තවමත් අපගේ හදවත් තුළ ඒ මතකය රැඳී ඇත. එදාට වඩා අද බොහෝ වෙනස් ය. කාලයත් සමඟ ලතින් බසින් පැවැත් වූ දිව්‍ය පූජා යාගය දේශානුරූපී විය. අද එය අපේ මව්බසින්ම සිදුවෙයි. මේ නිසාම අපි තව තවත් දෙවිඳුන් වෙතට ළං වුණෙමු. මේ සමඟම අපි තවත් ගැටලුවකට ද මුහුණ දී ඇත්තෙමු. එය නම් එක එක දෙව්මැඳුරුවල ගීතිකා කණ්ඩායම් තමන්ට රිසි පරිදි ගීතිකා රචනය කිරීමයි. තනු නිර්මාණය කරගැනීමයි. ඔවුන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කිරීමට ගන්නා උත්සාහයයි. හර්මෝනියන් එක වයලීනය අද නැත. ඉලෙක්ට්‍රොනික සංගීත භාණ්ඩ දිව්‍ය පූජා යාගයට නොගැලපෙන අයුරින් හැසිරවීමය.

දෙව්මැඳුරේ මංගල්‍ය දිව්‍ය පූජා යාගය සංගීත සන්දර්ශනයක් නොව කිතු සමිඳුන් සමඟ කුරුසියේ යාගයට අපි සම්බන්ධ වී සිටිනා බව අමතක නොකළ යුතුය. ලතින් භාෂාවෙන් දිව්‍ය පූජා යාගය සිදු කෙරෙද්දී එය නොදන්නා නිසා අපේ අම්මලා ජපමාලය මිමිනූ සැටි මතකය. වර්තමාන ගායනා කණ්ඩායම් ඔවුන්ගේම ස්ව නිර්මාණ ගීතිකාවන් ගයද්දී එය නොදන්නා අපට පියතුමා දිව්‍ය පූජා යාගය සිදුකරන දෙස බලා සිටීම හැර වෙනත් යමක් කළ නොහැකිය.

මෙහිදී මට පැරැණි කථාවක් මතකය. එය නම් අන්දරේ පූජාවට සහභාගි වුණ හැටිය. එක් දිනක් අන්දරේ දෙව්මැඳුරකට ගොඩ වී සෑම දෙනාම දණ ගසාගෙන පොත් අතේ තියාගෙන යාච්ඤා කිරීම දුටුවේලු. එය දුටු අන්දරේට පූජා පොතක් නොතිබූ නිසාත් අකුරු නොදන්නා නිසාත් තමාගේ කර වටේ බැඳි ලේන්සුව අතට ගෙන හතරට නමා, ඒ පැත්ත මේ පැත්ත පෙරළමින් පූජාව අවසන් වනතුරු දණගසාගෙන සිටියේලු. ගායනා කණ්ඩායම්වල නව නිර්මාණ නිසා අපට ද සිදුවන්නේ අන්දරේ මෙන් සිටීමට ය.

වරක් ගැයුම දෙවරක් යැදුමක් වන්නට නම් සැමටම සහභාගි වි ගායනා කළ හැකි ගීතිකාවන් දිව්‍ය පූජා යාගයේ දී ගැයීමට පූජාප්‍රසාදිතුමාගේ අනුදැනුම ඇතිව තෝරාගත යුතුය.

**✍ කෙත්හේන**
**පාවුලු ප්‍රනාන්දු**

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

## දෙවන සතිය බදාදා සැඳෑ යාම යැදුම

### 65 වැනි ගීය

**පසුගිය සතිය හා සබැඳේ...**

(ඇ) වගන්ති 11-12

මේ කොටසින් ගීතිකා කතුවරයා පැහැදිලි කරන්නේ සියලු බලයත් වරප්‍රසාදයත් දෙවියන් වහන්සේ සතු දේ බවයි. මේ සත්‍යතාව අවබෝධ වන්නේ විශ්වාසය තුළින් දෙවිඳුන් වෙත නිති යොමුවීමෙනි.

**මා බොහෝ වර අසා ඇත:** හෙබ්‍රෙව් බසින් මෙය "දෙවිඳුන් වරක් පවසා ඇත, මා දෙවරක් අසා ඇත" යනුවෙන් පරිවර්තනය කළ හැකිය. මෙම සාහිත්‍යමය හා සංඛ්‍යාත්මක යෙදුම ඇසුරින් දැක්වෙන්නේ මිනිස් ජීවිතය රඳා පවතින දෙවි සමිඳුන්ගේ ආධිපත්‍යය. (හිතෝප. 6:16-17, ආමොස් 1:3).

"බලය" සහ "තිර පෙම" : හෙබ්‍රෙව් බසින් මේ සඳහා යෙදෙන "ඕට්ස්" සහ "හෙසෙද්" යන වදන් දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරිත්වයේ ගුණාංග හුවා දක්වයි. දෙවි සමිඳුන්ගේ බලය මිනිස් සීමිතකම් ඉක්මවා යන්නකි. උන්වහන්සේ තිර පෙම මිනිසාගේ දුබලකම් ඉක්මවා යන උන්වහන්සේ දයා කරුණාව හඟවයි. (ජෝබ් 26:14, ගීතා 66:3, ගීතා 51:1, ජෙරම් 31:20)

**යැදුම**

අති කරුණාභරිත දෙවි මහෝත්තමයාණන් වහන්ස, අප ජීවිත රඳා ඇත්තේ ඔබවහන්සේගේ දැත මතය. ඔබවහන්සේට නිරන්තර කරුණාව හා ගැලවීමේ තිළිණය වෙනුවෙන් හෘදයාංගම තුති පැසසුම් පුද කරමු. අප ජීවිතයේ අභියෝග, දුක් කරදර මැද නිරතුරු ඔබවහන්සේගේ රැකවරණය අත් දකිමින් දහම් මගේ පෙරටම යාමට අපට පිහිට වුව මැනව.

☛ ලබන සතියට



**ගීතාවලිය**

ශුද්ධ ලියැවිලි වසර

**(67)**

ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා

**ගරු හෙන්රි සිල්වා පියතුමා**




## එළිදරව්වෙහි 01 පරිච්ඡේදය පිළිබඳ විවරණයක්

**පසුගිය සතිය හා සබැඳේ...**

සාධුකාරයන් හා ගීතිකා ග්‍රන්ථයේ අඩංගු වීම මේ අදහස තවදුරටත් තහවුරු කරයි. හොර රහසේ දේව වන්දනාව සඳහා රැස්වෙන සැදැහැවතුන්ට එය තේරුම් කර දී ඔවුන් දිරි ගැන්වීම එකල අත්‍යවශ්‍ය වූ කරුණක් බව අපට වැටහිය යුතුය.

කියවන්නා භාග්‍යවන්තයෙක් හෙවත් දේව ආශිර්වාද ලබන්නෙක් වන්නේ දේව පණිවුඩය අන්‍යයන්ට පහදා දී විශ්වාසයේ පැවැතීමට ඔවුන් දිරිගන්වන බැවිනි. අසන්නෝ එනම් ඒ පණිවුඩය භාරගෙන ඒ අනුව ජීවත් වන අය නිසැකයෙන්ම විමුක්තිය ලබන නිසා භාග්‍යවන්තයෝ වෙති.

එළිදරව්ව 1:4-8 (ආචාරය හා පැතුම්)
4 වෙනි වගන්තිය -

"ආසියාවේ සභා සතට ලියා එවන්නේ ජොහාන් නම් මමය. වැඩ සිටින, වැඩ සිටි, මතු වඩින දෙවියන් වහන්සේගෙන් ද ඔවුන් වහන්සේගේ සිහසුන ඉදිරියේ සිටින ආත්මයන් සත්දෙනාගෙන් ද විශ්වාසවන්ත සාක්ෂිකරුත්" ආසියාවේ සභා සත යනුවෙන් මෙහි හැඳින්වෙන්නේ එකල රෝම අධිරාජ්‍යයේ ආසියාව නමැති පළාතේ ආගම් පීඩනයට හසු වූ නගරයන්හි කිතුනු සභාවන් ය. පසුවට මෙම සභා 7 ගැන විස්තරයක් කරමු.

එළිදරව්ව ග්‍රන්ථයේ කර්තෘ ජොහාන් බව මෙහි කියැවේ. මෙය වටහා ගත යුත්තේ එළිදරව් සාහිත්‍යයේ ලක් ෂණයක් වන යම් ග්‍රන්ථයක් යම් කරුණක් නිසා ආරෑඪ නාමයකින් ඉදිරිපත් කිරීමේ සම්ප්‍රදායේ ආශ්‍රයෙනි. ග්‍රන්ථයේ ගැබ්වී ඇති පණිවුඩයේ වටිනාකම උලුප්පා දැක්වීමටත් සැබෑ කතුවරයාගේ ආරක්ෂාව සඳහාත් එළිදරව්වාදී ග්‍රන්ථ ආරෑඪ නාම වලින් ඉදිරිපත් කෙරෙන බව අප අසා ඇත. එම නිසා ජොහාන් අපෝස්තුළු තුමාගේ නමට මෙම ග්‍රන්ථය ආරෑඪ කර ඇතැයි යන මතය පිළිගත හැකිය. කිසිසේත් අදහස් නොකරමු.

☛ ලබන සතියට

# මා කවරෙක් ද? බෙදා දීම සඳහා කඩනු ලබන පූපය වෙමි

පසුගිය සතිය හා සබැඳේ....

**මුහුන්**

මුහුන් පිටි පිපීම සඳහා භාවිත කෙරෙයි. "දෙවියන් වහන්සේගේ රාජ්‍යය කුමකට උපමා කරම් ද? ස්ත්‍රියක විසින් පිටි නැලි තුනක් මුළුමනින්ම පිපෙන තෙක් එහි දැමූ මුහුන් පිඬකට එය සමානය" (ලූක් 13:20). පාන් සෑදීමේදී පිටිවලට මුහුන් එක් කිරීමෙන් පිටි ගුලිය වෙනස් වී විශාල වෙයි. ඉන්පසු සැහැල්ලු පෝෂ්‍ය දායී පාන් බවට පත් වේ.

ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රාවකයින් වන අපි, අපගේ සමාජයෙහි අප හා සමඟ වාසය කරන මනුෂ්‍ය පිටි ගුලිය තුළ මුහුන් විය යුත්තෙමු. අපිද කොටසක් වන මනුෂ්‍ය පිටි ගුලිය තුළ අපි මුහුන් වන්නේ කෙලෙසද? පවුල තුළ, අප ජීවත්වන වටපිටාව තුළ අපගේ සංඝයන් තුළ එසේ වන්නේ කෙලෙසද? සේවයෙන් සහ බැහැපත්කමෙන් පිරි කැපවූ ජීවිත මගින් අපට සමාජය සහ සභාව තුළ මුහුන් විය හැකිය.

**ජලය**

ශු. ජුවාම් තුමාගේ සුවිශේෂයෙහි අපි මෙලෙස කියවමු: "මංගල්‍යයේ අවසාන මහා දවසේදී ජේසුස් වහන්සේ නැගිට සිට හඬ නගා, යමෙකුට පිපාසා නම් ඔහු මා වෙතට පැමිණ පානය කෙරේවා. ශු. ලියවිල්ලෙහි කියා තිබෙන පරිදි මා කෙරෙහි අදහන්නා තුළින් ජීවනදායක ජලධාරා ගලන්නේ යයි ප්‍රකාශ කළ සේක. උන්වහන්සේ මෙසේ වදාළේ තමන් වහන්සේ කෙරෙහි අදහාගත්තවුන් මතු ලබන්නට සිටි ශුද්ධාත්මයාණන් වහන්සේ පිළිබඳවය. ශුද්ධාත්මයාණන් ඒ තාක් නොදෙන ලද්දේ ය. මන්ද ජේසුස් වහන්සේ ඒ තාක් මහිමයට පත් නොවූ බැවිනි. (ජුවාම් 7:37-39).

ජලය උල්පතකින් ගලා බසියි. ගලා බසිනා සෑම තැනකදීම ජීවිතය, වර්ධනය, හරිත වර්ණ ගස් කොළන්, පළතුරු සහ නැවුම්බව ලබා දෙයි. ජලය පිපාසය සංසිඳුවයි. එය පිරිසිදු කරයි. ජලය බලයකි. ශක්තියකි. ජීවිතයකි. ජලය නොමැතිව අපට ජීවත් විය නොහැකිය.

ජේසු ක්‍රිස්තු තුමන් අපට දෙන ජලය වඩ වඩා පානය කරන්නේ කෙසේද? කෙලෙසද? දිළිඳුන් කෙරෙහි වූ ආදර කරුණාවේ උල්පතක් වීමෙන් අප හට අන්‍යයින්ගේ ජීවිත වඩා ඵලදායක සහ ප්‍රීතිමත් කළ හැකිය.

**තෛලය**

යහපත් සමරිතානුවරයා සොරුන් විසින් පහරදුන් මිනිසාගේ තුවාල වලට මිදියුෂ හා තෙල් වත් කළේය. 45 වන සංගීතයෙහි අපි මෙසේ කියවමු. "ඔබගේ දෙවියන් වන යාවේ ප්‍රීතියේ තෛලයෙන් ඔබ ආලේප කර ඇත. " දාවිත් හමු වූ සාමුවෙල් සිය තෙල් බඳුන රැගෙන ඔහු ආලේප කළේය. තෙල්, රජුන් සහ රැජිණයන් අභිෂේක කිරීමේ පිළිවෙතහිදී භාවිත කෙරේ.

☛ ලබන සතියට

✍ ගරු එම්මානුවෙල් ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා

## පූජා සතිය ඔක්. 13 - 20 දක්වා

| | |
|---|---|
| 13 ඉරිදා | **සාමාන්‍ය සමයේ විසිඅටවන ඉරුදින**<br>(කොළ) 2 රාජාවලිය 5:14-17<br>ගීතාවලිය 98:1-4 2 තිමෝති 2:8-13<br>ලූක් 17:11-19 |
| 14 සඳුදා | **ප්‍රාණපරිත්‍යාගී ශු. 1 වන කැලිස්ටස් පාප්තුමා අනුස්මරණය**<br>(කොළ/රතු) රෝම 1:1-7 ගීතාවලිය 98:1-4<br>ලූක් 11:29-32 |
| 15 අඟහරුවාදා | **අවිලාහි සා. තෙරේසා කන්‍යාව අනුස්මරණය**<br>(සුදු) රෝම 1:16-25<br>ගීතාවලිය 19:1-4<br>ලූක් 11:37-41 |
| 16 බදාදා | **සා. හෙඩ්විජ් තාපසිකාව, සා. මර්ගරිතා මරිය අලකොක් කන්‍යාව අනුස්මරණය**<br>(කොළ/සුදු) රෝම 2:1-11<br>ගීතාවලිය 62:1-2, 5-6, 8<br>ලූක් 11:42-46 |
| 17 බ්‍රහස්පතින්දා | **ප්‍රාණපරිත්‍යාගී අන්තියෝකයේ ශුද්ධවූ ඉග්නාසියුස් මුනි අනිවාර්ය අනුස්මරණය**<br>(රතු) රෝම 3:21-30<br>ගීතාවලිය 130:1-6 ලූක් 11:47-54 |
| 18 සිකුරාදා | **ශුද්ධවූ ලූක් මුනි මංගල උළෙල**<br>(රතු) 2 තිමෝති 4:9-17<br>ගීතාවලිය 145:10-13, 17-18<br>ලූක් 10:1-9 |
| 19 සෙනසුරාදා | **ශු. ජෝන් ද බෙබෆ් සහ අයිසැක් ජෝග්ස් මුනිවරු සහ ප්‍රාණපරිත්‍යාගී පිරිස හෝ කුරුසියේ සා. පාවුළු මුනි අනුස්මරණය**<br>(කොළ/රතු/සුදු) රෝම 4:13, 16-18<br>ගීතාවලිය 105:6-9, 42-43<br>ලූක් 12:8-12 |
| 20 ඉරිදා | **සාමාන්‍ය සමයේ විසි නවවන ඉරුදින**<br>**ලෝක ධර්මදූත ඉරුදින**<br>**තේමාව : "ඇදහිල්ලෙන් සවිමත් වී, ඇපවෙමු කැපවෙමු දහම බෙදන්නට."**<br>(කොළ) නික්මයාම 17:8-13<br>ගීතාවලිය 121:1-8 2 තිමෝති 3:14 - 4:2<br>ලූක් 18:1-8<br>හෝ<br>ඉසයියස් 2:1-5<br>ගීතාවලිය 97:1-6 v2 හෝ v3<br>එපීස 3:2-12 මාක් 16:15-20 |

# දෙවි සමිඳාණන්ට තුති දෙමු

## සාමාන්‍ය සමයේ 28 වන ඉරුදින




සාමාන්‍ය සමයේ 28 වන සතියට ඇරයුම් ලබන අප අද සුපුවත මෙනෙහි කරමු.

සුවිශේෂ කතුවරයාට අනුව ජේසුස් වහන්සේ දැන් සිටින්නේ ගලීලයේ සමාරිය අතර මැද ප්‍රදේශයේය. ගලීලය හා සමාරිය අතර කිසිදු ගනුදෙනුවක් නොවීය. නමුත් සුවිශේෂ කතුවරයා පෙන්වා දෙන ආකාරයට මෙම ලාදුරු රෝගීන් දස දෙනා අතර සමාරිය ජාතිකයකු සිටීම කතුවරයා උලුප්පා පෙන්වා දෙයි.



ඒ අනුව ලෙඩ රෝග, දුක් කරදර යන මේ සියල්ල ජාති, කුල මල භේද යන සියල්ල පරයා යන යථාර්ථයකි. ලාදුරු රෝගය බෙදීම වෙන්කොට එකමුතුකම ගෙනැවිත් ඇත. මේ අනුව දෙවියන් වෙත ඇති ඇල්ම, විශ්වාසය හා ඇදහිල්ල මේ සියළු බාධක දුරලා අප සෑම එක් කරන බව අද සුවිශේෂ පාඨය පෙන්වා දෙයි. නමුත් දෙවියන් වහන්සේට ත්‍යාගශීලි වන්නේ මෙම සමාරිය ජාතිකයා පමණි.

"ඔවුන් දුරින් සිට" සමාරියන් ලාදුරු රෝගීන් සමඟ කිසිදු සම්බන්ධකමක් එකල නොවීය. (ලෙවී 13:45-46), (ගණන් 5:2) මෙම රෝගීන් යාර පහක් දුරින් සිට කතා කළ යුතු බව ඉතිහාසය පෙන්වා දෙයි. ඒ නයින් බලන කල අපට පෙනෙන්නේ ඔවුන්ගේ තනිකම, දුරස් බව හා කොන්කරනු ලැබීමයි. මෙවැනි පුද්ගලයන් දසදෙනෙක් සුවය ලැබූ නමුත් එක් අයෙක් පමණක් ස්තූති කිරීමට පැමිණෙයි. මනුෂ්‍යයාගේ ගුණමකුකම හා ස්තූති නොකිරීමේ ගතිය පෙන්වා දෙන හොඳම සුවිශේෂ ප්‍රකාශනය මෙයයි.

එක් පුංචි දරුවෙක් බෝට්ටුවෙන් ගමන් ගන්නා විට බෝට්ටුවෙන් එළියට විසි වී මුහුදට වැටිණි. එහි සිටි තරුණයෙක් රෞද්‍ර රළ මැදට පැන ජීවිතය ගැන ද නොතකා රළ සමඟ සටන් කොට දරුවා බේරා ගත්තේ ය. මෙම දරුවාගේ මව මෙම තරුණයාගෙන් ඇසුවේ "මාගේ පුතාගේ අතේ දමා සිටි ඔරලෝසුව කෝ" කියාය.

(i) අප ජීවිතයේ එක් අවධියක දී දෙමාපියන්ගේ (මවගේ, පියාගේ) දෙඅත් මත රඳා පවතියි. නමුත් අතපය උස් මහත් වූ විට අපට කරදරයක් සේ පෙනේ. මහළු මඩමකට දමා නොසලකා හරියි. අපි ත්‍යාගවන්ත ද? අපි කළගුණ දන්නවාද?

(ii) අප ජීවිත ගමනේදී විවිධ පුද්ගලයින් අපට හමුවේ. නමුත් අපට උදව් කළ පුද්ගලයින් නිමේෂයකින් අපට අමතක වේ. ගමේ පියතුමා, පැවිදි සොයුරියව මතකයට නැගෙන්නේ ළමා පාසලට ඇතුළත් කිරීමට අවශ්‍ය වූ විට පමණ ද? වෛද්‍යවරයා, හෙදිය, මේසන්වරයා, වඩුවා මේ ආදි කී නොකී පුද්ගලයන්ට අප කළ ගුණ සලකනවා ද?

(iii) අප දෙවියන් වහන්සේට ද, ස්තූති නොකියන අවස්ථා අපමණය. උසස් පෙළ, සා. පෙළ විභාග ළං වූ විට පල්ලියට පැමිණ භාරහාර වීම සාමාන්‍යයෙන් සිදුවේ. නමුත් ප්‍රතිඵල ආ විට ස්තූති කිරීමට පැමිණෙන්නේ කී දෙනා ද? ශරීර සෞඛ්‍යයට, දරුවන් උදෙසා කුරුස ගත වූ ජේසුස් වහන්සේට අප ත්‍යාග ශීලි ද? ඔවුන් වහන්සේට ත්‍යාගශීලිවන්නට සරල ක්‍රියා සෑහෙන බව පළමු කියවීම තුළින් අපට පෙන්වා දෙයි. එසේ නම් අපි මෙනෙහි කර බලමු අපි කොතැනද කියා.

✍ ජාතික දෙව්සත්හලේ ගොන්සාල්වෙස් සිංහල ආයතනයේ
ගරු රවින්ද්‍ර කුමාර සහෝදරතුමා

## පිළිපදින්න



**දිව්‍ය පූජාසනය දේවස්ථානය තුළ ක්‍රිස්තුන් වහන්සේව සංකේතවත් කරයි. එබැවින් අල්තාරය උඩින් හෝ එය වැසෙන ලෙස හෝ මල් සැරසිලි කිරීමෙන් වළකින්න.**

**(අගරදගුරු පදවි ජන වන්දනා කොමිසම)**

# කතෝලික සභාවේ ඉංග්‍රීසි උන්මාදය රජයන්නේද?

**කතුතුමනි,**

සිංහල සුද්දන් වීමට දඟලන ඇතැම් සිංහල කිතුනුවන්ගේ ඉංග්‍රීසි උන්මාදය අද කතෝලික සභාවටද බරපතල හානියක් වෙමින් ඇත්තේය. බොහෝ ගිහි පැවිදි සමුළු පැවැත්වෙන්නේද ඉංග්‍රීසි භාෂාවෙනි.

කොළඹ සුපිරි යැයි සම්මත දෙව්මැඳුරුවල ඉංග්‍රීසිය රජ වී ඇති අයුරු දකිනවිට ගැමි සිංහල කිතුනුවන් කොන් කරනු පෙනේ. මෙය ඉංග්‍රීසි භාවිතය හෙළා දැකීමක් නොවන අතර කැමති භාෂාවක් කතා කිරීමේ මානව හිමිකම් වලට අභියෝගයක්ද නොවේ.

සිංහල කතා කළ හැකි සිංහලයන් ආයාසයෙන් කළු සුද්දන් වීමට ගොස් සිංහල කම හා සිංහල සංස්කෘතිය පාවා දීම අභාගයයක් නොවන්නේද? සිංහල කතාකළ හැකි සිංහලයන් සිංහල නොදන්නා සුද්දන් ලෙස හැසිරීම නිසා ඉංග්‍රීසි නොදන්නා අය උපහාසයට ලක්වන අවස්ථා එමටය.

බහුතර සිංහලයන් සහභාගිවන සම්මේලන ඉංග්‍රීසියට පරිවර්තනය වීම යුක්තිසහගත නොවන්නේය. සමහර සමුළුවල ප්‍රකාශන පවා සිංහල අයට නිකුත් කරන්නේද ඉංග්‍රීසි බසිනි. මෙය කොපමණ අසාධාරණද? මේ ඉංග්‍රීසි උන්මාදය අපේ ගැමි කිතුනු පවුල්වලටද මුල් අදිමින් පවතින බව පෙනේ. අපේ සිංහල පළාත් වලද දැන් විවාහ මංගල ආරාධනා පත් මුද්‍රණය කර ඇත්තේද ඉංග්‍රීසි බසින් පමණය. ආරාධනා පත්‍රය ලබන ඉංග්‍රීසි නොදන්නා බොහෝ අයට ආරාධනා පත්‍රය තේරුම් කර ගැනීමට ඉංග්‍රීසි දන්නා අය පසුපස දුවන්නට සිදුවී ඇත්තේය.

මේ භාෂාමය හා සංස්කෘතික බල අරගලය හමුවේ ඉංග්‍රීසි නොදන්නා කිතුනුවන් නූගතුන් ලෙස කොන්වීම අභාග්‍යයකි. සිංහල රටේ සිංහල කතෝලික සභාව සිංහලෙන් දේව ජනතාව ඇමතීම දෙවියන් වහන්සේට අපකීර්තියක් නොවන නිසා සිංහල රටේ සිංහල කළු සුද්දන්ගෙන් කතෝලික සභාව බේරා ගත යුතුව ඇත.

**ජෝ. සංගපාලආරච්චි**
පමුණුගම

# සදාචාරවත් ඇඳුමෙන් දෙව්මැඳුරු සරසමු

**කතුතුමනි,**

ශ්‍රී ලංකා වාසි කිතුනු බැතිමතුන්ගේ ප්‍රධාන ආගමික සිද්ධස්ථානයන් වන උතුරෙන් මඩු සිද්ධස්ථානය, වයඹින් සා. ආනා දෙව්මැඳුර. දකුණෙන් මාතර සිද්ධස්ථානය, රාගම තේවත්තේ බැසිලිකාව වැඳපුදා ගැනීමට වන්දනා කරුවෝ මංගල්‍ය මාසවල සතියකට පෙර පැමින ලැගුම් ගනිති.

වත්පිළිවෙත්වලට දක්වන සැලකිල්ල සිය ඇඳුම් පැළඳුම් වලට නොදක්වන සමහර කිතුනුවෝ කිතු දහමටත් නිගාකරති. කිතුනු ආගමික වන්දනාව යනු විනෝදාත්මක චාරිකාවක් නොවේ. ආගමික වන්දනාවකි. බැතිමතුන් සමහර විට මත්පැන් ගෙනයති. සමහරුන් දෙව්මැඳුරට යන්නේ ව්‍යාපාර කිරීමටය. විශේෂයෙන් තරුණියන් හා කාන්තාවන්ගේ විලාසිතා ප්‍රදර්ශනාගාරය



කිතුනු දෙව්මැඳුරුය.

දෙව්මැඳුරට එන සමහර කාන්තා විලාසිතා නිසා අඟපසඟ නිරාවරණය වන අවස්ථා වැඩිය.

සිද්ධස්ථානයකට සුදුසුම ඇඳුම් සුදුය. විනයානුකූලයැයි සම්මත ඇඳුම සුදුය. එය කිතුනු, බොදුනු කියා වෙනසක් නැත. ආගම, විනය, සංවරකම හා චර්යා පුරුදු පුහුණු කරවයි. නියම කිතුනුවෝ ආගමික කටයුතු වලදී සුදුවතින් හෝ ලාපැහැයෙන් වූ මනා ඇඳුමකින් සැරසෙති. ඔවුන් සිතින් කයින් වචනයෙන්ද සිය බාහිර ඇඳුමෙන්ද සංවරකම ආදර්ශයක් ලෙස පෙන්වති. තම සිරුර උලුප්පා මස්ගොබ මෙන්ම එක එක චර්යා හුවා දක්වන ඇඳුම් විලාසිතා වන්දනීය ස්ථානයකට නුසුදුසුය. අපේ හැදියාව අනුව අපට මේ ගැන හිතන්න පුළුවන. වගකීමෙන් අවබෝධයෙන් තමන්ගේ යුතුකම් ඉටුකරන්නට කවුරුත් සදාචාරාත්මකව බැඳී ඉන්න බව අමතක නොකළ යුතුය.

**පර්සි ප්‍රනාන්දු**
හලාවත

# මරිය වසරේ ජපමාලය දරුවන් අතට පත්කරමු

**කතුතුමනි,**

උදාවන මරිය වසරේ සභා මාතාවගේ වැඩි අවධානය දරුවන් වෙත යොමු විය යුතු බව සිතමි. යක්ෂයා, ලෝකයා, මාංශය නිසා විනාශ වන ජීවිත ආරක්ෂා කර ගැනීමේ ප්‍රබල ආයුධය ජපමාලයයි. ලූර්දුවේදි, පාතිමාවේදි දේව අම්මා ලොවට හඬගා මේ සුබ පණිවිඩය ලබා දුන්නා.

ලබා දුන්නේ දරුවන්ටයි. දේව අම්මා මේ ලොවට දර්ශනයවූ වැඩිම අවස්ථා වලදී හමු වුනේ දරුවන්ය.

මේ මරිය වසරේ පාසල් වල දහම් පාසල් වල පවුල් තුළ දරුවන්, අතට ජපමාලය හුරු කිරීමට ප්‍රබල වැඩසටහනක් ක්‍රියාත්මක විය යුතුය. වසර පුරා නොකඩවා ක්‍රියාත්මක විය යුතුය. එමගින් දරුවන් ජීවිතය පුරාම ජපමාලය අත් නොහරිනු ඇත. අද දරුවන් ජපමාලය උච්චාරණ කරනා තැනක් දැක ගැනීමට නොලැබෙන තරම්ය. ජපමාලය දේව අම්මා වයසක උදවියට භාර කර ඇත. දරුවන්ට පහදා දියයුතු ප්‍රබලම සත්‍ය ස්වර්ග යේ සහ මේ ලොව සිටිනා 'අභීතම දියණිය' දේව අම්මා බවය.

**රසිකා සෙනවිරත්න**
වැලිගම්පිටිය

# භාග්‍යවන්ත ජුසේවාස් පියාගේ සාන්තුවරය පතා නොකඩවා යදිමු!

**කතුතුමනි,**

ලාංකේය ශු. සභාවේ දෙවන නිර්මාතෘවරයාණන් හා අප ලක්දෙරණේ සදාදර අපෝස්තුළුවරයාණන් ලෙස ගෞරවාභිමානයෙන් පුදනු ලබන්නාවූ භාග්‍යවත් ජුසේවාස් මුනිඳුන් ශුද්ධවරභාවයට පත් කරලීමට විශ්ව සභා මාතාව සැරසෙන මේ කාලයේදී ලාංකේය කතෝලිකයන් ලෙස විශේෂයෙන් යැදුමින් මේ සඳහා දායක වී අපගේ කෘතගුණතාවය සැලකිය යුතුවෙමු.

ලක්දෙරණ තුළ අපගේ විශ්වාසයේ ගිනි සිළුව උදුරා දමා, මුලිනුපුටා දැමීමට සැරසුනු අවස්ථාවක දෙවිඳාණෝ අප ආදර අපෝස්තුළුවරයාණන් තුළින් ස්වකීය ගැලවීමේ ඉතිහාසය සිදුකළ සේක. උන්වහන්සේ ශුද්ධවරභාවයට පත්කිරිම තුළ අපට අවශ්‍ය වන්නේ තවත් ශුද්ධවරයෙක් සාන්තුවර නාමාවලියට පත්කරනවාට වඩා අප ආසියාතික මහද්වීපයෙන් බිහිවූ අග්‍රගන්‍ය ධර්මදූතවරයකු, අසහාය දේව සේවකයකු තුළ විශ්ව සභා මාතාව වෙත ධර්මදානීය මෙහෙවරේ කදිම ආදර්ශයක් ලෙස පත් කිරීමය.

මේ බව 1995 ජනවාරි 21 වන දින භාග්‍යවත් දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා කොළඹ දී ප්‍රකාශ කළේය. අපි බොහෝ ශුද්ධවන්තයින්ගේ චරිත කථා අසා දැනගෙන ඇත්තෙමු. එනමුදු ඒ හැමට වඩා ලංකා අපෝස්තුළුවරයාණන්ගේ කැපවුණු, වැයවුණු, පූජාවුණු දිවි මඟ තුළින් එතුමාගේ හෙළ සසුන් කෙත අස්වද්දා, විසිරී ගිය බැටළු රැළක් සේ විසූ අපගේ මුතුන්මිත්තන්ගේ විශ්වාසය යළිඳු සමිඳුන් තුළ එක්රැස් කළේය. වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම ක්‍රිස්තු ශ්‍රාවකයකු ලෙස නායකත්වයට වඩා සේවක බවටද, පාලනයට වඩා යටහත් පහත් වී ක්‍රියාකරමින්, ලාංකේය සංස්කෘතික ගතිකයන්ට මාංශගතවෙමින් ද, අනුරූපි වෙමින්ද ක්‍රියාකළේය. අභියෝග කරදර, බාධක කම්කටොළු මධ්‍යයේ නා නා විධ වෙස්ගෙන කිතුනුවන් සොයා යමින් කැලෑ මැදින් දෙපා වැරෙන් - හිස් දෙපතුළින් ගිය ගමනින් මෙදා හෙළ කතෝලික සසුන් පදනම වී ඇති ලාංකේය කිතුනුවන් ලෙසද වසර 300 ක් පුරාවටම අපි බලා සිටිමු.

ඒ අපගේ සදාදර අපෝස්තුළුවරයාණන් සුදුවරයට නම් කොට විශ්ව සභා මාතාවට හඬගා කීමටය. ශු. ලියව්ල්ලේ සඳහන් පරිදි "නියමිත මොහොත දැන් පැමිණ තිබේ........" එම නිසා දෙවිපියාණන් ඉදිරියේ ලාංකේය කතෝලික පිරිසක් ලෙස කෙලෙහිගුණ දැක්වීමට කාලය එළඹී ඇත. ඔක්තෝබර් 13 වන ඉරුදින පාතිමා හි අපි ස්වාමිදුගේ මංගල්‍යය දින, දේවමාතාවන් සමග ජපමාල දැහැනෙන් ද අඛණ්ඩ යැදුමින්ද අප ආදර අපෝස්තුළුවරයාණන් සාන්තුවර මහිමයට පත්කිරීමට දියත් කර ඇති ක්‍රියාවලිය සාර්ථක වන ලෙස අයැද සිටිමු. එමගින් "ලංකා අපොස්තුළුවර ශු. ජුසේවාස් මුනිඳුනි අප නිසා යාච්ඤා කළ මැනව" යි ප්‍රකාශ කිරීමේ දින මතු ඇතක නොවන බවද මතක තබා ගනිමු.

**අසේල දසනායක**
අගරදගුරු පදවි ජුසේවාස් කමිටුව

# සංදර්ශන තහනම් කිරීම ගැන ස්තූතියි !

**කතුතුමනි,**

ගෞරවනීය 'මුනිවර' නාම යොදා සංගීත සංදර්ශණ පැවැත්වීම හා වානිජ කටයුතු සඳහා දේවස්ථාන භූමිය පාවිච්චි කිරීමත්, තහනම් කිරීම ගැන ගෞරවනීය කාදිනල් හිමිපාණන් වහන්සේට අපගේ ගෞරවනීය ස්තූතිය පුදකර සිටිමු. යමෙක් මුනිවර තත්ත්වයට එසවීම යනු තමා තමාව අමතකකර දෙවියන් වහන්සේට පමණක් කැපවීම නිසා උන්වහන්සේගෙන්ම ලැබෙන දීමනාවකි.

එහිදී සමහරවිට මිනිසකුට දැරිය නොහැකි තරමේ පීඩාවන්ට ගොදුරු වී තම ජීවිතයද පූජා කිරීමට සිදුවේ. එහෙයින් එය දෙවියන් ගෙන් ම ලැබෙන දීමනාවක් මිස මනුෂ්‍යයන්ගෙන් ලැබෙන තෑග්ගක් නොවේ. එහෙයින් එම මුනිවර නාමය යොදාගෙන මුදල් හම්බකරන කටයුතුවල යෙදීම හා හුදු විනෝදය තකා, සංදර්ශන පැවැත්වීම, අප ශුද්ධ ධර්මයට හා සභාවට කරන්නා වූ බරපතල හානියක් හා ද්‍රෝහිකමකි. මේවා වැඩියෙන් සිදුවන්නේ තරුණ කොටස් තුළිනි. ඒ ඔවුන්ගේ නොදැනුවත් කම නිසාය. පල්ලිය උත්කර්ෂවත් කිරීම හා සංදර්ශන කිරීම මගින් දහමට හා දේවස්ථානයට මුනිතුමාට ලොකු යුතුකමක් ඉටුකරනවා යැයි ඇතැමෙක් සිතනවා ඇත. එහෙයින් එම කොටස් දැනුවත් කිරීමද ඊට පිළියමක් වේ යැයි සිතමු.

එමෙන්ම නිළ ඇඳුමක් අප දේවස්ථානවලට නොමැති කමින්, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට හා දේවස්ථානයට වන අපහාසයට ද, පියවරක් ගැනීමටත්, වාර්ෂික මංගල්‍ය වලදී අනවශ්‍ය කරුණු වලට සිදුවන මුදල් නාස්තිය හා ද්‍රව්‍ය නාස්තිය පිළිබඳව අවදිවීමටත් වැඩිපුර මුදල් ගැවසෙන ඇතැම් අයගේ විවාහ මංගල දිව්‍ය පූජාවලදී සිදුවන 'සංදර්ශන' මට්ටමේ පූජාවන් නවතා සියලු දෙනාට පොදු වූ චාම් විවාහ මංගල දිව්‍ය පූජාවක් ලබාදීමටද අප අතිඋතුම් කාදිනල් හිමිපාණන්ගේ සහ අති උතුම් රදගුරු මණ්ඩලයෙහි ගෞරවනීය අවධානය යොමුවේවායි අප සුදතුම් පියාණන් යදින්නෙමු.

**කේ. ඩී. හියුබට්**
මඩම්පැල්ල

# ජපමාලය නිරතුරු යදිමු !

**කතුතුමනි,**

මරිය වසර ප්‍රකාශයට තව ඇත්තේ මාස දෙකකි. මේ සඳහා සූදානම් වීමක් ලෙස සෑම කතෝලික පවුලක්ම සවස් කාලයේ තම නිවෙස් වල 'පවුල් ජපමාලය' යාච්ඤා කිරීම ආරම්භ කළ යුතුය. මව්පියන්, දරුවන්, ඇතුළු පවුලේ සෑම එකතුවී විශ්වාසයෙන් හා භක්තියෙන් ජපමාලය භාවනා කිරීම තුළින් දේව මාතාවන්ගේ මැදිහත් වීම තුළින් දෙවියන් වහන්සේගේ ආශිර්වාදය පවුල් වෙත අති ප්‍රබල ලෙස ගලා එනු ඇත.

අද රූපවාහිනී මාධ්‍ය නිසා පවුලේ යාච්ඤාවට සිදු වූ දෙය ගැන අපි අවංකව කණගාටු විය යුත්තෙමු. පවුලේ යාච්ඤාවට තිබූ



තැන අද නැත්තටම නැති කර දැම්මේ මේ යක්ෂයාගේ බහුරු කෝලම් පෙට්ටියයි. මේ නිසා මෙහි ප්‍රතිඵලය ලෙස දිනෙන් දින පවුල් කඩා වැටීම හා දරුවන් නොමග යාමේ සංඛ්‍යාව ඉහළ ගොස් ඇත. කඩා කප්පල් වූ කිතුනු පවුල් පළිබඳ සමීක්ෂණයක් කැර බැලුවොත් එම පවුල් වලින් 99% ක්ම සවසට කොන්තය තම නිවෙස් වල නොකියන අයය. මරිය වසර ප්‍රකාශ කිරීමට ආසන්න මේ මොහොතේ නැවත සෑම කතෝලික නිවහනක් තුළම කොන්තය කීම ආරම්භ කිරීම එතුමිය 'පාතිමා' හා 'ලූර්දු' දර්ශනයන්හි දී ඉල්ලා සිටි කාරුණික ඉල්ලීම ඉටුකිරීමක් වනු ඇත. එසේ නොකර කෙනකු මිය පරලොව ගිය පසු එම තැනැත්තා හෝ තැනැත්තියගේ 'අප්‍රාණික දෙඅත් මත' කොන්තය පටැලවීම හිස් ක්‍රියාවක් වනු නොඅනුමානය.

**ලූෂන් ෂර්ලි එඩ්වඩ්**
ගෝනවල



## රුදින නිමිත්තෙනි

# ත්තම පියාණන්ගේ පණිවුඩය

ඉන් ඵල ලබන්නෝය. මෙයින් අප තේරුම් ගත යුත්තේ ධර්ම දූතික දූතිකාවන් කිසිවිටෙකත් හුදෙකලා නොවෙන බවයි. ඔවුහු හැමදා ශුද්ධාත්ම ස්ප්‍රීතුවෙන් ශක්ති සම්පන්න වන බවකි.

**4.** අප හැම ජීවත් වන මෙම කාල වකවානුවේදී රට රාජ්‍ය පුරා විහිදී ඇති නව තාක්ෂණික මෙවලම් නිසා, දැනුම සහ අත්දැකීම් අතින් මිනිසා එකිනෙකාට සම්බන්ධව සිටින බවක් පෙනී යයි. නූතන සමාජ රටාව තුළ ජනී ජනයා පවුල් පිටින්ම තමන් කැමති රටවල මහද්වීප වලට සංක්‍රමණය වනු දැකිය හැකියි. මෙහිදී නිරනුමානවම විවිධ සංස්කෘතීන් සමග හුවමාරු වීමට ඔවුනට සිදු වේ. මේ අනුව තම පදවියේ මීසමේ ස්ථිරවම පදිංචි වී සිටින අයවලුන් කවුරුදැයි සොයා ග ැනීම පිළිබඳව ගැටළු මතුවේ. සැහෙන කාලයක් තුළ ක්‍රිස්තියානි ජනතාවගෙන් බහුතරයක් වාසය කරන පාරම්පරික ක්‍රිස්තියානි ප්‍රදේශ වලට අද නන්නාඳුනන අමුත්තන් රාශියක් ආක්‍රමණය කර ඇති සැටියක් පෙනී යයි. මේ අය තුළ බොහෝ විට කිතුනු විශ්වාසයක්, ඇදහීමක් දක්නට නොලැබේ. බහුතරයක් දෙනා දේව විශ්වාසයෙන් බැහැර වූවන්ය. අදේව වාදීය. ඒ අතර තමන් ක්‍රිස්තියානින් යැයි කියා ගන්නා අයගේ හැදියාව හා පැවැත්ම තුළින්ද ක්‍රිස්තුස් වහන්සේට සාක්ෂි දැරීමක් සිදු නොවන නිසා මෙම ආග න්තුකයින් සත්‍යයෙන් ඈත්ව සිටිනා බවද අමතක නොකළ යුත්තකි. මේ අය වෙත ධර්මදානයේ මග පෙන්වීම අවශ්‍ය වේ.




මෙහිදී අප විසින් විනිශ්චය කළ යුත්තේ ලෝක ප්‍රජාවගෙන් සැහෙන කොටසක් වෙත ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ පණිවුඩය අද මේ වන තුරුත් ළඟා වී නොමැති බවක් නොවේද?

නූතන සමාජය තුළ පවත්නා විවිධ අර්බුද වනුයේ ආර්ථික ප්‍රශ්න මුල්‍යාමය ගැටලු, ආහාර හිඟය, විරැකියාව සුරක්ෂිතතාවය සහ පාරිසරික බලපෑම් වැනි දේවල් පමණක් නොවේ. අද පවතින මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳව පැන නගින විෂමතා වඩාත් භයානකය. ගැඹුරුය. අද සමාජය මුහුණ දෙන විවිධ ආරවුල්, මතභේද නිසා මතුවන ආතතිය සමාජ සංහිඳියාවට බෙහෙවින් බලපා ඇති සැටියක් පෙනෙයි. මෙම ව්‍යාකූල සංකීර්ණ තත්වය නිසා තිරසාර සාම මාවතක් සොයා ගැනීමට නොහැකිව නූතන ජනතාව මං මුලාවූ බවක් දක්නට ඇත.

වර්තමානය මෙන්ම, අනාගතයද වසාගෙන ඇති යටදැක්වූ අන්දමේ අඳුරු ක්ෂිතිජයක සේයාවන් නිසා ඉතාමත් අපහැදිලි මෙන්ම ව්‍යාකූල අවස්ථාවෝචිත තර්ජනයක් අප හැම ඉදිරියේ ඇති සෙයක් පෙනීයයි. එබැවින් මිනිස් සංහතිය තුළ බලාපොරොත්තුව, සංහිඳියාව සමාදානය ගලා එන ඒකායන මාර්ගය වූ ක්‍රිස්තුස් වහන්සේගේ පණිවුඩය නිර්භයව හා ධෛර්යය සම්පන්නව ප්‍රකාශ කිරීමට මැලි නොවෙමු. එමඟින් දෙවි පියාණන්ගේ දයාව, සමාව හා ගැලවීම සකල ජනයා වෙත රැගෙන ඒමට හැකි වෙයි. දෙවියන් වහන්සේගේ අසීමිත ප්‍රේමය මඟින් පාපයේ ඝනඳුර ඉවත් කර ජන සමූහයා යහමඟට යොමු කිරීම වඩාත් ඵලදායි වේ.

අද ජනතාව වැටී සිටින භයංකර අන්ධකාරයෙන් මුදා ගෙන ඔවුන් ආලෝකය කරා ගෙන ඒම සඳහා විවෘතව ඇති එකම මඟ ක්‍රිස්තුස් වහන්සේය. අපට කළ හැක්කේ අපේ ප්‍රබල සාක්ෂි දැරීම තුළින් සහ සත්‍ය විශ්වාසය හා බැඳුනු අප ජීවිත මඟින් සෙසු ලෝකයා වෙත බලාපොරොත්තුව රැගෙන ඒමය.

සභා ධර්මදානයේ අරමුණ විය යුතු වන්නේ අන්‍යාගමික ජනතාව ක්‍රිස්තියානින් බවට පත් කිරීම නොව, ඒ අය තුළ ප්‍රේමය සහ බලාපොරොත්තුව ඇති කරනා අයුරින් අපගේ ජීවිත ජීවත් කිරීම හා අවංකවූ එකක් බවට ගොඩනැගීමය. එමඟින් ඉදිරිපත් කෙරෙන සාක්ෂිදැරීම හා ජීවිතාදර්ශය වඩාත් ප්‍රබලය. ඵලදායකය.

මම නැවත වාරයක් එක් දෙයක් පිළිබඳව අවධාරණයෙන් සිහිපත් කිරීමට කැමති වෙමි. කතෝලික සභාව තව දුරටත් සහනාධාර සපයන සංවිධානයක් පුන්‍යායතනයක් හෝ ලාබ බලාපොරොත්තු නොවන සංවිධානයක් (NGO එකක්) විය යුතු නොවේ. එය ශුද්ධාත්ම බලයෙන් හා අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වන සැදැහැති ජනතාවගෙන් සමන්විත වූ සංස්ථාවක් පමණක් විය යුතුය. ඔවුහු එදත් අදත් ජේසු ක්‍රිස්තු සමිඳාණන් සමඟ ඉතා සුහද ලීලාවෙන් බැඳී කටයුතු කරති. එම නිසාම ඔවුහු දේවාදරය දයාව හා ප්‍රීතිය භුක්ති විඳින්නෝය. තවද ඔව්හු අප ස්වාමීන් වහන්සේ විසින් දෙවා වදාළ ගැලවීමේ ශුභාරංචිය සාමුහිකව බෙදා හදා ගනිති. ඊට සජීවිව සහාගිවෙති. මෙම ක්‍රියාදාමය තුළ සමස්ත සභා මාතාව හසුරුවනු ලබනුයේ ශුද්ධාත්මයාණන් විසිනි.

ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීම දායක ශුභාරංචිය පතුරුවාලීම සඳහා හැම දෙනාටම ඇරයුම් කරමින් ඔවුන් දිරිගන්වන අතර, අප ස්වාමින් වහන්සේගේ ඉල්ලීමට සවන් දෙමින් දැනටමත් එම දූත කාර්යයෙහි නියැලි සිටින අය වෙතද මාගේ කෘතඥතාවය පලකර සිටිමි. තම මව් බිම හැරදමා සුභ අස්න දේශනා කිරීම සඳහා විවිධ රට වලට සංක්‍රමණය වී ඇති FEDEI DONUM ගරු පියවරු සහ සෙසු ගිහි පැවදි සියළුම අයද මීට ඇතුළත් වේ. ධර්මදූත කාර්යයන් වලදී නොයෙකුත් දුෂ්කරතාවන් වලට මුහුණ පා සිටින ඇතැම් රටවලට ත්‍යාගශිලීව ධර්මදූත කණ්ඩායම් යවන නවක සභාවන් වෙතද මාගේ සුහද කෘතඥතාවයේ හස්තය දිගු කිරීමට කැමතියි. මෙමඟින් අන් අය තුළ විශ්වාසය වර්ධනය කර ප්‍රතිශක්ති කොට ඔවුන් ජීවිත වලට නව බලාපොරොත්තු ඇති කිරීමට සමත් වී ඇත. අප ස්වාමින් වහන්සේ විසින්ම අප වෙත පවරන ලද ආඥාව අනුව "ඔබ ගොස් සකල ජාතීන් ගෝලයින් කරන්න." (මතෙව් 28:19) මුළු මහත් විශ්වය තුළට නවෝදයක් උදා කිරීමට හැකිවන්නේය.

ධර්මදූත කටයුතු සඳහා ධර්මදූතවරුන් විදේශ රටවලට යැවීමෙන් එම සභා වලට විඳ දැරීමට සිදුවන පාඩුවක් අලාභයක් නැත. ලැබෙනුයේ ඒකාන්තයෙන්ම වාසියකි. ප්‍රයෝජනයකි. ශුද්ධාත්මයාණන්ගේ මඟ පෙන්වීමට ත්‍යාගශීලිව අනුගත වෙමින් ඔබ එකිනෙකාට හැකි පමණින් හා ශක්ති ප්‍රමාණයෙන් ස්වාමින් වහන්සේ වෙනුවෙන් පරිත්‍යාගශීලී වීමට කිසිසේත් බිය නොවන්නැයි මම ඔබ හැමගෙන් ඉල්ලා සිටිමි. දැනටමත් ධර්මදානයේ දුෂ්කරතා පවතින සභා වලට හා පූජා ප්‍රසාදීන් වහන්සේලා වෙත ඔවුන්ගේ මතු අනාගත ශුභ සිද්ධිය සලකා එම ක්‍රිස්තියානි සංඝ වෙත ගරු පියවරු, පැවදි පූජක පිරිස් සහ ගිහි ධර්මදූතයන් යවන මෙන්, රදගුරුතුමන්ලා ඇතුළු ආග මික නායකයින් සංවිධාන හා පවුල් වල හැම අයගෙන්ද කාරුණිකව ඉල්ලා සිටිමි. තවද කිසියම් පදවියක මීසමක මෙම ධර්මදානීය හුවමාරුවට සමාන්තරව දේව කැඳවීම් සඳහා ඉදිරිපත් වන්නවුන්ගේ අඩුවක් තිබේ නම්, එම පුරප්පාඩුව පිරවීම සඳහා දේව කැඳවීම් බහුලව පවත්නා පදවි සහ මීසම් තුළින් එම අඩුපාඩුව පිරිමසා ගැනීම කෙරෙහිද ඔබ හැමගේ අවධානය යොමු කිරීමට රිසිවෙමි.

ධර්මදානය සඳහා වෙසෙසින් කැපවූ "Fidei Donum" ගරු පියවරුන් සහ ගිහි ධර්මදූතික දූතිකාවන්ගෙන් මා ඉල්ලා සිටින්නේ ඔබට පැවරි ඇති රාජකාරිය අනුව ඔබ සේවය කරන ජනයා වෙත ප්‍රීතිය සතුට ළඟා කර දෙමින් නව අත්දැකීම් කරා ඔවුන් යොමු කරන ලෙසයි. එහිදි ශුද්ධවු පාවුලු තුමා හා බර්ණබස් යන අය ඔවුන්ගේ ප්‍රථම ධර්මදූත චාරිකාව අවසානයේදී ඉදිරිපත් කරන ලද වාර්තාව කෙරෙහි ඔබේ අවධානය යොමු කිරිමට කැමතියි.

"දෙවියන් වහන්සේ තමන් ලවා ඉටු කල සියල්ලද, විජාතීන්ට උන්වහන්සේ කරා එළඹීමේ දොරක් ඇරදුන් බවත් දැන්වූහ." (ක්‍රියා 14:27)

අලුතින් පිහිටුවනු ලබන සභා වෙත නවෝදයක් හා උද්දාමයක් ගෙන ඒමට ඔවුන්ට හැකියාව ලැබෙනු ඇත. මේ අනුව පැරණි සභා වලටද ස්වාමින් වහන්සේගේ මාර්ගය අනුගමනය කරමින් තම විශ්වාසය තව තවත් පණ ගන්වමින් විශ්වාසයේ ප්‍රීති ප්‍රමෝදය අත්විඳීමට හැකි වන්නේය. බෞතිස්ම ස්නාපනය ලද සියලුම ක්‍රිස්තියානි වරුන්ගේ සහ සංඝයන්ගේ ධර්මදානීය අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා වූ ඉතාමත් වැදගත් මෙකී වගකීම රෝමයේ රදගුරුතුමන් විසින්ද අනිකුත් සහෝදර රදගුරු තුමන්ලා සමග දරන බවද කිව යුතු වේ.

මෙහිදි ලෝකය තුළ දේව වචනය පතුරුවාලීම සඳහා දේව ජනතාව සූදානම් කිරිමේදී ක්‍රිස්තියානි සංඝයන් දැනුවත් කිරීම හා පෝෂණය කිරීමේ අවැසියාවද අපි අවධාරණය කර සිටිමු.

අවසාන කොට මේ වන විටත් ලොව අනෙකුත් රට රාජ්‍ය වල දහසකුත් එකක් අවහිර බාධක මධ්‍යයෙහි සිටිමින් හා තම විශ්වාසය විවෘතව හා නිර්භීතව ප්‍රකාශ කරමින් ගෞරවාන්විතව ජීවිත ජීවත් කිරීම සඳහා අනිකුත් අයගේද අයිතිවාසිකම් සුරකින වීරෝදාර සොහොයුරු සොහොයුරියන් අප පෙම්බර ස්වාමින් වහන්සේ වෙනුවෙන් කරනු ලබන මහඟු සාක්ෂි දැරිම අපි ඉත සිතින් අගේ කරමු. කෘතඥ වන්නෙමු. ඔවුන්ගේ සංඛ්‍යාව මුල් ශත වර්ෂ වලදී ඉවසිලිවන්තව සහ පරිත්‍යාගශීලීව අපෝස්තලික ලීලාවෙන් යුතුව අනේකාකාර පීඩනයනට භාජනය වූ අපේ ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ සංඛ්‍යාවට වඩා වැඩි මිස අඩු නොවේ. ක්‍රිස්තුන් වහන්සේගේ වචනය වෙනුවෙන් තම විශ්වාසය රැක ගත් ඇතැම්හූ තම ජීවිත වලින් පවා ඊට වන්දි ගෙවූහ. එම අභීත ක්‍රියාදාමයන් හී නියැලෙමින් අනේකවිධ දුක් කම්කටොළු සුහද සිතින් දරා ගත් එම වීරෝදාර පුද්ගලයින්, පවුල් සහ ජන සමූහයා වෙත අප ස්වාමින් වන ජේසුස් වහන්සේ වදාළ සැනසිලි දායක වචන අවධාරණයෙන් නැවතත් මෙලෙසින් සිහිපත් කරමි.

"ධෛර්යමත් වන්න, මම ලෝකය අභිබවා ජය ගතිමි." (ජොහාන් 16:33)

xvi බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමා අනුශාසනා කරමින් අප වෙත සිහිපත් කළේ, ඔබ හැම දැනටමත් ක්‍රියා කරන අයුරින් ධර්ම දානයේ නියැලෙන ලෙසයි. "ස්වාමින් වහන්සේගේ පණිවුඩය ඉතාමත් සීඝ්‍රව පැතිරේවා, එම පණිවුඩය ඉතාමත් ඉහළින් පිළිගනීත්වා, ගෞරවයට පැමිණෙත්වා" (2 තෙසලෝනික 3:1)

තවද විශ්වාසයේ මෙම වර්ෂය තුළ ක්‍රිස්තුන් වහන්සේ හා අප සමඟ පවත්නා සබැඳියාව සුහදත්වය තව තවත් වර්ධනය වෙමින් සවිමත් වේවා, සැබෑ ප්‍රේමයේ උත්තරීතර අව්‍යාජ සහතිකය අප වෙත දානය කළ හැකි එකම තැනැත්තාණෝ ක්‍රිස්තුස් වහන්සේය. (Prota Fidei, 15) මෙම වසරේ ධර්මදූත දින මාගේද එකම ප්‍රාර්ථනාව එයයි.

ලොව සතර දිග් භාගය වෙත සුභ අස්න දේශනා කෙරෙමින්, පතුරුවා හරිමින් කරන ලබන මූලික ධර්මදානීය සිද්ධාන්තය පෝෂණය කිරිම සඳහා ක්‍රියාකාරී අන්දමින් සහයෝගය දක්වන සියලුම ධර්ම දූතික දූතිකාවන් වෙත මාගේ පිතෘක ආශිර්වාදය දානය කිරිමට මම කිසිසේත් නොපැකිලෙමි.

vi පාවුලු ශුද්ධෝත්තම පියතුමාගේ (Eveangelli muntiandi 80) ලියැවිල්ලහි සඳහන් පරිදි ධර්ම දානය තුළ පවත්නා සතුට සහ සහනදායි සැනසීම ඔබ හැම අත්දකීත්වා, පවසමින් මෙම පණිවුඩය අවසාන කරමි.

**2013 මැයි 19 ශුද්ධාත්ම සැමරුම් දින වතිකානයේදී**

# ඇදහිල්ලෙන් සවිමත් වී, ඇප වෙමු, කැප වෙමු, දහම බෙදන්නට...



**සමිඳු ආරාධනය:**

"ඔබ ගොස් සකල ජාතීන් ගෝලයන් කරන්න." (මතෙව් 28:19)

" ලොව පුරා ගොස් සකල සත්වයා හට සුභ අස්න දේශනා කරන්න. " (මාර්ක් 16:15)

"ජෙරුසලමෙන් පටන්ගෙන සකල ලෝක වාසීන්ට මනස්ථාපනයද, පව් කමාවද, උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්ටත් යුතුමය. ඔබ මේ දේවලට සාක්ෂිකාරයෝ වන්නාහුය." (ලූක් 24:46-48)

"පියාණන් වහන්සේ මා එවා වදාළාක් මෙන්, මමද ඔබව යවමි. (ජුවාම් 20:21)

සුබ අස්න / කිතු දහම, ලොවපුරා පතල කිරීමට සමිඳු ආරාධනය සුවිශේෂකවරුන් හතර දෙනාම ශු. බයිබලයේ අලුත් ගිවිසුමේ මෙසේ සඳහන් කර ඇත.

මේ ආරාධනය, මේ ආඥාව ක්‍රියාවට නැගීමට, ස්වාමින් වහන්සේ: "මා අනුව එන්න" ය කියා ගෝලයන් කැඳවූවත්, ඔවුනගේ දුර්වලකම් නිතර නිතර ඉස්මතු වු අවස්ථාද සුවිශේෂයන් පුරාම අපට දිස්වේය. පේදුරු තුමා, සමිඳු ගමනට හරස් වීම හා තම ස්වාමියාණන් හඳුනන්නේ නැති බව ප්‍රකාශ කිරීම, ජුවාම් හා ජාකොබ් තුමන්ලා සමිඳු රාජ්‍යයේ පළමු දෙවනි ස්ථාන බලාපොරොත්තු වීම, තෝමස් ගෝලයා - "මම උන් වහන්සේගේ අත් වල ඇණ කැළැල් දැක, ඇණ ගසා තිබූ තැන් වල මාගේ ඇඟිල්ල තබා, උන් වහන්සේ ගේ ඇලයෙහි මාගේ අත දමා බැලුවොත් මිස, නැත්නම් විශ්වාස නොකරමි" යි කීම, හා ජුදාස් ස්කාරියොත් එතුමන්ව පාවා දීම ආදිය ඉන් සමහරකි. කිතු සමිඳෝද තමන් කැඳවු එම ගෝලයන්ගේ මෙවැනි අඩුපාඩුකම් කල්තියාම දුටු නිසාදෝ එතුමාම කියන සේක් : " එහෙත් ඉහළින් වන බල පරාක්‍රමයෙන් ඔබ හැම සන්නද්ධ කරනු ලබන තුරු නගරයේ නැවති සිටින්න." (ලූක් 24:49) කියාද, තවත් තැනක, "සීමොන් සීමොන්, මෙය අසන්න, තිරිඟු පොලන්නාක් මෙන් ඔබ සියලු දෙනා පොළාලන්ට සාතන් අවසර ලබා ඇත. එහෙත් ඔබේ ශ්‍රද්ධාව නොබිඳෙන පිණිස මම ඔබ උදෙසා යාච්ඤා කළෙමි. ඔබ යළිත් හැරුණු පසු ඔබේ සහෝදරයන් ධෛර්යවත් කරන්න. (ලූක් 22:31) කියාද, "එහෙත් ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පැමිණි කල ඔබ බලය ලබන්නාහුය (ක්‍රියා 1:8) යනුවෙන්ද, එසේම එතුමාණෝ ස්ථිරව ප්‍රකාශ කරන්නේ, "මමද කල්පාන්තය දක්වා සදහටම ඔබ හා සමග සිටිමි"යි යනුවෙනි. (මතෙව් 28:20B එසේ සමිඳෝම, තම දහම ලොවට බෙදන්නට කැඳවූ ගෝලයන්ව ඔවුන්ගේ ඇදහිල්ලේ සවිමත් කළ සේක. එසේ කළේ, ඇදහිල්ලේ සවිමත් වී මිස දහම බෙදන්නට කිසිවෙකුට සම්පූර්ණයෙන්ම කැප වීමට බැරි බව සමිඳාණෝ දැන සිටි නිසාය.

සමිඳු බලයෙන් තම ඇදහිල්ලේ සවිමත් වූ සමිඳු අනුගාමිකයෝ අකුරටම සමිඳු ආරාධනය ක්‍රියාවට නැගුවෝය. ශු. පේදුරු පාවුලු තුමන්ලා ජෙරුසලමෙන් පිටත්ව ගොස් රෝම අධිරාජ්‍යය පුරාවටම සමිඳු ආදරයට සාක්ෂි දරමින්, ඒ දහම වෙනුවෙන්ම තම ජීවිතයද පරිත්‍යාග කළෝය. "අවිශ්වාසයේ ගෝලයා" යනුවෙන් හඳුන්වනු ලැබූ තෝමස් ගෝලයා, උත්ථාන වූ සමිඳුන් අත් දැක, එම ඇදහිල්ලෙන් සවිමත් වී, මහා දුෂ්කර ගමනක නිරත වී, ඉන්දියාව දක්වාම සුබ අස්න ගෙන ආ බව ඉතිහාසයෙන් අපි දනිමු. අනිකුත් ගෝලයෝද, තමන් දන්නා ලෝකයට මේ සමිඳු දහම ගෙන ගිය බව රහසක් නොවේය. එතුමන් අනුව යමින් ඉන් පසුව මහා මිසනාරි ධර්මදූතික උද්යෝගයක් සභාව තුළ ගොඩනැගුණි. ඒ සැවොම කිතු සමිඳුන් තුළ ඇදහිල්ලේ සවිමත් වූවෝමය.

ඒ සමිඳු ආරාධනය:"ලොව පුරා ගොස් සකල සත්වයා හට සුභ අස්න දේශනා කරන්න" යන්න එදාට මෙන්න අදටද ඒ ලෙසින්ම වලංගුය. ප්‍රසාද ස්නාපනය ලබන සෑම කිතුණුවෙක්ම සමිඳු ධර්මදූතයෙකි, ධර්මදූතිකාවකි. ලෝක ධර්මදූත ඉරුදින සමරන අද වාගේ දිනක, සභා මාතාව සමිඳුන් වෙනුවෙන් අපගේ මෙම මහඟු කැඳවීම අප හැමෝටම මතක් කර දෙන්නීය. අපිදු, එදා ගෝලයන් මෙන් අපගේ දුර්වලකම්ද පිළිගෙන, සමිඳු බලයෙන් සන්නද්ධ වී ඇදහිල්ලෙන් සවිමත් වී ධර්මදූත කාර්යයේ ක්‍රියාකාරි වෙමු. "මමද කල්පාන්තය දක්වා සදහටම ඔබ සමග සිටිමි" යන සමිඳු වදනද අපි සැම විටම සිහියේ තබා ගනිමු. අප එකිනෙකා ලබා ඇති කැඳවීම් අනුව වචනයෙන් හා ජීවිත ආදර්ශයෙන් එයට දායක වෙමු. ඒ සඳහා යාච්ඤාවද, මර්ධන ක්‍රියාද, මූල්‍යමය ආධාරද බලගතු අවීන් බව සිතෙහි තබාගෙන ක්‍රියාකාරී වෙමු.

කිතු සමිඳෝම, එදාමෙන් අද අපවද, ස්ප්‍රීතු සාන්තු බලයෙන් සන්නද්ධ කරන සේක්වා

**ඇදහිල්ලෙන් සවිමත් වී, ඇප වෙමු, කැප වෙමු, දහම බෙදන්නට.**

**ඔබ සැමට ජේසු පිහිටයි. ජේසු අම්මාගේ රැකවරණය හා මඟ පෙන්වීමයි.**

**රෙජිනෝල්ඩ් සපරමාදු පියතුමා**

ධර්මදූතාධාර සංගම් භාර ජාතික අධ්‍යක්ෂ

කලා සංග්‍රහය

ප්‍රදීපය කෙටි කතාව

# සිස්ටර් පිස්සු වැටිලා !

වෙන්නප්පුවේ පයස් ප්‍රනාන්දු

පල්ලෑහැ ළිඳෙන් නාගෙන පිටුපස දොරෙන් ගෙට ගොඩවුනු මරිය නෝනාට දැනුනේ පාළු ගතියක්. ඒ සෙනසුරාදා වුනත් වේලාසනින් ගත් දවල් කෑමෙන් පසු ඕෂධී දුව උපකාරක පන්තියට ගොස් සිටියාය. දූගේ පියා පීටර් මහත්මයා උදේ පිටත්ව ගිය ගමන් තවම පැමිණ සිටියේ නැත. ඔහු පිටත්ව යෑමට පෙර මතක් කර සිටියේ ආපසු පැමිණීමට හවස් විය හැකි බවය.

වසා තිබුණු ඉදිරි දොර විවෘත කරගෙන ඉස්තෝප්පුවට පැමිණෙන විට මරිය නෝනා දුටුවේ වත්ත මායිමේ ගුරු පාර දිගේ ඇවිදගෙන එන දෙදෙනෙකි. ගුරු පාරෙන් ගේ දෙසට හැරුණු ඔවුන් දෙදෙනා හඳුනා ගැනීමට ඇයට අපහසුතාවක් වුනේ නැත. ඇය මිදුලට බැස්සේ අල්ලපු වැටේ කතිරිනා අක්කා සහ ගමේ සිල්ලර කඩේ මුදලාලිගේ දු ඇනිටා නෝනා පිළිගැනීමටය.

"හප්පේ ඇනිටා නෝනව දැක්ක කල්! එන්ට එන්ට කතිරිනා අක්කත් එක්ක ගෙට ගොඩවෙන්ට. මං මේ කෝපි කෝප්පයක් හදාගෙන බොන්ටයි ලෑස්ති වුනේ. දෙන්නම සාලෙන් වාඩි වුනා නම් මං මිනිත්තුවට එන්නම් කෝපි ටිකක් හදාගෙනම."

මරිය නෝනා ගෙනා කෝපි කෝප්ප දෙක පිළිගත් ඇනිටා නෝනාත් කතිරිනා අක්කාත් එය බොන අතර මරිය නෝනා ද කෝපිකෝප්පයක් රැගෙන සාලයට ආවාය.

"මොකද ගේ පාළුවට ගිහින්, අද සෙනසුරාදා වෙලත්, පීටර් මහත්තයවත් ඕෂධී දුවවත් පේන්ට නැත්තේ?" ඇනිටා නෝනා කතාවට මුල පිරුවාය.

"ඕෂධී දූ නම් ටියුෂන් යන්ටැති අපේ දූ නිලානිත් එක්ක, නේද මරිය නෝනෙ?" උත්තර දුන්නී කතිරිනා අක්කාය.

"ඔව් අනේ! දවල්ට කෑව නොකෑව වගේ ටියුෂන් පන්තියට දුවගෙන ගියා. මොනව කරන්ට ද? සෙනසුරාදා ඉරිදා කියලවත් මේ දරුවන්ට නිවී සැනසිල්ලෙ ගෙදර ඉන්ට විදිහක් නෑ, ටියුෂන්! ටියුෂන්! පීටර් මහත්තය නම් ගමනක් ගිහිල්ල හවස් වෙයි කිව්වා එනකොට." මරිය නෝනා පාළුවේ හේතුව ඉදිරිපත් කරන ගමන් ම"ඇනිටා නෝනයි, කතිරිනා අක්කයි බැරක් ගිහිල්ල වගෙයි" ප්‍රශ්නයක් නැඟුවාය.

"අද තිබුන නේ ඉස්කෝලෙ රැස්වීමක්, සියත් ගම් නැගුම් සමිතියක් පටන් ගන්ට. අපි මේ ඒකට ගිහිල්ල එන ගමන් ඒ ආරංචිය දෙන්ටත් එක්කලයි තකහනියක් ම මේ පැත්තෙන් ආවේ." ඇනිටා නෝනා කතාව දිග්ගැස්සුවාය.

"මොකක් කියලද කීවෙ? මේ මොකක්ද කියල මට තේරුම් ගන්ට බෑ." මරිය නෝනාට කියැවුණි.

"මරිය නෝනෙ, මේ අපේ ගමේ තියෙන දේවලින් අපි අපිම පුළු පුළුවන් හැටියට ප්‍රයෝජන ඇරගෙන ගම දියුණුකරන එකයි. ටවුමෙ විද්‍යාලෙ ලොකු සර් තමයි නම හදා දුන්නෙ. මරිය නෝනත් එනව නේද හවුල් වෙන්ට. ලබන සෙනසුරාදා තමයි මුල්ම රැස්වීම" කතිරිනා අක්කා නිල නොවන ආරාධනයක් කළාය.

"අද ඇවිදින් හිටිය දහ පාලොස් දෙනෙක් ගෑනු පිරිමි මූලික සාකච්ඡාවට නේද කතිරිනා ඇන්ටි?" ඇනිටා නෝනා පැවසුවාය.

"සීබට් හාමු. සේවියර් මහත්තයා. පැන්ෂන් නන්දනී මිස්. එළවළු මාර්කෙට් එකේ ජොස්පින් නැන්දා, මීතෙල් හාමිනේ එහෙමත් ඇවිල්ල හිටියා" කතිරිනා අක්කා වැදගත් යයි හැඟෙන අයගේ නම් ලැයිස්තුව ඉදිරිපත් කළාය.

"ගමේ අය මීතෙල් හාමිනේ කිව්වට නියම නම මිචෙල්නෝන" ඇනිටා නෝනා වරද නිවැරදි කළාය.

"එහෙම නම් රැස්වීමට කලියෙන් මීතෙල් හාමිනේගෙන් හොඳ අලුත්ම අලුත් ආරංචි ටිකක් නම් දැනගන්ට ඇහැක් වෙන්ටැති නේද කතිරිනා අක්කා?" මරිය නෝනා අතුරු ප්‍රශ්නයක් නැඟුවාය.

"ඒක කියන්ටත් එක්කල තමයි මරිය නෝනෙ අපිගෙට ගොඩවුනේ. මට නම් මේ කතාව ඇත්තක් කියල හිතා ගන්ටවත් බෑ. හැබැයි මීතෙල් හාමිනේ ඒක විස්තර ඇතුව කිව්වෙ බයිස්කෝප් එකක් පෙන්වන ගාණටයි!" කතරිනා අක්කා උගුර පාදා ගත්තාය.

"මොකක්ද හැබෑට ඒ ආරංචිය?" ඒ මරිය නෝනා.

"මේ අපේ පබෝදා සිස්ටර් ගැන!" කතිරිනා අක්කාගේ කටහඬ.

"දැන් මොනවද වෙලා තියෙන්නෙ? අවුරුද්දකට දෙකකට කලින් ඩොක්ටර් පට්ටමක් දො මොකක්දෝ ලැබුනලු නේද? දැන් ඒක අයින් කරලද?" මරිය නෝනාගෙන්ය ප්‍රශ්නය.

"ඒව ගැන නම් මං දන්නෙ නෑ මරිය නෝනෙ. ඕනෑ නම් මීතෙල් හාමිනේ කියපු විස්තරේ ඒ හැටියටම කියන්නම්. එහෙම හොඳයි නේ ඇනිටා නෝනෙ." කතිරිනා අක්කා ප්‍රස්තාවනාව ඉදිරිපත් කළාය.

"කතිරිනා ඇන්ටි කතාව පටන් ගන්ටකො අඩු පාඩුවක් තිබුනොත් මං පුරවන්නම්කො" ඇනිටා නෝනා ඇරඹුමට ඇරියුම් කළාය.

පබෝදා සිස්ටර්ට දැන් පිස්සු හැදිලලු" කතිරිනා අක්කා කතාව දිග හැරියාය.

"ජේසු මරිය ජුසේ, මේ මොන වින්නැහියක් ද?" කෑගැසුනේ මරිය නෝනාටය.

"කෑ මොර නොදී අහන් ඉන්ටකො මරිය නෝනෙ. අපි තාම හරියට දන්නව යැ? මේ මීතෙල් හාමිනේගෙ කට කැඩිච්ච කතාවක් වෙන්ටත් බැරි නෑ!" කතිරිනා අක්කා ඇනිටා නෝනගෙ මුහුණ බැලුවාය.



"කතිරිනා ඇන්ටි එහෙනම් මිචෙල් නෝනගෙ වචනවලින්ම කතාව කියන්ට කො මරිය නෝන ඇන්ටිට" ඇනිටා නෝනා ඉල්ලා සිටියාය.

"අද උදේ කඩ මණ්ඩියට ගිය වෙලාවෙයි මං මේක දැන ගත්තෙ. ඉංගිරිසි පත්තරේක." ඔන්න ඔහොමයි මීතෙල් හාමිනේ ආරංචිය කියන්ට පටන් ගත්තෙ." කතිරිනා අක්කා විස්තරය පණ ගැන්නුවාය. "පත්තරේ කඩේ ඉස්සරහ එල්ලලා තිබුනා. ඒකෙ මුල් පිටුවෙ ලොකුවට තිබුනා සිස්ටර් පබෝදගේ පාට පින්තූරයක්. මුදුන හතරැස් රතු පාටට හුරු තොප්පියක් ඔළුවට දාගෙන. රත්තරන් පාට පීත්ත පටි දිග අතට අල්ලපු රතු ලෝගුවක් ඇඳගෙන. පින්තූරෙ දකුණු අත පැත්තෙ ලොකු අකුරෙන් අච්චු ගහල තිබුනා ඉංගිරිසියෙන් මෙන්න මෙහෙම රෙව්ඩ් ඩ්ර් පබෝදා මැඩ් කියලා (Revd Dr Paboda MA D) උඩ පේළියේ රිටර්න්ස් හෝම් කියලා (Returns Home) යට පේළියේ මං දන්න ඉංගිරිස් හැටියට ඒකෙ තේරුම පබෝදාට පිස්සු, ආපහු ගෙදර එයි කියන එකයි. හැබැයි මුලින් තිබුණු රෙව්ඩ් (Revd) ඩ්ර් (Dr) කියන එකේ තේරුම නම් දන්නෙ නෑ. පත්තරේ අච්චු ගහල තිබුණු විස්තරේ නම් කියව කියව හිටියෙ නෑ. මං ආපහු ආව තෝන්තුවෙන් වගේ.

"ඇයි කතිරිනා ඇන්ටිට මතක නැද්ද මිචෙල් නෝන කියපු අනික් දේවල්?" ඇනිටා නෝනා මතක් කළාය.

" ඒ මොනවද ඇනිටා නෝනෙ අර සමයං අන්දරේදො මොකක්දො කියක එකද?" කතිරිනා අක්කා කීවාය.

"ඔව් ඔව් ඒක තමයි! හොඳයි මිචෙල් නෝනගෙ කතාවෙ ඉතුරු කොටස එහෙනම් මම් ම කියන්නම්කො. හැබැයි ඒක සමයං අන්දරේ නෙමෙයි සමයාන්තරෙයි" ඇනිටා නෝනා කතාවේ ඉතුරු කොටස ඇරඹුවාය.

"ඔය සිස්ටර් පබෝදා අර නරකාදියෙ උන්නු දවස්වල සුමානෙ අන්තිමේදී කොළඹ ඇවිත් තියෙනවා ගෙදරින් අරගෙන දීල තිබුණු ඉස්කූටරෙන්. ඒ ඇවිල්ල තියෙන්නෙ කලිසම් ඇඳගෙන අර සමයං අන්දරේ කියන පාඩම් වගයක් ඉගෙන ගන්ටයි. එහෙම ඇවිල්ල වෙනත් වෙනත් ආගම් ගැනත් ඉගෙනගෙන තියෙනවා. මට හිතෙන හැටියට වෙනත් ආගම්වල කටයුතුත් කරන්ට ඇති. ඔය කරුණු කාරණා හින්ද ම මොළේ අමාරුවක් හැදිල යන්ටැති පිට රටකට ඇත්ත සිද්ධිය ආරංචි වේවි කියන බයට. මොනව වුනත් දැන්නම් පිස්සුව තද වෙලා තමයි ඔය විකාර ඇඳුම් ඇඳගෙන ඇවිල්ල තියෙන්නේ ආයෙමත් ගමරට බලාගෙන. අනේ! අප්පේ! විහින් ඔළුවට දමා ගත්තු කරදර!"

"ඔය ඇත්තමද ඇනිටා නෝනෙ? හැබෑමද කතිරිනා අක්කෙ? කොච්චර හොඳට ළමයින්ට උගන්නගෙන උන්නු සිස්ටර්ද? අර නරකාදියත් ස්වර්ගයක් කරපු සිස්ටර් පබෝදානේද? ජේසු මරිය ජුසේ මෙච්චර හොඳ දේවල් කරපු සිස්ටර්ටත් මෙහෙව් දේවල් වෙද්දි අපට මොනව නම් නොවේවිද?" මරිය නෝනා වික්ෂෝප වුනාය.

"මරිය නෝන ඇන්ටි හිත කලබල කරගෙන ලෙඩ වෙන්ට කරි නෑ." ඇනිටා නෝනා කතාව අවසන් කරන්ට සැරසුනාය.

"ඔය මිචෙල් නෝනා කියන දේවල් බාරගන්ට ඕනෑ තාර බර ඇරලයි. එයා ඔය වගේ හිතලු කතා ගොතල කියන්ට හපන් විත්තිය ගමේ කවුරුත් දන්නව නේ! එහෙනම් අපි ගිහිල්ල එමු නේද කතිරිනා ඇන්ටි?" තිදෙනාම සාලයෙන් පිට වී ඉස්තෝප්පුව වෙතට පිය නැඟුහ.

"මරිය නෝනෙ, අනේ පීටර් මහත්ත යයි ක්‍රිස්පීනු අයියයි එනවා ඉස්කෝලෙ මහත්තයත් එක්කල" කතිරිනා අක්කා කියත්ම මිදුලට ආ ක්‍රිස්තීනු අය්යා

"හප්පේ! මෙහේ අද මහිලා සමිතියක් පවත්වල වගෙයි" අනෙක් දෙදෙනාගෙ මුහුණු බැලීය.

"ක්‍රිස්පීනු අංකල් අපි මේ ගෙදර යන ගමන් මෙහාට ගොඩවුනේ අලුත් ආරංචියක් කියන්ට" ඇනිටා නෝනා ඉස්තෝප්පුවේ නැවතුනු ගමන් කීවාය.

"ඒ මොකක් ගැනද ඇනිටා නෝනෙ?" ක්‍රිස්පීනු අයියා ප්‍රශ්න කළේය.

"මේ අපේ සිස්ටර් පබෝදා ගැන" උත්තර දුන්නී මරිය නෝනායි.

"හරි හරි අපිත් ආවෙ ඒක දැනගෙනමයි, සිස්ටර් පබෝදා ගැන කතා කරන්ටත් එක්කම තමයි" ඉස්තෝප්පුවට ගොඩවෙමින් ක්‍රිස්පීනු අයියා කීවේය.

"පව් නේද ක්‍රිස්පීනු අයියෙ?" දැන් ඉතින් සේරම කම්මුතුයි. පිස්සන් කොටුවට තමයි ඇතුළු කරන්ට වෙන්නෙ." කතිරිනා අක්කා දුක් වූවාය.

"ඒ මොකටද සිස්ටර්ව පිස්සන් කොටුවට දාන්නෙ. කතිරිනා අක්කලට ඔල්මාදෙද මේ යසට ඉන්න සිස්ටර් පබෝදාව පිස්සන් කොටුවට ගාල් කරන්ට හදන්නෙ?" විරුද්ධව කතා කළේ පීටර් මහත්මයාය.

"මේ ඔයා මොනව දැනගෙන ද කෑ කොස්සන් ගහන්නෙ? අද උදේ මිචෙල් හාමිනේ දැකල තියෙනවා ඉංගිරිසි පත්තරේ ලොකු අකුරෙන් අච්චු ගහලා 'සිස්ටර් පබෝදාට පිස්සු හැදිලා ආපහු මෙහාට එවලා කියලා." එවර කතා කළේ මරිය නෝනාය.

මහත් වෑයමෙන් සිනහව තදකරගත් ක්‍රිස්පීනු අයියා කතා කරන්නට විය.

"හරි හරි ඔක්කොමල මේ ඉස්තෝප්පුවෙ පුටුවල වාඩි වෙමුකො. ඉස්කෝලෙ මහත්තයා ඔන්න ඔය ඉංග්‍රීසි පත්තරේ අච්චු ගහල තියෙන දේ මේ කට්ටියට තේරුම් කරල දෙන්ටකො."

සියල්ලන්ම වාඩිවූ පසු ඉංග්‍රිසි පුවත් පත දිග හැර ගත් ඉස්කෝලෙ මහත්මයා එහි මුල් පිටුවෙහි වූ පින්තූරයත් තඩි අකුරෙන් මුද්‍රණය කරන ලද දෙපේළියේ හෙඩිමත් පෙන්වීය. පබෝදා ගරු පැවිදි සොයුරියගේ සම්පූර්ණ රූපය සහිත පින්තූරය පුවත් පතේ දකුණු පස ද හෙඩිම වම් පසද විය.

"මේ පින්තූරෙ ඉන්නෙ පබෝදා ගරු පැවිදි සොයුරිය පාස් කරපු අලුත් විභාගවලට ලැබුණු ඇඳුම් ඇගලුම්වලින් සැරසිලා උපාධි ලෝකවයි උපාධි හිස්වැස්මයි දාගෙන වම් පැත්තෙ ලොකු අකුරෙන් උඩ පේළියෙ තියෙන්නෙ Revd De Paboda MA DD කියලා හැබැයි අග D අකුර රූපෙට වැහිලා M A D කියල විතරයි පේන්නෙ. ඒක තමයි එයා දැක්ක විදිහට රෙව්ඩ් ඩ්ර් පබෝදා මැඩ් Revd Dr Paboda M A D කියල මිචෙල් හාමිනේ කියල ඇත්තෙ. මෙන්න මේකයි ඇත්ත කතාව. ඒ විස්තරෙන් මේ යටින් තියෙනවා. ඒ විස්තරේ කෙටියෙන් කීවොත් මෙහෙමයි. පබෝදා ගරු පැවිදි සොයුරිය විශ්ව විද්‍යාලයේ සමයාන්තර අධ්‍යයන සහ තුලනාත්මක දර්ශන අධ්‍යයන ධාරාව හදාරා උපාධිය උසස් ලෙස සමත්වීම නිසා ඉතාලි විශ්ව විද්‍යාලයක පර්යේෂණ අධ්‍යයනය සඳහා ශිෂ්‍යත්වයක් ලැබුවා. ඒ වෙන විටත් ඇයට මෙරට විශ්ව විද්‍යාලයකින් ආචාර්ය උපාධියක් පිරිනමා තිබුණි. ඒ පාසල් මඟින් ගමක් සංවර්ධනය කිරීම පිළිබඳ ලියූ ග්‍රන්ථයක් වෙනුවෙනි. පිටරට විශ්ව විද්‍යාලයේදී M A හෙවත් ශාස්ත්‍රපති උපාධියත් D D හෙවත් දේව ධර්මාචාර්ය උපාධියත් දිනාගත් ඕතොමෝ මේ නොබෝදා සිය මවු බිමට සැපත් වූවාය. "මෙන්න මෙවැනි හැඳින්වීමකින් පසුව ඇය පිළිබඳ තවත් විස්තර ඇතුළත් වෙලා තියෙනවා. ඉස්කෝලෙ මහත්මයා කරුණු ඇති හැටියට පහදා දුන්නේ, ඉංග්‍රීසි කෙටි යෙදුම් ගැනද හැඳින්වීමක් සහිතවය.

"මුලින් තියෙන Revd රෙව්ඩ් නෙමෙයි, Reverend කියන ඉංග්‍රීසි වචනෙ කෙටියෙදුම ඒකෙ තේරුම ගරු, ගරුතර හෙවත් පූජ්‍ය කියන එක. ඊළඟට තියෙන Dr ඩ්ර් නෙමෙයි Doctor යන ඉංග්‍රීසි වදනෙ කෙටි යෙදුම ආචාර්ය උපාධිධර කියන එක M A අකුරු යෙදෙන්නෙ Master of Arts යන්නට කෙටියෙන් ශාස්ත්‍රපති උපාධිය ලැබූ බවට D D යන අකුරුවලින් දේව ධර්මාචාර්ය උපාධිය ලැබූ බවයි පෙන්වන්නෙ. Doctor of Divinity තමයි සම්පූර්ණ වචනය. හෙඩිමෙ යට පේළියෙ Returns Home කියන්නෙ ආපහු මවු බිමට පැමිණෙයි කියන එක."

"එහෙම නම් ඉතින් සිස්ටර්ට නෙමෙයි පිස්සු අපි ඔහේලටයි රටේ තොටේ කරුණු කාරණා හරිහැටි නොදැන හිතලු කතා කියන වාචාල උන්දැලාටයි පිස්සු!" ක්‍රිස්පීනු අයියා කතාව සමාප්ත කළේය.

ෆිලීෂන් අබයකෝන්ගේ

## සුබස 247

# ව්‍යාකරණ විධි

2011.10.9 ප්‍රදීපයේ පළවු පරිදි පළමු සිංහල කතෝලික පුවත් පත වන අරුණෝදය මංගල කලාපය පවසන්නේ 'සිංහල ව්‍යාකරණයට එකඟ වූ වගවාසගම් ව්‍යවහාර කරන්නට උත්සාහ කරන බවය. මේ ප්‍රකාශය අදටත් වලංගුය.

උක්ත - ආඛ්‍යාත සම්බන්ධය වාක්‍ය අවබෝධයට අත්‍යවශ්‍යය. ආඛ්‍යාතය ප්‍රධාන ක්‍රියාවයි. උක්තයට කර්තෘ (කරන්නා) යයි කීමට බාධා වන්නේ කර්තෘ විභක්තියද? මාතෘ භාෂාවල මෙන් ප්‍රථමා ද්විතීයා සංඛ්‍යා දිගටම නොකියන සිංහල විභක්ති නාමය කාර්යය හඟවයි. සම්ප්‍රදානය දීමත් සම්බන්ධය අයිතියත් දක්වයි. ප්‍රථමා ආලපන විභක්ති හැර අනික් හත අන්+උක්ත=අනුක්තයි උක්ත නොවන රූපය ගැනීම අනුක්තවීමයංඅි. විසින්, විනා, සමග පිණිස, මෙන් වැනි නිපාත අනුක්ත රූපවූ නාමපදවලට බැඳේ.

ආඛ්‍යාතයට ක්‍රියාව යයි නොයෙදෙන්නේ පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා අප්‍රධාන ක්‍රියා බැවිනි. ක්‍රියාවර්ගවල නාමය කාර්යය හඟවයි. විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා බලන්න. අසම්භාව්‍ය නම් අවිශ්වසනීය යනුයි. සුබස 99 බලන්න.

කිතුනු ජනවන්දනාවේ සන්ධිත වචන රාශියට ප්‍රමුඛතාව දෙමින් සුබස 71 සිට 83 දක්වාත් 86, 87, 88 ත් සන්ධි ගැන කියා දෙයි.

සමාස යනු වචන දෙකක හෝ ඉන් වැඩියක එකතුවකි. නාම ප්‍රකෘතියකට ප්‍රත්‍යයක් එක්වී තැනෙන තද්ධිතත්, ක්‍රියා ධාතුවකට ප්‍රත්‍යයක් එක්වී තැනෙන කෘදන්තත් ප්‍රත්‍යයාර්ත නාම වේ. උපසර්ගයක් තනිව තේරුමක් නොදෙන අතර වචනයක් ඉදිරියට පැමිණ නානාර්ථ සපයයි. උපසර්ග සහිත වචන අව්‍යය සමාසයි. තාඩන පීඩන, කැවිලි පෙවිලි ආදි කෘදන්ත ඇතුළත් යුගල පද සමාස බවට පත්වෙද්දී ඔබ මොබ මෙන් තද්ධිත සමාස වීම විරලය. නායක+ත්ව=නායකත්ව, දායකත්ව, පූජකත්ව ආදිය කෘදන්ත තද්ධිත වීමකි.

කර්මය, සමාසය, ප්‍රත්‍යය ප්‍රකෘතිය ආදි ව්‍යාකරණයට විශේෂවූ නියමිත නාමය භාවිත කිරීම අතිශයින් වැදගත්ය. භාෂාව හදාරන්නට එය මූලිකය.

කර්මකාරකයට හැරවීම, ප්‍රකෘති විකෘති කථනය සාරාංශය ලිවීම ඉංග්‍රීසි අනුකරණයි. සමානාර්ථ පද, විරුද්ධාර්ථ පද සෙවීම නම් වචන ශක්තිය වර්ධනය කරයි. ඇක්ටිව් (සක්‍රිය) පැසිව් (අක්‍රිය) සඳහා කර්තෘකාරක කර්මකාරක කීමත්. ට්‍රාන්සිටිව් සඳහා සකර්මක කීමත් ඉංග්‍රීසි වචනාර්ථයට නොසැසඳේ අපේ භාෂාව හොඳාකාර ලියන්නට අප රටවාසීන්ට හැකිවේ යයි ප්‍රාර්ථනා කරමු. (අරුණෝදය මුල්කලබ 1863.10.1)

# කුඩා තෙරේසා තුමියගෙන් ප්‍රැන්සිස් සසුනිසුරාණන්ට සළකුණක්



කුඩා තෙරේසා සාන්තු වරිය කෙරෙහි ගැඹුරු භක්තියක් ඇත්තාවූ ප්‍රැන්සිස් සසුනිසුරාණන් වෙත සිරියාවේ සාමය සඳහා වතිකාන සර්ව රාත්‍රික යැදුමට පසුදිනැ එක රෝස මලක් ලැබිණි.

සැප්තැම්බර් මස 08 වෙනි දිනැ උදැසන වතිකාන බිම් පෙදෙසේ පා ගමනේ නිරතව සිටියදී, එහි සේවයේ නියැළී සිටි එක් අයෙක් එතුමාට සුදු රෝස මලක් ත්‍යාග කළේය. එදෝආර්දෝ මෙතිවෙල්ලි නම් අගරදගුරු හිමිපාණන් විසින් මෙම සිද්ධිය ශුද්ධෝත්තම පියාගේ අවසරයෙන්, මධ්‍ය වෙත ප්‍රකාශ කරනු ලැබුවේ කුඩා තෙරේසා සාන්තුවරිය පිළිබඳ ග්‍රන්ථයක් හෙළි දැක්වනු ලැබූ අවස්ථාවේදීය.

සුදු මල හා සර්ව රාත්‍රික යැදුම අතර සෘජු සම්බන්ධයක් ඇතැයි එතුමාගෙන් ප්‍රකාශ නොකැරුණත්, එතුමා විසින් කලින් ප්‍රකාශ කර ඇත්තේ ඉහතදී අසීරු අවස්ථාවන් හිදී එතුමා සුපුරුදු ලෙස කුඩා තෙරේසා සාන්තුවරියගෙන් ආධාර ඉල්ලා සිටිනා බවයි; එතුමා බුවනෝස් එයාර්ස්' හී අගරදගුරු හිමිපාණන් ලෙසින් සිටියදී, පුවත්පත් සාකච්ඡාවකදී කළ වදන් මෙළෙසින් සිහිපත් කරත. "මා ප්‍රශ්නයක් අත්දකිනා සැම අවස්ථාවකදීමැ සාන්තුවරියන්ගෙන් ඉල්ලා සිට ඇත්තේ, එම ප්‍රශ්නයට විසඳුමක් නොව, ඇගේ දැතට ගෙන, මා විසින් පිළිගනු ලැබුමට මෙහෙය වනු ලෙසටයි."

## කොලොම්බියාවේ පූජකවරු දෙදෙනෙක් ඝාතනය කැරේ

සැප්තැම්බර් මස 29 වෙනිදා එළිවෙන ජාමේ, කොලොම්බියාවේ මධ්‍යගත ප්‍රදේශයේ කණල්ඩනිලෝ පෙදෙසේ පවත්නා සෙබස්තියන් මීසම් ගෘහයේදී 69 හැවිරිදි බර්නාඩෝ බොහාවේරි සහ 27 හැවිරිදි හෙක්ටෝර් කබ්රේරා යන කතෝලික පූජකවරු දෙදෙනා ඝාතනය කර තිබිණි.

හෙක්ටෝර් කබ්රේරා පියතුමා පූජක වරය ලබා ඇත්තේ පසුගිය මාසයේය. ඝාතනයේ අරමුණ පූජක නිවසේ තුබු දැ සොරකම් කිරීම යයි පොලීසිය විසින් දක්වා ඇත. මෙම දුක්දායක මරණ දෙක පිළිබඳ කොලොම්බියාවේ, කාලි හී අගරදගුරු ගුරු ඩාරියෝ හිමිපාණන් විසින් මෙලෙසින් පවසනු ලැබීය. "මෙම පූජකවරුන් දෙදෙනාගේ මරණය ජීවිතය පිළිබඳ අයිතිය දෙයක් විනාශ කිරීම පමණක් නොව, සියළු කතෝලික බැතිමතුන් කෙරෙහි බලපාන පූජකවරය කෙළෙසීමක් ද වෙනවා." පූජකවරුන් දෙදෙනා භූමදාන කරනු ලැබූ අවස්ථාවේදී, ජීවිත පූජාවකට සහභාගි වන අයුරින් සියල්ලෝ නිහඬතාවයෙන් ආත්මයන් වෙනුවෙන් සමිඳුන් යැදීම කළහ.

## කිතුනු දහම වැළඳගත් සිරකාරියන් දෙදෙනෙක් නිදහස්

පසුගිය අගෝස්තු මාසයේදී ඉරානයේ නව ජනාධිපති ලෙස පත්වූ රසාන් රුහානිගේ රජය විසින් ආගමික හා මාධ්‍යය ක්‍රියාකාරකම් පිළිබඳ චෝදනාවන් මත සිරගත කරනු ලැබූ 11 දෙනෙක් නිදහස් කරත.

"ජගත් කිතුනු සහෝදරත්වය නමැති සංවිධානය" විසින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ, නිදහස් කරනු ලැබූවන් අතර කිතුනු කාන්තාවන් දෙදෙනෙක් ද සිටිනා බවයි. ඔවුන් වසර ගණනාවක් පුරා සිරගතව ඇත්තේ ඉස්ලාම් දහමින් කිතුනු දහම වැළඳගත් වරද නිසාය. මෙම කාන්තාවන් දෙදෙනාට යම් අප්‍රකට හේතුවක් මත සමාව දානය කරනු ලැබ ඇතත් තවත් කිතුනුවන් හා මාධ්‍ය කරුවන් විශාල සංඛ්‍යාවක් සිරගතව සිටිනා බැවින් ඔවුන් ද නිදහස් කිරීම සඳහා නව රජය විසින් ක්‍රියාදාමයක් දියත් කළ යුතු යයි ද මූලික අයිතිවාසිකම් පිළිබඳ සංවිධානයන් විසින් හඬ නැඟීම දැනටමත් දියත් කොට ඇත.

## සිරගත නීතිඥයා නිදහස් කරන්නැයි කතෝලිකයෝ යදිති

සැප්තැම්බර් මස 23 වෙනිදා වියට්නාමයේ හැනොයි නගරය පුරා ඉටිපහන් දල්වාගත් දහස් ගණන් කතෝලිකයන් සර්ව රාත්‍රික මෙහෙයක යෙදුනේ, දිගු කලක් සිරගතව සිටිනා කුඹක් කුආන් නම් කතෝලික නීතිඥවරයා නිදහස් කරනා ලෙස බළධාරීන්ගෙන් ඉල්ලමිනි.

වියට්නාමයේ සිදුවන කිතුනු තර්ජන, ගර්ජන හා පීඩාවන්ට එරෙහි නීතිමය පියවර ගැනීමට වෙහෙසෙන කතෝලික නීතිඥයන් අතර කුඹන් කුආන් නීතිඥයා ප්‍රමුඛ ස්ථානයක් දරයි; එමනිසාවෙන් ඔහු බළධාරීන්ගේ ශාරීරික පීඩාවන්ට පවා ඉලක්කවූ අවස්ථා එමටයි; එහෙත් ඔහුගේ ක්‍රියාකලාපයෙන් කිසිසේත්මැ නොනැවතීම නිසා, ඔහුගේ ආදායම් හා ආනුශංගික වරිපනම් ගෙවා නැතැයි යන බොරු චෝදනාවක් මත ඔහු සිරභාරයට ගන්නා ලදී.

ඔහු සිරභාරයෙන් මුදාලන බැව් කීපවතාවකදී ප්‍රකාශ කැරුණත්, එසේ සිදුනොවීම නිසා කතෝලිකයෝ මෙලෙසින් ප්‍රසිද්ධ නිහඬ යැදුමකට යොමුවී සිටියෝය.

ඉටිපහන් යැදුම් සර්ව රාත්‍රික මෙහෙයට, අති විශාල විශ්ව විද්‍යාල සිසු සිසුවියෝ සංඛ්‍යාවක් සහභාගි වූහ. ආගමික නිදහස පිළිබඳ ක්‍රියාකරුවකු වන කුඹන් කුආන් නීතිඥ වරයාගේ ක්‍රියා කලාපය වෙනුවෙන් සටන් කළ යුත්තේ, ආගමික නිදහස පොදු අයිතියක් නිසා යයි එම විශ්ව විද්‍යාල සිසුවෝ අවධාරණය කළහ.

මෙම කතෝලික නීතිඥයාගේ නිදහස පතා එවැනි ඉටිපහන් සර්ව රාත්‍රික මෙහෙයක් වියට්නාමයේ ගෝවිමින්ග් නගරයේදී ද ඒ අවස්ථාවේදීම පැවැතෙන බැව් ද වාර්තා විය.

ගෝවි විං නගරයේ අපෝස්තලික තානාපති කාර්යාලයේ දේව මාතාවන්ගේ පිළිරුවක් ඇත; එක් කාන්තාවක් සැම උදැසනකම එම පිළිරුව වෙත මල් පොකුරක් ගෙන එයි; එක් දිනකදී ඈ එලෙස මල් ගෙන එද්දී, එතැනට කඩා වැදුණු පිරිසක් ඇයට තලා පෙලා, එතැනට පැමිණි අපෝස්තලික තානාපතිවරයාට ද බැණ වැදී ඇත.

එම කාන්තාව වෙනුවෙන් නීතිමය පියවර ගැනීමට කුඹන් කුආන් නීතිඥ වරයා ඉදිරිපත් වූ හෙයින්, රාත්‍රී කාලයේදී වාහනය නවතා ඔහුට පහරදීමක් ද කරත.

## සිරියාවේ ඉපැරණි කිතුනු නගරය වෙත දිගටම ප්‍රහාර

උතුරු දස්කස් ප්‍රදේශයේ පිහිටි සද්නායා නමින් ඉපැරණි කිතුනු නගරයකි. සද්නායා ගම් පෙදෙස පුරාණ සංස්කෘතික හා ආගමික දායාදයන්ගෙන් ගහණය. එහි වෙසෙනා පාරම්පරික කිතුනුවෝ ඇරමයික් බසද කථා කරති.

පසුගිය සති කීපයකට ඉහතදි. එම ප්‍රදේශයේමැ පිහිටි මාලුලා නම් ඉපැරණි ග්‍රාමයට පහරදී විශාල විනාශයක් කළාට පසුව සැප්තැම්බර් මස 28 වෙනිදා, මුස්ලිම් ත්‍රස්ත කණ්ඩායමක්, සද්නායා ගමට කඩා වැද කිතුනුවන්ට පහර දෙන්නට පටන් ගත්හ; කිතුනුවන්ද සිය ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියාකරද්දී, එක් කතෝලිකයෙක් මරණයට පත්ව කීපදෙනෙක් තුවාල ලබා ඇත. කිතුනුවන් විසින් ගැටුම්කාරි තත්ත්වයක් බොහෝදුරට නිවාලීමට යත්න දරන්නේ, ග්‍රාමයේ පවත්නා ඓතිහාසික දෙව් මැඳුරු හා ආරාමයන් විනාශයට පත්වීම වළකාලීමටයි.

බලාපොරොත්තු රහිත අවස්ථාවන්හිදී, මුස්ලිම් ත්‍රස්ත පිරිස් ග්‍රාමයට කඩා වැදි කෑමොර දෙනු ලබන්නේ, කිතුනුවන් බිය වද්දා ග්‍රාමයෙන් පන්නා දැමීමටයි. එහෙත් ඔවුන් ඒකරාශි වී තර්ජන ගර්ජන හා පරහදීම් වලට මුහුණදීම සඳහා දැන් දැන් කණ්ඩායම් ගැසී ජීවත් වෙති. එලෙස කණ්ඩායම් ගැසී ජීවත්වෙන පිරිසකගෙන් එක් කිතුනුවෙක් ඔවුන් අතරට ගිය මාධ්‍ය වේදියකු හට මෙලෙස පවසා ඇත. "ආයුධ රැගත් මුස්ලිම් ත්‍රස්තවාදී පිරිස් සිරියාව පුරා විසිර සිටිනවා; ඔවුන්ගෙන් කිතුනුවන්ට පැමිණෙන මරණහානි වළකා ගැනීමට කිතුනුවන් විසින්මැ කළහැකි දෙයක් නොවේ. එබැවින් සිරියාවේ වෙසෙන කිතුනුවන් වෙනුවෙන් ජාත්‍යන්තර මැදිත්වීමක් දැන් දැන් අවශ්‍ය වී තිබෙනවා. එසේ නොවුවහොත්, කිතුනුවන් මෙන්මැ කිතුනු ඓතිහාසික සංස්කෘතික දායාදයන් ද ලොවට අහිමි විය හැකිය."

බටහිර සිරියාවේ 'කිතුනු නිම්නය' නමින් හැඳින්වෙන ප්‍රදේශය කිතුනුවන්ගෙන් ගහණයි. එම ප්‍රදේශයේද කිතුනු ගම්මාන 50 ක් පමණ ඇත. සිරියාවේ බොහෝ ප්‍රදේශ වලින් ආ කිතුනු සරණාගතයෝ විශාල සංඛ්‍යාවක් එහි ජීවත් වෙති; මෙම කිතුනු ගම්මාන වලැ සේවයේ යෙදෙන කාර්මේල් කන්‍යා සොහොයුරිය ද මාධ්‍යය වෙත පවසා ඇත්තේ, ජාත්‍යන්තර මැදිහත්වීමක් සිදු නොවුනහොත් එම ප්‍රදේශයෙහි වෙසෙන කිතුනුවන් මෙන්මැ කිතුනු සංස්කෘතික දායාදයන් මහා විනාශයක් කරා ගෙනගිය හැකි බවයි.

## ඉන්දුනීසියාවේ ඉස්ලාමීය පිරිස් දෙව් මැඳුරක් තැනීම වළකති

ඉන්දුනීසියාවේ, තංගරාන්ග් නම් නගරයේ කතෝලික දෙව් මැඳුරක් තැනීමට ආරම්භ කිරිම සඳහා එම මීසමට අයත් කතෝලික බැතිමත්හු අදාළ භූමිය තුළ මූලික කටයුතු ආරම්භ කිරිමට පසුගිය සතියේ ලහි ලහියේ සූදානම් වූහ.

වසර ගණනාවක් මුළුලේ එම ප්‍රදේශයේ ජීවත්වන 11,000 ක කතෝලික බැතිමතුන්ට නිසි ආකාරයේ දෙව් මැඳුරක් නොතිබිණි. ඒ නිසාවෙන් තමන්ගේ ආගමික වතාවත් සඳහා දෙව් මැඳුරක් තැනීමට රජයේ අනුමතිය ඉල්ලා තිබුනේ අවුරුදු 23 කට ඉහතදීය; එම අවසරය පසුගිය සැප්තැම්බර් මස 11 වෙනිදා ඔවුන් අතට පත්වූ විට, වහා වහා සූදානම් වූයේ, නව දෙව් දෙව්මැඳුරේ කටයුතු ආරම්භ කිරිමටයි; එහෙත් පසුගිය සතියේ බලාපොරොත්තු නොවූ ආකාරයට ඉස්ලාමීය ත්‍රස්ත කණ්ඩායම් කීපයකට අයත් 200 ක් පමණ දෙනා දේවස්ථානය තැනීමට සූදානම් කැරෙන භූමියට පැමිණ එහි විරෝධතාවයක නිරත වූහ. අවසර ලබා තිබුණත්, එම දෙව් මැඳුර කිසිසේත්මැ ගොඩනැගීමට ඉඩ නොදෙන බැව් ඔවුහු කෑ මොර දුන්හ.

උදාවි ඇති ශෝචනීය තත්ත්වය අරභයා මීසම් පාලක පවුලස් ආලු ලුබුර් පියතුමා මෙසේ අදහස් දක්වයි. "දේව මැඳුර ගොඩනැගීම සඳහා රජයේ අවසරය ද, බොහෝ ඉස්ලාමීය නායකයන්ගේ ලිඛිත අනුමතිය ද ලැබී ඇති අතර, විරෝධතාවයන් පැන නැගීම තේරුම්ගත නොහැක්කක්. එමෙන්මැ මෙම පීඩාකාරි තත්ත්වය රටපුරා පැතිර යද්දි, ජනාධිපති සුසිලෝ බංබාන් ද ඔහුගේ රජය ද නිහඬව සිටීම පුරවැසියන් වන අපගේ මූලික අයිතිවාසිකම් පවා බිඳ දැමීමක් නොවන්නේද?" "ජගත් කිතුනු සහෝදරත්වය" සංවිධානය විසින් ද මෙම අසාධාරණ ක්‍රියාදාමය හෙළා දැක ඇති අතර, සියළු ඉන්දුනීසියානු කිතුනුවෝ, වසර ගණනාවක් බලා සිටීමෙන් මෙම අභිප්‍රාය සමිඳුන් අත තබමින් පොදු හා තනි යැදුමේ යෙදෙනා බැව් කිතුනු පුවත් වාර්තා කරයි.

## ජේරුසලමේ සොහොන් බිමේ සොහොන් ගැබ් විනාශ කැරේ

පැරණි ජේරුසලමේ සීනායි කඳු පෙදෙසේ කිතුනු සොහොන් බිමක් ඇත. සැප්තැම්බර් මස 29 වෙනිදා සන්ධ්‍යා භාගයේදී, ඊශ්‍රායලීය ජුදා ජාතික ගැටවරයින් විසින් එම සොහොන් බිමට ගොස් සොහොන් ගැබ 15 ට අධික සංඛ්‍යාවක් විනාශ කොට, ඒ මත සිටුවා තුබූ කුරුස ද විනාශ කොට ඇත.

මෙම ගැටවරයන් පොලිස් බාරයට ගෙන ඇත. පසු හෙළිවී ඇත්තේ එම ගැටවරයින් හතරදෙනා, ජුදා ආගමික විදුහලක සිසුවන් බවයි.

පසුගිය වසර තුළදී ද, එවන් ජුදා ආගමික ත්‍රස්ත පිරිස් විසින්, කිතුනු හා මුස්ලිම් ආගමික ස්ථානයන්ට පහරදීම් ගණනාවක් කරති බැව් පලස්තීන ජාතික රධිඩ් අබ්‍රසහිලා නම් පියතුමා විසින් මාධ්‍යයට හෙළි දක්වනු ලැබීය. විශේෂයෙන් ජුදා ආගමික විදුහල්වලැ උගෙනුම ලබන්නාවූ සිසුවන් කිතුනු පූජක වරයකු හෝ පැවිදි වරයකු මුණ ගැසුනු විට පවා පැත්තකට හැරී බිමට නැමී "කෙළ ගසනා" බැව් ද පියතුමා විසින් දක්වනු ලැබීය.

## ඊජිප්තුවේ ගැමි කිතුනුවන්ට පහර දෙති

සැප්තැම්බර් මස 28 වෙනිදා ඊජිප්තුවේ මින්යා ප්‍රාන්තයේ ෂෙකේරියා නම් ගමේ ජීවත් වන ගැමි කොප්ටික් කිතුනුවන් ද ගේදොර ද, ව්‍යාපාර ස්ථාන ද වෙත දරුණු පහර එල්ල කොට ඇත.



ෂකේරියා ගමේ ජනගහනය 4000 පමණි. විශාල මුස්ලිම් පිරිසක් විසින්, ගල්මුල් වලින් පහර දීමෙන් ගේදොර ද, වෙළඳ පොළවල් ද විනාශයට පාත්‍ර කොට තිබේ. පහරදීමට ආගමික හේතුව වී ඇත්තේ, 22 හැවිරිදි කරෝලියාස් සවෙන් නම් තරුණයා විසින් එම වයසේමැ මුස්ලිම් තරුණියක් හා ප්‍රේම සම්බන්ධතාවයකින් විවාහයට සූදානම් වීමයි.

මින්සා හී අන්බා මකාණියෝස් නම් රදගුරු හිමිපාණන් විසින් මාධ්‍යයට ප්‍රකාශ කොට ඇති පරිදි, ආසන්නම ග්‍රාමයේ ජීවත්වන මුස්ලිම් පිරිස් ෂකේරියා ගමට කඩා වැද දරුණු පහරදීම්, එල්ල කරමින් කිතුනුවන් පන්නා දමමින්, ඔවුන් සතු දෑ විනාශ කළ බවයි. පොලිස් නිළධාරින් ද එම ස්ථානයට පැමිණියත්, ශබ්ද විකාශන යන්ත්‍ර මගින්, මුස්ලිම් වරුන් අවුස්සාලමින් කෝපාග්නිය පතුරුවාලීම නිසා. පහරදීම් වළක්වාලීමට දිගු වේලාවක් ගතවිය.

පසුව මුස්ලිම් හා කිතුනු ගිහි නායකයින් කැඳවා පොලිස් බළධාරින් විසින් සාම සාකච්ඡාවක් පවත්වනු ලැබීය. එහෙත්, කිතුනු සභා නායකයින්ට ඊට සහභාගිවීමට අවකාශ නොදෙන ලදී. අදාළ යුවල තමන් අතර සම්බන්ධතාවය නවතාලීමට අකමැති වූ හෙයින්, වන්දි වශයෙන් තරුණයා විසින් ඊජිප්තු පවුම් 300,000 ක් ද, තරුණිය විසින් එම මුදල් 150,000 ක්ද රජයට ගෙවිය යුතු යයි නියම කරනු ලැබීය. තරුණියට එම මුදල ගෙවීමට හැකි නොවූ නිසා, ඒ මුදල තරුණයාගේ දඩයට එකතු කරන ලදී.

තරුණයාගේ පවුලේ අය එම දඩ මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කරනු ලැබීම හේතු කොටගෙන, එම පවුලේ සහෝදරයන් 5 දෙනා ගමෙන් පන්නා දැමීමට ද තීරණය කරනු ලැබීය. ඔවුන් අතර විවාහයක් සිදු නොවිය යුතු යයි ද තීරණය කරනු ලැබීය.

"ෂෙකෙරියා ගම් පියස මුස්ලිම් තර්ජනයෙන් බිය සංතාපයට පත්ව ඇත. මුස්ලිම් කොටස් විසින් ඉස්ලාම් බැතිමතුන් උසිගැන්වීමේ ව්‍යාපාරයක් ෂෙකෙරියා ග්‍රාමය තුළ පමණක් නොව අසල්වැසි ගම්මානයන් තුළ ද සිදු වෙමින් පවතී. බළධාරීන් විසින් යම් පියවරක් නොගතහොත් කිතුනු සංහාරයක් සිදුවන්නට පුළුවන," මෙලෙස ප්‍රකාශ කරනු ලැබුවේ, මින්යා හී රදගුරු හිමිපාණෝය.

බැසිල් ෆොන්සේකා විසිනි

සංවාද මණ්ඩපය

# කතෝලිකයාගේ දේශපාලනය

පසුගිය සතියෙන්.......

**දේශපාලන පක්ෂ, පුද්ගලික බලපෑම්, ආර්ථික වාසි, ජනමාධ්‍ය, ඊට කෙරෙන බලපෑම කණගාටුදායකය. මේ හේතුවෙන් ස්වල්ප දෙනෙකුගේ යහපත සඳහා බොහෝ දෙනෙකු කරන පිස්සු ක්‍රියාවලියක් බවට ඡන්දය පත්ව ඇත. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදය බහුතර පාලනයක් විය නොහැකි යැයි සර් හෙන්රි මේන් ප්‍රකාශ කර ඇත.**

"ප්‍රජාතන්ත්‍රවාදයට ඉහළින්ම ගරු කරතත් බහුතරයකගේ මතය නිතරම නිවැරදි බව පිළිගන්නේ නැත" යනුවෙන් ශ්‍රී ජවහර්ලාල් නේරු තුමා සඳහන් කරයි. මෝඩයන් උත්සව පවත්වති. බුද්ධිමත්හු සැප විඳිති. එසේම ශ්‍රී ලංකාවේ සමහර ජනප්‍රිය හා ධනවත් පුරාජේරුකරුවන්ගේ මුග්ධ හැසිරීම් පිළිබඳව යහපත් කතෝලිකයා හඬක් නැගිය යුතුය. ප්‍රජාතන්ත්‍රවාදයෙන් අවසාන වශයෙන් බලාපොරොත්තු වනුයේ ප්‍රබුද්ධ නිගමනයකි. හැඟීම් මඟින් නොව බුද්ධිමත්ව එළඹෙන නිගමනයකි. පරමාදර්ශී ප්‍රජාතන්ත්‍රවාදයේ අරමුණ එයයි.

ප්‍රේමයේ හා දැහැමියාවේ නැඹුරුවක පාලනයක් ඇති කිරීම සඳහා රටක අයිතිවාසිකම් හා යුතුකම් මහඟු බලපෑමක් කරයි. සමාජ ජීවිතය යහපත්ව පවත්වා ගෙන යාමට අවශ්‍ය කොන්දේසි මාලාවක් ලෙස හැරල්ඩ් ලැස්කි අයිතිවාසිකම් හා යුතුකම් පැහැදිලි කරයි. 1948 දෙසැම්බර් 10 වන දින එක්සත් ජාතීන්ගේ සංවිධානය මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය උදාර අරමුණකින් ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රජය එය පිළිගෙන ඇත. සියළු මිනිසුන් නිදහස්ව ඉපිද ඇති බවත් ඔවුනට ආත්ම ගරුත්වයකින් ජීවත් වීමට අයිතිවාසිකමක් තිබෙන බවත් මෙහි සඳහන් වේ.

ජීවිතය හා නිදහසට ඇති පූර්ණ අයිතිය, දේශපාලන අයිතිය, කථා කිරීම හා නිදහස් අදහස් ප්‍රකාශ කිරීම, කැමති ආගමක් ඇදහීම, වැනි අයිතිවාසිකම් ගණනාවක් ඊට අයත් වේ. අප ශ්‍රී ලංකාව තුළ මේ අයිතිවාසිකම් සුරැකෙන්නේ නැත්නම් ඊට හඬක් අවදි කිරීමට කතෝලිකයින්ට අයිතියක් ඇත. අතුරුදන් කිරීම්, මිනීමැරුම්, විරුද්ධවාදීන් පෙළීම, දූෂණ වංචා, ප්‍රවෘත්ති වාරණය හා පක්ෂග්‍රාහී වීම ආගමික සිද්ධස්ථාන විනාශ කිරීම ආගමික නායකයන්ගේ හඬට පිටුපා යෑම ප්‍රජාතන්ත්‍රවාදී රටක සිදු නොවිය යුතු දේය. ජාතිවාදය, ආගම්වාදය රටක භයානක ප්‍රතිඵල ඇති කරවයි. "මම ඇතන්ස් වර්ගිකයකු හෝ ග්‍රීක ජාතිකයකු නොවෙමි. මිනිස් ප්‍රාණියෙකි." සොක්‍රටීස්ගේ ප්‍රකාශනයකි.

මීට අමතරව යුතුකම් සමූහයක් ද සමාජයේ යහපත සඳහා පැවතිය යුතු අතර යුතුකම් ඉටු කිරීම පිළිබඳ දැඩිව අවධානය යොමු කර ඇති එම්මානුවෙල් කාන්ට් "යුතුකම් නැති ලෝකයක අයිතිවාසිකම් පැවතිය නොහැකි" බැව් ප්‍රකාශ කර සිටී. නිදසුනක් වශයෙන් උගත් උපාධිධාරින්ට රැකියා ලබා දීම රජයේ යුතුකමකි. බුද්ධිමතකුට රැකියාවක් කිරීමට අයිතියක් ද පවතී. නමුත් රජයේ යුතුකම ඉටු නොවේ නම් අයිතිවාසිකම් අර්ථ ශූන්‍ය වේ. රටක පාලකයන් විසින් ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමට බැඳී සිටී. එය යුතුකමකි. පොදු දේපල හා ජීවිත ආරක්ෂා කිරීමට ද රජය බැඳී සිටී. පොදු යහපතට පටහැනි නොවන ලෙස මේ යුතුකම් හා අයිතිවාසිකම් ක්‍රියාත්මක විය යුතුය.

යහපත් සමාජයක් බිහිවීම සඳහා නීතිය දැඩිව බැඳී පවතී. නීතිය නොමැති නම් සමාජය දෙදරුම් කෑ හැකිය. ප්‍රජාතන්ත්‍රවාදී රටක මූලික ලක්ෂණය වන්නේ නීතියේ ආධිපත්‍ය පිළිගැනීමයි. මිනිස් අයිතිවාසිකම් සුරැකීමට නීතිය අත්‍යවශ්‍ය වන අතර මිනිස් චර්යාවන් හසුරුවනු ලබන්නේ නීතිය මඟිනි. නීතිය උත්තරීතර වන අතර සමානාත්මතාව පිළිබඳ සංකල්පය නීතියේ ආධිපත්‍යය හා බැඳී පවතී. රාජ්‍ය පනවන නීති යහපත් සමාජයක් බිහි කිරීමට අනුබල නොදේ නම් එහි මහජන කැමැත්ත පිළිබිඹු නොවේ නම් ඊට විරුද්ධ වීමේ අයිතිය යහපත් කතෝලිකයන්ට ඇත. එවිට නීතිය වෙනස් කිරීමට රජය පියවර ගත යුතුයි. නීතිය යනු අවසානයේ මහජන ස්වාධිපත්‍යයේ ආඥාව විය යුතුයි.

නීතිය පසිඳලීම සඳහා ස්වාධින අධිකරණයක් අත්‍යවශ්‍යය. අධිකරණය ස්වාධීන නොවේ නම් එය පක්ෂග්‍රාහී වේ නම් ජනතා විශ්වාසය බිඳ වැටෙනු ඇත. බලයේ සිටීමේ අරමුණින් රටක ව්‍යවස්ථාව සංශෝධනය කිරීම ප්‍රඥාගෝචර නොවේ. ශ්‍රී ලංකාවේ ජනාධිපති බලතල ඇමරිකානු ජනාධිපති ධුරයට වඩා බලගතු වේ යයි මත ප්‍රකාශ වී ඇත. එයින් අනාගතයේ භයානක ප්‍රතිඵල ඇති විය හැකිය. කෙසේ වුවත් ප්‍රජාතන්ත්‍රවාදයේදී මිනිසකුට වැරදි සිදුවීමේ අයිතියක් ඇති බව පිළිග නී. ලෝකය වෙනස් කිරීමට සිතන්නේ නම් පළමුව ඔබ වෙනස් විය යුතුය. අන්‍යයන්ගේ මොලයෙන් තමන්ගේ වැඩකටයුතු කරගෙන යාමට අපි උත්සාහ ගත යුතු වෙමු. ආයුධ සන්නද්ධ හෝ රැඩිකල්වාදී දැඩි වෙනසක් සඳහා කතෝලිකයා අවතීර්ණ නොවිය යුතුය.

ශ්‍රී ලංකාවේ වර්තමාන රජය පිළිබඳ නුවණින් විමසා බැලීමේදී එය ඉතාමත් ශක්තිමත් ජනප්‍රසාදය දිනූ ආණ්ඩුවක් බව ප්‍රත්‍යක්ෂ වේ. අසීමිත බලතල අනුව ඉසුරුමත් රටක් බිහි කිරීම සඳහා ජනාධිපතිතුමා බලය යොදා සිහි නුවණින් කටයුතු කරන්නේ නම් එයින් මහඟු ප්‍රතිඵල ලබා ගත හැකිය. තවදුරටත් පැහැදිලි කළහොත් අද රටේ පවතින දූෂණ, වංචා, මත්ද්‍රව්‍ය, මිනිමැරුම් රජයේ ගෝලබාලයින්ගේ නොමනා හැසිරීම් දැඩිව පාලනය කර හැකි වේ නම් එයින් මේ බිම් පෙතට යහපතක්ම සිදුවනු නොඅනුමානය. ඔහු සමස්ත ජනතාවගේම නායකයා ය. එසේ නම් දැහැමි පාලනයක් බිහි කර ගැනීමේ අරමුණින් මේ රජයට අවවාදයෙන් හා සංවාදයෙන් බලපෑම් කරමින් නිසි මඟ පෙන්වීමට පෙරමුණ ගැනීම යහපත් කතෝලිකයාගේ යුතුකම විය යුතු යයි සිතමි.

✍ **කැනීෂියස් පලිහවඩන**

# දේව සැලැස්ම අනුව වතුර ඉල්ලීම මානව අයිතියක්

**දඬුගම - ඇල්ප්‍රඩ් නෙල්සන්**

**2013. 09. 22 ලිපිය හා සබැඳේ**

මෙහි ඉතාමත් කෲරතර හැසිරීම වන්නේ ඒකරාශීවීම් වැළැක්වීම පිණිස අනුගමනය කළ යුතු පිළිගත් ප්‍රතිපත්ති වලින් බැහැර වී පිපාසයට ජලය ඉල්ලූ ජනතාවකට වෙඩි උණ්ඩ වලින් සංග්‍රහ කිරීම ය. එම ප්‍රහාරය කොතරම් අමානුෂික තත්ත්වයට පත් වී ඇද්ද කිවහොත් මාධ්‍ය වාර්තා කරන අන්දමට වැලිවේරියේ ශා. අන්තෝනි මුනිඳුන්ගේ දේවස්ථාන භූමියට තම ජීවිත රැකවරණ පතා ගිය මිනිසුන්ට ගැහැනුන්ට හා ළමයින්ට පවා ඉවක් බවක් නැතිව පහර දී ඇත.

මෙය කිසිසේත්ම සිදුවිය යුත්තක් නොවේ. තම ජීවිත ආරක්ෂාව පතා දෙව්මැඳුරට ගිය ජනතාවට සිදුවූ හිරිහැර ගැන සඳහන් කරන කාදිනල් හිමිපාණන් " පූජනීය භූමියක් තුළට අවි ආයුධ රැගෙන ඇතුළුවීම හා එහිදී ප්‍රචණ්ඩ ලෙස හැසිරීම ප්‍රජාතන්ත්‍රවාදී රටක කිසිවකු අනුමත නොකරන බව අමුතුවෙන් කිවයුතු නොවේ යයි පවසා ඇත. ඕනෑම ආගමික සිද්ධස්ථානයක් වෙත ආරක්ෂාව පතා එන ජනතාව ආරක්ෂා කිරීමේ වගකීමෙන් අපි හැමදෙනා බැඳී සිටිමු" යැයි අවධාරණය කරයි. සිදුවූ සිදුවීමේ ප්‍රචණ්ඩකාරී තත්ත්වය ඇතැම් මාධ්‍ය විසින් වාර්තා කර තිබුණි. මාධ්‍ය වෙතින් මෙම හැසිරීම වසං කිරීමේ අදහසින් මාධ්‍යයට පහර දීම් හා තර්ජනය කිරීම් කර ඇතත් එය සැඟවීමට හැකි වී නැත. විදේශීය රටවල් හා ජාත්‍යන්තර ආයතන විසින් මෙවැනි ක්‍රියා පිළිබඳව ඇති කර ගන්නා ආකල්පය නම් අපට කිසිසේත්ම හිතකර එකක් නොවේ. හමුදාව හා යුද්ධය පිළිබඳ නොයෙකුත් අර්බුදකාරී මතවාදයක් පවතින අවස්ථාවක මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියා එම සැකයන් තහවුරු කිරීමට රුකුලක් දෙයි. ඒ නිසා රටට අපකීර්තියක් ඇති නොවන ලෙසටත් මානුෂික ලෙස ක්‍රියා කිරීමටත් ප්‍රවේසම් වීම වැදගත් ය.

අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන එකී මානව අයිතීන් පිළිබඳව xxiii ජුවාම් සසුනිසුරාණන් "ලෝක සාමය" නම් විශ්ව ප්‍රකාශනයෙන් සාකච්ඡා කරන්නේ 1963 වැනි වකවානුවක ය. මෙම අයිතීන් ගැන ශු. සභාව ඊට ඉහත සාකච්ඡා නොකළා නොව සමාජයේ ඇතිවන වර්ධනීය ප්‍රවණතාවයන්ට අනුව දහම අරුත් ගැන්වීම සිදුවිය. "සෑම මිනිසාට ම තම ජීවිතයට ද ශරීර සම්පූර්ණත්වයට ද ජීවිතය නියම ලෙස දියුණු කර ගැනීමට අවශ්‍ය වූ හා යෝග්‍ය වූ උපකරණ වලට ද අයිතිවාසිකම් තිබෙන බව පෙනී යන්නේ ය. මූලික වශයෙන් මේවා නම් ආහාර පාන, ඇඳුම් පැළඳුම්, ඉඳුම් හිටුම්, විවේකය, වෛද්‍ය උපකාරක හා සමාජ සේවා පහසුකම් ය. එහෙයින් රෝග පීඩාවන්හිදී ද වැන්දඹු තත්ත්වයට පත් කල්හි ද මහළු වියෙහි දී ද නැතහොත් කිසිම වරදක් හේතුකොට නොගෙන ජීවන රක්ෂණ පහසුකම් අහිමි වන කල්හි ද මිනිසාගේ ආරක්ෂාවට අයිතියක්

☛ 15 පිටුවට

# පැලේ කවිය



දෙස්පාලනය උරුමයි අපටත් මෙරට
ඒ තුළ කිතුනු දහමේ පිළිවෙත හොඳට
හුරුකර තිබෙන තුරු බිය - සැක ගනු කුමට
නිලතල පදවි හමුවේ නොම වේ නිවට

දෙස - රැස - බසට - ජනතාවට හොඳ හිතට
කැපවෙන ගතිය - කැපකර ඇත හද වතට
රවටා මුසා දොඩමින් පැන සැම අතට
වෙස් බැඳි මුහුණු නොම දේ මහජන වෙතට

රාළ මීගමුවේ

# මීසම්වල කොට්ඨාශ නායකයින්ගේ වගකීම හා මීසම් ධර්ම සේවා සභා

පසුගිය සතියෙන්....

**මීසම් ධර්මසේවා සභා කොයිබට ද?**

මීසම් ධර්ම සේවා සභා සාමාජිකත්වය ද, සේවය ද ස්වෙච්ඡා සේවයකි. පරාර්ථකාමී කැපවීමකි. වැටුපක් නොලබන ආධ්‍යාත්මික සේවයකි.

කොළඹ අගරදගුරු පදවියේ කොට්ඨාශ නායක නායිකා සේවයට නැති උපදේශන මාලාවක් වෙයි. මෙයට ඇත්ගාල, නිමල් වාස් මහතා පෙන්වා දුන් ලෙස 1980 දී එකල අගරදගුරු අති උතුම් නික්ලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන් විසින් මෙම සභා ක්‍රමය ස්ථාපිත කෙරිණි. ඊට පෙර පැවති මීසම් ගරු පියවරුනට සේවා සඳහා සහය වූ අන්නවි මහතුන්ගේ සේවයට වැඩි අර්ථ නිරූපණයක් මෙයට ලබා දුනි. එතුමා කොළඹ අගරදගුරු පදවි සෑම මීසමක, දේවස්ථානයක මීසම් ධර්ම සේවා සභාවක් පිහිටුවීමට ඇරියුම් කෙරිණි.

ඒ සඳහා ව්‍යවස්ථාවක් වැනි උපදේශාත්මක පොත් පිංචක් 1998 පළ කෙරිණි. එය "කිතුනු නවෝදයට සහ සහභාගශීලි සභාවකට මඟ පාදන මීසම් ධර්ම සේවා සභා" යනුවෙන් නම් කෙරිණි. එම උපදේශන පොත් පිංචේ මීසම් ධර්ම සේවා සභාවේ අරමුණු, සේවාවන්, සාමාජික සුදුසුකම්, නිලධාරි, ගරු සභාපති පියතුමාගේ භූමිකාව නිර්දේශ වෙයි. මීසම් ධර්ම සේවා සභා පිහිටුවා අවුරුදු 20 ට අධික කාලයක් ගත වුවද එහි ප්‍රධාන අරමුණු නොසලකා උඩින් පල්ලෙන් එම උපදේශන ක්‍රියාත්මක කරන මීසම් සභා වත්මන් මීසම්වල ක්‍රියාත්මක වෙයි.

ඇත්ගාලේ - නිමල් වාස් මහතා පෙන්වා දී ඇති ලෙස "මීසම් ධර්ම සේවාවක් නිසි පරිදි ක්‍රියාත්මක වේ නම් මූලිකව එහි කමිටු හය ක්‍රියාත්මක විය යුතුයි. එවැනි කමිටු ක්‍රියාත්මක වන මීසම් ධර්ම සේවා සභා අතලොස්සක් හෝ තිබේද යන්න සැකයකි. එසේම එම උපදේශනය අනුව අරමුණු, සේවා සභාපති ගරු ගරු පියතුමාගේ වගකීම් හා යුතුකම් ආදියෙන් කොටසක්වත් වත්මන් මීසම් ධර්ම සේවා සභා තුළ ප්‍රතිෂ්ඨාපනය වී නොමැත. දැනුදු ක්‍රියාත්මක වන්නේ පැරණි අන්නවි මහතුන් විසින් මංගල්‍යයන් පැවැත්වීමට මීසම් වාසි ජනතාව සහභාගි කරවා ගැනීමේ භෞතික ක්‍රියා මාර්ගයකි.

උපදේශන පොත් පිංචේ ඇති ලෙස මීසම් ධර්ම සේවා සභා ක්‍රියාත්මක වුවහොත් මීසම් ජනතාව තුළ ආධ්‍යාත්මික වටිනාකම් හරවත් වී සාධුශීලි ශුද්ධවත් දිවියකට මීසම් වාසින් පෙළඹෙනු නොඅනුමානය. වත්මන් මීසම් සභා තුළින් සිදුවන සේවා මෙසේ පෙළ ගැස්විය හැකිය.

1. දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍යය උත්කර්ෂවත්ව පැවැත්වීම.

මේ සඳහා පළමුව කොඩිගස එසවීමේ සිට මංගල්‍ය අවසානයේ වීදි යාමෙන් පසු ස්තූති ප්‍රශංසා (මංගල්‍ය ජයට කිරීමට උදව් වූ ප්‍රභූ නාම උච්චාරණය) කර අත්පොළසන් දීමෙන් නිමවන තුරු කෙරෙන මීසම් සභා සේවා මෙසේ ය. දෙව්මැඳුර හා භූමිය අලංකාර කිරීමේ ශ්‍රමදාන, ශබ්ද විකාශන, විදුලි බුබුළු, ධජ වැල් ගම් පුරා අතුරු පාරවල දැමීම, තොරණ ගැසීම, තූර්ය භාණ්ඩ වාදන සපිරිවරා ආරාධිත ප්‍රභූන් කැඳවා ගෙන ඒම, මල් මාලා හා බුලත් දීම, පහන් දැල්වීම, දේවස්ථාන අරමුදල් සඳහා සල්පිල් හෝ වෙළෙඳ සැල් ඇරඹීම, කොට්ඨාශ කොඩිගස් හා කොඩිවැල් එල්ලීම, නුවාන කාසි නුවාන තරගයට එකතු කිරීම මේ බොහෝ කටයුතුවල නායකත්වය මීසම් ධර්ම සේවා සභා සාමාජිකත්වයයි.

ඉහත කරුණු හැරුනු විට සමහර මීසම්වල ගරු පියතුමන්ගේ මහත් උද්යෝග යෙන් ලූර්දු ගුහා තැනීම, දේවස්ථානයට පැමිණෙන භූමියේ විරාජමාන දොරටු සෑදිම, දෙව් මැඳුර භූමියේ මංමාවත් දැමීම, මීසම් ගෘහය තැනීම, දෙව්මැඳුරට සිවිලිම් ගැසීම, දෙව්මැඳුර බිම ටෙරාසෝ හෝ ටයිල් කිරීම, භූමිය උද්‍යාන සිරි ගැන්වීම, පරණ කොස්, පොල් ආදි ගස් කපා දැමීම (අලුතින් ගස් සිටුවීම අඩුය) මෙම ව්‍යාපෘති අභිරුචියෙන් අගය කර කෙසේ හෝ මුදල් සොයා ඉටු කිරීමට මීසම් ධර්ම සේවා සභා සාමාජිකයින් සාකච්ඡා කරන්නේ එකිනෙකා ඉස්මතු වන ලෙස මහත් ආනන්දයකිනි.

ගරු සභාපති පියතුමා මේ අදහස දෙන්නේ "මේවා මං අරන් යන්නේ නැහැ ඔබේ මීසමට යි" පවසමිනි. එවිට සභා ශ්‍රාවකයෝ "ඇත්ත නේන්නම් මේක කොහොම හරි කරන්ට ඕනෑ"යි ඊට ක්‍රියාත්මක වෙති.

එක් මීසමක ගරු පියතුමා මේ කටයුතු සාකච්ඡා කරන අතරතුර "ඉරිදා පල්ලි එන්නේ මීසම් ජනතාවගෙන් 30%කි." ප්‍රකාශ කෙරිණි. එහෙත් ඒ මීසම් සභාවේ කිසිවකු ගරු පියතුමෙනි 70% පල්ලි එන්නේ නැති හින්දා ඒ හැත්තෑවෙන් භාගයක්වත් ඉරිදා පූජාවට කැඳවා ගන්නට අපි දැන් සාකච්ඡා කරමු." කීමට තරම් ආත්ම ශක්තියක් නැත්තෝ වෙති. එසේම ඉහත ප්‍රශ්නය ප්‍රශ්නයක් ලෙස නොව සිද්ධියක් ලෙස සභාවට කී ගරු පියතුමා ද ඒ ගැන සාකච්ඡාවක් නො කෙරිණි.

මෙහි ඉහත සඳහන් කළ සේවා නොකළ යුතු යයි අපි නොකියමු. එහෙත් පොදු මීසම් ජනතාවගේ වර්ධනයට, දහම් පිපාසයක් ඇති කිරීමට ඉහත සේවා වලින් වැඩක් සිදුවේද? ඒ නිසා ඉහත ද සාකච්ඡා කරන සේවයක් ලෙස ඒවා අගයන මීසම් සභා "බොරු මීසම් සභා" වෙයි.

✍ **ඩී. එස්. පතිරණ**

# 'මිශ්‍ර විවාහය' කතෝලික විශ්වාසය හා කිතුනු පවුල් දිවිය දියාරු කරයිද?

මිශ්‍ර විවාහය තුළ කතෝලික ආධ්‍යාත්මික පවුල් පරිසරයක් තිබිය හැකි වන්නේ කලාතුරකිනි. එකට යදින පවුලක් ලෙස එකට දෙවිඳුන් යදින්න, එකට දරුවන් සමග දෙව් මැඳුරේ දිව්‍ය පූජාව පුද කිරීමට හැකියාවක් නැත. දිව්‍ය පූජාව පවුලේ යාගයයි. තවද මිශ්‍ර විවාහය නිසා 'ගෘහස්ථ සභාවට' සිදුවන්නේ බරපතල හානියකි.

මේ ශුද්ධ ලියවිල්ල 'මිශ්‍ර විවාහය' පිළිබඳව ඉතා පැහැදිලිව ප්‍රකාශ කරන්නේ කුමක්ද? "නොඇදහිලිවතුන් සමග නොගැලපෙන සම්බන්ධකම් වලින් නොබැඳෙන්න. යුක්තියත්, අයුක්තියත් අතර ඇති සම්බන්ධතාව කිමෙක්ද? එළියත් අඳුරත් අතර ඇති එකමුතුව කිමෙක්ද? ක්‍රිස්තුන් වහන්සේ හා යක්ෂාධිපතියා හා අතර එකඟ වීමක් තිබිය හැකිද? ඇදහිලිවන්තයකු හා නොඇදහිලිවන්තයකු අතර පොදුවේ යමක් ඇත්ද? දේව මාලිගාව හා දේවතා පිළිම හා අතර සමාන කමක් ඇද්ද? නැත. අපි ජීවමාන දෙවියන් වහන්සේගේ මන්දිර වෙමු......" (2කොරි. 14-16) අද සිදුවන මිශ්‍ර විවාහයට මෙය කොතෙක් දුරට සත්‍යයක් දැයි අපට සිතාගත හැකිය.

මා දන්නා තරුණ මිශ්‍ර විවාහ යුවළක් තම දරුවාව අන්‍ය ආගමික ස්වාමි පුරුෂයාගේ විරුද්ධත්වය නිසා බෞතීස්ම කර ගැනීමට බැරිව මානසික වේදනාවෙන් සිටී. මෙම කතෝලික මව බෞතිස්ම නොකළ දරුවාට කුරුසියක් පැළඳවීමට ගිය විට ස්වාමි පුරුෂයා විරුද්ධ වූ අතර, ස්වාමි පුරුෂයා පංචායුධය දරුවාට දැමීමට සූදානම් වූවිට කතෝලික මව විරුද්ධ විය. මේවා විවාහයට පෙර විවෘතව සාකච්ඡා නොකිරීමේ ඵලවිපාකයි. මේ සිද්ධිය නිසා ඔවුන් දෙදෙනා අතර සමගියක් බාහිරව පිටතින් පෙනුනාට, ඇතුලාන්ත සමගි සමාදානයක් නැති බව ඇය මා සමග කී කරුණු වලින් පෙනීයයි. දෙදෙනාගේ ආදරයට මෙය කොතරම් අහිතකර ලෙස බලපානවා දැයි කීමට අවශ්‍ය නැත.

තවත් මිශ්‍ර විවාහක යුවලක් පවුලේ සමගිය තියා ගැනීමට අවශ්‍ය නිසා ජේසු සමිඳුන්ගේ සුරුවම හා බුදු පිළිමය එකට තබා පහන පත්තු කරයි. මෙය දස පනතේ පළමුවන පනතට විරුද්ධ ක්‍රියාවකි, පාපයකි. එනම් සැබෑවූ එකම දෙවිඳුන් පමණක් වන්දනා කරව', කඩ කිරීමකි. කතෝලික අපට මැවුම්කාර දෙවිඳුන්ටයි, දෙවිඳුන්ගේම මැවිල්ලකටයි එකම දේව වන්දනාව පිදීමට බැරිය. යම් ලෙසකින් දරුවන් බෞතිස්ම කර තිබේ නම්, මෙයින් දරුවන්ට දෙනු ලබන අවාදර්ශය පමණක් නොව, සැබෑවූ එකම දෙවිඳුන් කෙරෙහි තිබිය යුතු විශ්වාසය, දරුවන් තුළින් දියකර හරිනවා නොවේද? දරුවාට තේරුම් යන වයස පැමිණි කල ඔහු සිතන්නේ ආගම් දෙකේ වෙනසක් නැතැයි කියායි. එම නිසා පල්ලි ගියත්, පන්සල් ගියත් දෙකම එකයි කියා පවුලේ මිශ්‍ර ආගම් පරිසරය දරුවාට පෙන්වා දෙයි.

දිනක් මිශ්‍ර විවාහක පවුලක තරුණයෙක් උපදේශනය සඳහා පැමිණියා. ඔහු සමග උපදේශනයේ යෙදී සිටින අතර මා හට දකින්න ලැබුණේ, ඔහුගේ කරේ පැළඳ තිබූ රනින් සෑදූ කුරුසියයි. නමුත් මේ කුරුසිය අනිකුත් කුරුසවලට වඩා වෙනසක් පෙන්වූවා. එම කුරුසිය මැද කුඩා මැණික් ගලක් සවි කර තිබූ නිසයි තරුණයාගෙන් කුරුසිය ගැන විමසීමේදී ඔහු කීවේ "අම්මා ගුරුකම් කර මැණික් ගලක් එයට සවි කළ බවයි. ඔහුගේ විස්තරයට අනුව මව බෞද්ධ, පියා කතෝලික, කුරුසිය ඒ ලෙස සාදා තිබෙන්නේ කතෝලික පියාගේද කැමැත්ත ඇතිව බව දැන ගන්න ලැබුණි.

මෙම සිද්ධියෙන් පෙන්නුම් කරන්නේ කතෝලික යැයි කියා ගන්නා පියාටද දෙවිඳුන් කෙරෙහි ඇති දුබල විශ්වාසයයි. මෙවැනි මිශ්‍ර විවාහක පවුල්වල දරුවන්ට කිතුනු විශ්වාසය හෝ ආධ්‍යාත්මික පෝෂණය කොහෙත්ම නොලැබේ. මෙයින් සිදුවන්නේ නමට පමණක් සීමාවූ කතෝලික පරපුරක් අනාගතයේදී බිහිවීමට ඇති ඉඩකඩයි. ඉහත කී තරුණයා ඉරුදින පූජාවට යෑම හෝ දහම් පාසල් යන්නේ ඉඳහිට බවද පවසන ලදී. මිශ්‍ර විවාහය නිසා දෙවිඳුන් කෙරෙහි තිබිය යුතු විශ්වාසය දියාරුවී යෑමට මෙය කදිම නිදසුනකි. අනෙක් ආගම් කෙසේ වෙතත්, කතෝලික පවුල්වල තිබිය යුතු, කිතුනු ආධ්‍යාත්මික පසුබිම, මිශ්‍ර විවාහය නිසා දෙදරා යෑමට හේතු වේ. මෙහි භයානක කම දරුවන්ගේ විශ්වාසය හීන වී යෑම නිසා කතෝලික දහමට ලැදියාවක් නැති පිරිසක් බිහිවී, තව තවත් මිශ්‍ර විවාහයන් වර්ධනය වීමට මාර්ගය සලසනු ලැබීමයි.

මිශ්‍ර විවාහයේ ආදීනව එපමණක් නොවේ. හඳහන් බැලීම. ගුරුකම් වලට යොමුවීම, ලෙඩදුකක් සෑදුණු විට බෝධි පූජා පැවැත්වීම, පිරිත් නූල් බැඳීම ආදිය කිරීමට අන්‍යාග මික පර්ශවය යොමු වේ. මා දන්නා මිශ්‍ර විවාහ පවුල් මේ දේවල් සිදු කරති. අප නොදැනුවත්වම මිශ්‍ර විවාහ පවුල් වලින්. දෙවිඳුන් කෙරෙහි විශ්වාසය නැති වී ගොස් නාමික කතෝලිකයින් බිහිවී, පල්ලියේ (සභාවේ) අයිතිවාසිකම් ලබාගැනීමේ චේතනාවෙන්, එසේ නැති නම් දරුවා කතෝලික පාසලකට ඇතුළත් කර ගැනීමේ අරමුණෙන් බෞතිස්ම කර ගැනීම අද සිදුවන්නකි.

එක්තරා පියතුමෙක් මා සමග පැවසුවේ 2013 පසුගිය මසක පමණක්, එම මීසමේ සිදු වු විවාහයන් 23 න් කතෝලික යුවල විවාහ වී ඇත්තේ 3 ක් පමණි. මිශ්‍ර විවාහයේ ඉහළ යෑම මෙයින් පෙන්නුම් කරයි. මෙය සභා නායකයින්ගේ ඇස් පෑදීමට හේතු වේවායි බලාපොරොත්තු වෙමි.

සභාවේ නිල වාර්තා දක්වන පරිදි, පසුගිය වසර 3 තුළ පමණක් මිශ්‍ර විවාහ ඉහළ යෑමක් පෙන්නුම් කරන අතර පල්ලියේ විවාහවූ අය අතරින් දික්කසාදයද වැඩි වී ඇති බවයි. එබැවින් අප සිතා බැලිය යුතු වන්නේ, කතෝලික පවුල් නොමැති වූ විට අප රට තුළ කතෝලික සභාවට යන කල දසාවයි. මිශ්‍ර විවාහය වර්ධනය වීමෙන්, කතෝලික පවුල් පදනම විනාශවී, දෙවිඳුන් කෙරෙහි තිබිය යුතු ගැඹුරු විශ්වාසය නැතිවී යෑම පුදුමයට කරුණක් නොවේ.

මේ "විශ්වාසයේ වසර" තුළ ඇත්තටම මිශ්‍ර විවාහයන් නිසා සිදුවන්නේ විශ්වාසය වර්ධනය විමක්ද? නැත්නම් විශ්වාසය සෝදා පාලුවී යෑමක්දැයි සිතා බැලීමට කාලය උදාවී ඇත. මෙය බරපතල ප්‍රශ්නයකි, කතෝලික පවුල් දියවී යෑම අප නොදැනුවත්වම සිදු වෙමින් පවතී. තවද මිශ්‍ර විවාහ බලෙන් නතර කිරීමට බැරි බව සත්‍යයකි. නමුත් එය අධෛර්යවත් කිරීමට, යම්කිසි දැඩි ක්‍රියාමාර්ගයන් ගැනීමට දැන් කාලය පැමිණ තිබේ. නැතිනම් නුදුරු අනාගතයේදී කතෝලික පවුල් නැතිවී ගොස්, ඊනියා මිශ්‍ර විවාහ පවුල් බිහිවී, කතෝලික පවුලක් සොයා ගැනීමට හැකි වන්නේ කලාතුරකිනි.

ඒමනිසා මිශ්‍ර විවාහ අධෛර්යවත් කිරීමට නම් කතෝලික යුවළක් විවාහ වීමේදී දෙනු ලබන දිව්‍ය පූජාවේ සමහර ජනවන්දනා වත් පිළිවෙත්, මිශ්‍ර විවාහයට දෙනු ලබන "දේව මෙහෙයට" ලබා නොදිය යුතුය. මිශ්‍ර විවාහය දේව ප්‍රසාද නිධානයක් නොවන නිසා විවාහ මංගල සීනු නාද නොකළ යුතුය. කොටින්ම මිශ්‍ර විවාහයට දෙව්මැඳුරේ ජනවන්දනාවට දෙනු ලබන උත්සවාකාර ප්‍රසිද්ධිය ලබා දීමෙන් අනියමින් මිශ්‍ර විවාහය දිරිමත් කරයි. මෙම ප්‍රසිද්ධිය හා සමාජ පිළිගැනීම, සභාවේ වත්පිළිවෙත් මිශ්‍ර විවාහයට නැති වූ විට කතෝලික තරුණ/ තරුණියන් අන්‍යාගමිකයෙක් සමග ප්‍රේම සම්බන්ධයක් ඇතිකර ගැනීමේදී දෙවරක් සිතීමට සිදුවේ.

ඇත්තෙන්ම මිශ්‍ර විවාහයද සිදු කළ යුත්තේ උදාහරණයක් ලෙස, යුවළක් පල්ලියේ විවාහ නොවී සිවිල් විවාහයක් සිදුකරගත් පසු සභාව තුළ කරනු ලබන "විවාහය යළි සැකසීම" (RECTIFICATION) අප්‍රසිද්ධියේ කරනු ලබන්නාක් මෙන් මිශ්‍ර විවාහයද ඒ ලෙස සිදු කළ යුතුය.

විවාහ මංගල පූජා වත්පිළිවෙත් හෝ දේව මෙහෙයද නැති වූ විට, සමාජීය වශයෙන් සභාව තුළ පිළිගැනීමක් නැති කල 'මිශ්‍ර විවාහයට' ඇතුලුවීම ඉබේම අඩුවී යනු ඇත. කව්රුත් උත්සහ කරන්නේ තම විවාහ මංගල්‍යය දෙව්මැඳුර තුළ උත්සවාකාරයෙන් ගැනීමටයි. එම පහසුකම් පල්ලියෙන් නොලැබෙන විට ඒ ගැන බරපතල ලෙස තරුණ පරපුර සිතීමට පටන් ගනී. මෙවැනි දැඩි පියවර මගින් මිශ්‍ර විවාහය අධෛර්යමත් කිරීමට දැන් කාලය පැමිණ ඇති බව සභා ශ්‍රේෂ්ඨයන්ට මතක් කළ යුතුව ඇත.

**බෙනඩික් සිල්වා**
කළුතර

# බාර ඔප්පු කිරීම

ලෙඩ දුකකදි හෝ කරදරයකදි පිහිටට වෙන කිසිවෙකු නැති විටදී, බොහෝ විට අපට කියැවෙන්නේ 'දෙවියනේ......' කියායි. ඉන් වැටහෙන්නේ මිනිස් අපගේ අසරණ භාවයයි. ඒ නිසා කිසිම හව්හරණක් නැති බව පෙනෙන විට, අපේ පැරැන්නෝ පමණක් නොව අද පවා බොහෝ අය කරන්නේ වහාම තමාට වඩාත් විශ්වාස සාන්තුවරයෙක්ව සිහිකර බාරයක් වීමයි.

අතීතයේ මට අමතක නොවන සිද්ධි වලින් එකක් මෙසේ සටහන් කරන්නම්. එක් දිනක් මහ රෑ ඇසුනු විලාප හඬකින් මා අවදිවුණා. ගෙදර මහා කලබලයක්! කිසිවකුට මා ගැන මතකයක්ද තිබුනේ නැති ගානයි. මාද කිසිවක් සිතා ගැනීමට බැරි තත්ත්වයකට පත්වී සිටියා. මේ වනවිට මගේ වයස අවුරුදු 5 ක් පමණ වෙන්න ඇති. මොහොතකින් ඇසුනු හැඬුම් හඬ අම්මගේ බව වැටහුණා. මමද හඬාගෙන අම්මගෙ ඇගේ එල්ලුනා මතකයි. එවිට අම්මගේ අවධානය මා වෙත යොමුවුනා.

"දුව රුපියලක් අරගෙන හොඳට හෝදලා සුදු රෙදි කෑල්ලක ගැට ගහලා ඔයාගෙ මල්ලියට හොඳ වෙන්න කියලා බාරයක් වෙන්න." අම්මා අඬමින් මට කීවා මතකයි. මල්ලිට හැදුන භයානක අසනීපය උණ වලිප්පුව බවත්, එම බාරවීමේ ක්‍රමවේදය ගැනත් මගේ ජීවිතේ ලද පළමු අත්දැකීම එයයි. කෙසේ හෝ මගේ මල්ලි සුවවුණා. අම්මට පසුව මතක් වුණා මල්ලි වෙනුවෙන් බාරයක් වුණ බව. "දුව මොනව කියලද මල්ලි වෙනුවෙන් බාර වුණේ" ඇය මගෙන් ඇසුවා. "මල්ලිට හොඳ වෙන්න කියලා විතරයි" මා කීවා. "කොයි පල්ලියටද බාරවුණෙ?" අම්මගේ ඊළඟ ප්‍රශ්නය. "මට මතක නෑ අම්මේ. මම ඉල්ලුවේ මගේ මල්ලියා හොඳ වෙන්න කියලා විතරයි." ඊට පස්සේ අම්මා, මල්ලි වෙනුවෙන් ඉටි පන්දමක් මා ලව්වා පත්තු කරලා ඈ එම බාරය ඔප්පු කළා. රෙදි කෑල්ලේ ගැට ගහපු කාසිය ගත් ඇය, එය අපේ පල්ලියේ කැටේට දැම්මා.

මා ගතින් සිතින් වැඩෙන විට. 'බාරවීම' ගැන මගේ කුතුහලය වැඩුණා. නිතරම ඒ ගැන දෙමව්පියන්ගෙන් ප්‍රශ්න කළා. කුඩා කල මා වෙනුවෙන්ද ඔවුන් එසේ බාර වුන බව මට දැන ගන්න ලැබුණා. එදා සිට අද දක්වා මෙවන් බාර ඔප්පු කිරීමේ ක්‍රමවේදයන් ගැන නොයෙකුත් අදහස් සිත තුළ පෙරළි කෙරුවා.

විවිධ බාර ඔප්පු කරන ආකාරයන් මා දන්නා විදිහට නම් මෙසේයි. 'ජීවිතයට ජීවිතයක්' බාර වී, පොල් පැළයක් ගෙනත් අල්තාරය ලඟ තැබීම. 'උසට උසක්' බාර වී. ඒ උසට ඉටිපන්දමක් පත්තු කිරීම. 'රූපයට රූපයක්' බාර වී, ඒ සඳහා මුදල් ගෙවා තහඩුවෙන් කැපූ රූප කොටස් ලබාගෙන ඒවා ඔප්පු කිරීම. ඊ ඊට අමතරව රත්‍රං මාල සුරුවමට පැළඳවීම, කුඩා ගවුම් මසා සුරුවමට ඇන්දවීම. සුරුවම යටින් රිංගවීම, මල්මාලා පැළඳවීම. ස්තුති පූජා පැවැත්වීම. පල්ලිය ලඟ ආහාර බෙදාදීම, පල්ලියේ ළිඳෙන් නැහැවීම. දරුවා වෙන්දේසි කිරීම (විශේෂයෙන් නිකුලා මුනිඳුන්ගේ දේවස්ථානයේ මෙය සිදුවී තිබේ) පල්ලියේ දොරකඩ සිට අල්තාරය දක්වා දණින් යෑම....... මේ ආකාරයේ තවත් මා නොදන්නා බොහෝ ක්‍රම තිබිය හැකියි. එසේ බාරහාර වීම වැරැද්දක් ලෙසද කිව නොහැකි වූවත් යෝජනාවක් කිරීමට අවසර දෙන්න.

ඔබ දෙවියන් ට වූ බාරය ඔප්පු කරන විට, දෙවියන්ට හෝ සාන්තුරවයින්ට. මෙලොව බඩු භාණ්ඩ වලින් පලක් නැති නිසා, පෞද්ගලිකව ඔබටත් පොදුවේ සමාජයටත් යහපතක් වන ලෙස ඒවා කළ නොහැකිද? උදාහරණයක් ලෙස,

"මම සිගරට් වලට ඇබ්බැහි වෙලා හිටියේ. මම අද ඉඳලා එය සම්පූර්ණයෙන්ම නවත්වනවා......."

"මගේ දරුවා වෙනුවෙන් රෝහලක නැවතී සිටින දිළිඳු දරුවෙකුට ළමා ඇඳුම් පරිත්‍යාග කරනවා."

"මම මත්පැන්වලට ගොදුරු වෙලා හිටියේ. එය අද පටන් නවත්වනවා....."

"මගේ දරුවෝ ගැන මම හෙව්වේ බැලුවේ නැහැ. අද පටන් එය වගකීමෙන් කරනවා."

"පවුලකට සතියකට ඇතිවෙන්න ආහාර මල්ලක් දෙනවා."

"අනාථ නිවාසයකට මගේ හොඳම ඇඳුම් කට්ටල කිහිපයක් දෙනවා."

"මගේ දරුවා වෙනුවෙන් තවත් නැති බැරි දරුවෙකුට ඉගෙනීමට උදව් කරනවා."

"මගේ ජීවිතය සමාජ සේවය වෙනුවෙන් වැය කරනවා."

මෙවැනි බොහෝ සමාජ සත්කාරක ක්‍රියා ඔබට මතක් වේවි. එවිට බාර හාර හේතුවෙන් පල්ලි වල එකතු වෙන සිය දහස් ගණන් කොඩි හා සුරුවම් වලට ඇන්දවු ඇඳුම් තොග පිටින් නිකරුනේ පුළුස්සා දැමීමට සිදු නොවේවි. පොල් පැළ අල්තාරය ලඟ මිය නොයාවි. එපමණක් නොවේ. ඔබේ එවන් අර්ථවත් බාරහාර වීම් පසුව සමාජ සත්කාරක ක්‍රියාවන් ලෙසින් ඔප්පු කළවිට, (නැතහොත් බාර හරින විට). ඔබ විශ්වාසය තැබූ සාන්තුරවයා හෝ සාන්තුවරිය පවා ඔබගේ ක්‍රියාව ගැන සතුටු වේවි. මොහොතකට සිතන්න. අප යමක් කරන විට ක්‍රිස්තු තුමාගේ ඇසින් ඒ දෙස බලා ඉටු කරන්න මහන්සි ගත්තොත් අපේ විශ්වාසයන් අපට සැමදා සඵල වේවි.

**නිර්මලා ප්‍රියන්ති රොඩ්රිගෝ**
කැපුන්ගොඩ

## පහන් කැදැල්ල

## ඉල ඇදෙන කතා



### ආදම්ගේ ඉල ඇට



බිරින්දෑවරු තම සැමියන් ගැන සැක සිතීම බොහෝවිට සිදුවන්නකි. සුගති උද්‍යානයේදීද එය එසේම විය. දිනක් ආදම් ගෙදර එන්නට පරක්කු විය.

"තමුසෙ කොහෙද රෑ වෙනකල් ගියෙ. එකත් එකටම වෙන හොර ගෑනු පස්සෙ යන්ඩ ඇති"යි කියමින් ඒව ඔහුගේ ඇඟට කඩාපැන්නාය.

ඉතා අසරණ වූ ආදම්, "ඕක හරිම අසාධාරණ කතාවක්නෙ. මේ උයනේ ග ෑනියකුට ඉන්නෙ ඔයා විතරයි. ඉතිං මට පස්සෙන් යන්න ගෑනු කොහෙද?" යි තම නිදහසට කරුණු ඉදිරිපත් කළේය.

මෙසේ කියා හිත් වේදනාවට පත් ආදම් කෑමත් නොකා නිදා ගත්තේය. එක් වරම ආදම්ට ඇහැරුණේ තම ලැම පෙදෙසක කවුරුන් හෝ අණින බව දැනුන නිසාය. බලද්දි ඒ ඒවය.

"මොකද මේ ඔයා කරන්නේ. මට නිදා ගන්ඩ දෙන්න."

"තමුසෙගෙ ඉල ඇට ගණිනව" ඇගේ පිළිතුර විය.

### දෙවියන් දැකීම



ඇය දැහැමි මහළු කාන්තාවකි. දිනපතාම උදේ පාන්දර තම නිවසේ දොරකඩට පැමිණෙන ඇය "ප්‍රශංසා වේවා, දෙවියන් වහන්සේට ප්‍රශංසා වේවා"යි උස් හඬින් කෑගසන්නීය. අල්ලපු ගෙදර මිනිහා දෙවියන් කෙරෙහි විශ්වාස නොකරන අදේවවාදියෙකි. කාන්තාව කෑගසන හැම විටකම, "දෙවියන් නැත. දෙවියන් මැරිලා" යයි ඊටත් වඩා උස්හඬින් කෑගසන්නේය.

දිනක් මෙම කාන්තාව, "අනේ දෙවියනි මට අද කන්ඩ දෙයක් නැහැ. ප්‍රශංසා වේවා. මට දවල්ට හොද්දක් හදා ගන්ඩ මොනව හරි දෙන්ඩ. ප්‍රශංසා වේවා"යි කෑ ගැසුවාය. අර මිනිහ හොර රහසේම කඩයට ගොස් බඩු මල්ලක් ගෙනැවිත් කාන්තාවගේ ගෙදර දොරකඩ තැබීය. ටික වේලාවකින් එළියට ආ කාන්තාව බඩු මල්ල දැක, "දෙවියනි ඔබවහන්සේ මට සවන් දුන්නා. ප්‍රශංසා වේවා. බඩු මල්ල ලැබුණා. ප්‍රශංසා වේවා"යි මහ හයියෙන් කෑ ගැසුවාය.

"මං කිව්ව හරිද දෙවියන් නැහැ කියල. දෙයියෝ නෙමේ බඩු මල්ල තිබ්බෙ මම"යි අල්ලපු ගෙදර මිනිහා උපහාසයෙන් යුතුව කාන්තාවට කීවේය.

"ප්‍රශංසා වේවා. දෙවියනි බඩු මල්ල විතරක් නොවෙයි අල්ලපු ගෙදර යක්ෂයාට ඒකට ගෙවන්ඩ වෙච්ච එක ගැනත් ප්‍රශංසා වේවා"යි කාන්තාව තවත් උස් හඬින් කෑ ගැසුවාය.

දැල්වෙන පහන්

# වසර 175 ක් පැමිණි ගමන් මග සමරන කුරුසියේ සොහොයුරියෝ

කුරුසියේ සොයුරියන්ගේ නිකායේ ආරම්භය සනිටුහන් වූයේ 1838 වර්ෂයේ ප්‍රංශයේ මනරම් කඳුකර පළාතක් වූ ෂැවනෝ නම් ග්‍රාමයේදී ය. 1789-1797 කාලය තුළ පැවති ප්‍රංශ විප්ලවය සහ 1750-1830 කාලය තුළ සිදු වූ යුරෝපයේ කාර්මික විප්ලවය ප්‍රංශයේ පැවති සමාජ, ආර්ථික හා දේශපාලනික තත්ත්වයන් වලට ඇඩිව බලපෑම් කරන ලදි.

මෙම කාලයේ දී ෂැවනෝහි ඉතාමත් භක්තිමත්, ආගම දහමට ලැදිව මීසමේ වැඩ කටයුතු කරමින් ක්ලෝඩීන් එෂිනියර් යනුවෙන් එක් තරුණියක් ජීවත් වූවාය. ඇය ජීවත් වූයේ ෆෙටර්න්ස් හි වැබ්ලේස් යන ග්‍රාමයේ ය. ඇය ඉතාමත් දිළිඳු පවුලක කෙනෙක් විය. ඇයට වයස අවුරුදු 15 ක් වන විට මව අභිමි විය. ඒ හේතුවෙන් ඇයට ඇයගේ සහෝදර සහෝදරියන් රැක බලා ගන්නට සිදු වූවාය. ඇයට නිවසින් වෙන් වන්නට හැකි වූයේ වයස අවුරුදු 27 දීය. ෂැවනෝ හි මීසම් ගෘහයේ දී ඇය මීසමේ ළමුන් සහ තරුණ ගැහැනු ළමුන් එක්රැස් කර ගනිමින් ඔවුනට කියවන්නට, ලියන්නට සහ ආගමික දැනුමක් ලබාදෙන ලදි.

එම කාලයේ දී සා. ෆ්‍රැන්සිස් ද සාලෙස් මුනිතුමාගේ මිෂනාරි නිකායේ නිර්මාතෘ වන ඉතාමත් භක්තිමත් පියතුමකු වූ පීටර් මර්මියර් සමාජයේ පැවති දුප්පත්කම, නූගත්කම පිළිබඳ මහත් සේ කම්පාවට පත් වී එම තත්ත්වයන් සමාජයෙන් තුරන් කර දැමීම සඳහා ක්‍රමවේදයන් සොයන්නට විය. ඔහු දුප්පත් තරුණ ගැහැනු ළමුන්ට ලෝකය තුළ දිවි ගෙවමින් නව ආරයක පැවදි නිකායක් ආරම්භ කරන්නට අධිෂ්ඨාන කර ගන්නා ලදි. ඔහු 1838 දී ෂැවනෝහි දේශනා කිරීම සඳහා ගිය අවස්ථාවක දී ක්ලෝඩීන් එෂිනියර් මුනගැසුණි. සෑම ඉරුදිනකම ඇය වෙත පැමිණි සමහර ගැහැනු ළමෝ ඇයගේ දිවි පෙවෙත පිළිබඳව පැහැදි තම ජීවිත මුළුමනින් ම දෙවියන් වහන්සේට කැප කිරීමටත් ජනතාව වෙනුවෙන් සේවය කරන්නටත් උනන්දු වූහ.

මර්මියර් පියතුමාගේ අපෝස්තලික සිහිනය ශුද්ධාත්මයාණන්ගේ මගපෙන්වීම තුළින් කාලයේ සළකුණු වලට අවදි වෙමින් තරුණ ගැහැනු ළමුන් ක්ලෝඩීන් වටා එක්රැස් වෙමින් කුරුසියේ සොයුරියන්ගේ පළමුවන පැවිදි හවුල බවට පත්විය.

එම කාල වකවානුවේ දී ඉතාමත් දිළිඳු වූද, චාම් වූද නව ආරයක පැවිදි නිකායක් ලෙස කුරුසියේ සොයුරියන්ගේ පැවිදි හවුල ආරම්භ විය. මෙම දුප්පත් ළමුනට ලෝකය තුළ ජීවත් වෙමින් කැපවීමේ දිවි පෙවෙතක් ගත කිරීම සඳහා අවසර ලැබුණි. ඔවුන් ජීවත් වන පරිසරය තුළ සුවිශේෂයට සාක්ෂි දරමින් එකිනෙකාට උදව් වීමටත් අසරණ දුප්පත් අයට අධ්‍යාපනය ලබා දීමටත් ඔවුනට හැකියාවක් ලැබුණි. ඔවුන්ගේ සේවාවන් සහ ජීවිත ආදර්ශය තුළින් සමාජයේ ජීවත් වූ නූගත් අසරණ දුප්පත් ඔවුනගේ එම තත්ත්වයන් තුළින් මිදෙන්නට අත්වැලක් වන්නට ඔවුනට හැකි විය. 1869 ක්ලෝඩීන් එෂිනියර් මිය යන විට පැවිදි හවුල තුළ 300 ක් පමණ පැවිදි සොයුරියෝ සිටියහ. කුරුසියේ සොයුරියන්ගේ පැවිදි හවුල ආරම්භ කිරීමෙන් අනතුරුව ශුද්ධ වූ සභාවේ අවශ්‍යතාවයන්ට පිළිතුරු දෙමින් ඉතාමත් ධෛර්යය සම්පන්නව ස්විට්සර්ලන්තය සහ ඉන්දියාවට ව්‍යාප්ත විය. නොදන්නා රටවලට දේව වචනය පතල කිරීමේ පරමාර්ථය පෙරදැරි කරගෙන අප්‍රිකාව. ලතින් ඇමරිකාව යන මහද්වීප වලට ද ව්‍යාප්ත විය. අද වන විට රටවල් 16 ක සහ මහද්වීප 4 ක සේවයේ නිරත වී ඇත.




අන්තර්ජාතික පැවිදි හවුල් තුළ ජීවත් වෙමින් විවිධ සංස්කෘතීන් වල වටිනාකම් බෙදා හදා ගනිමින් විවිධ රටවල්, පුද්ගලයන් සමග එකට කටයුතු කරමින් දේව රාජ්‍යය ගොඩනැගීමේ මහගු කාර්යයේ නියැලෙමින් කුරුසියේ සොයුරියන් විවිධ සමාජ පසුතලයන් තුළ මාංශගත වී කටයුතු කරයි.

අද අප නිකායේ සොයුරියන් අප ලක් දෙරණේ පදවි 5 ක විවිධ වූ සේවාවන් රැසක නියැලෙමින් දෙවිඳු ආදරය තම ජීවිත වලින් හඬ ගා ප්‍රකාශ කරන්නට වෙර දරති. අප සොයුරියන් පේරාදෙනිය, පඩිවත්ත, හිගුරක්ගොඩ. කැකිරාව, බිබිල, බිංගිරිය, හැව්ලොක් ටවුම, අමන්දොළුව, කැලණිය යන ප්‍රදේශ වල තම සේවාවන් ඉතාමත් උද්යෝග යෙන් හා කැපවීමෙන් කරගෙන යනු ලබති. අප විශේෂයෙන් ම යොමු වී ඇත්තේ සමාජයේ කොන් වී සිටින අසරණ පීඩිත වූ ජනතාවට, මීසම් සේවාවට, කිසිවකුගේ හව්හරණක් නැති වැඩිහිටියන්ට, වතුකරයේ ජනතාවට, පෙර පාසල් අධ්‍යාපනයට, දිවා සුරැකුම් මධ්‍යස්ථාන, ළමා නිවාස, ගුරු සේවය යනාදි සේවාවන් සඳහා ය.

අප නිකායේ නිර්මාතෘවරිය අප සැම කුරුසියේ සොයුරියන් ලෙස දෙවියන් වහන්සේගේ ආදරය ලොවට ප්‍රකාශ කරන්නටත් උන්වහන්සේව හඳුන්වා දෙන්නටත් පත් කර ඇත. අප සැම ඉතාමත් සතුටින් ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහසට සම්බන්ධ වෙමින් අප සැම එක්ව ක්‍රියාකාරි වනුයේ දෙවියන් වහන්සේගේ මහිමය ප්‍රකාශ කරන්නටත් සැමටම ගැළවීම ලඟා කර දෙනු සඳහාත් ය.

කුරුසියේ සොයුරියන්ගේ පැවිදි හවුල ආරම්භ කර අද වන විට වසර 175 ක් ගත වී ඇත. අප මෙතෙක් පැමිණි දිගු ගමන පිළිබඳ මෙනෙහි කිරීමේ දී සියළුම කරදර බාධක අභියස දෙවිඳුන්ගේ බලවන්ත හස්තය අප නිකායේ ඉදිරි ගමනට රැකුලක් වූ බව මනාව පැහැදිලි වේ. වසර 175 ක් පුරා අප ආ මග සමරන මෙම උතුම් වූ මොහොතේ අපගේ ආදර ස්තුතිය දෙවි මහෝත්තමයාණන්ට පුද කිරීම අප සැමගේ යුතුකමකි.

අප සැම ආ ගමන් මග සිහිකරමින් සැප්තැම්බර් 26 වන දින පෙ.ව. 11.00 ට අමන්දොළුව 'ක්ලෝඩීන් නිවස' නම් වූ අප කන්‍යාරාමයේ දි සිදුව මීසම් භාර ගරු ඇන්ටන් ප්‍රේමලාල්, ඩැරල් කුඤ්ඤෝ සහ ජෝන් හෙට්ටිආරච්චි යන පියතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් තුති දීමේ දිව්‍ය යාගයක් පුදකරන ලදි. ගරු ඩැරල් කුඤ්ඤ පියතුමා තම දේශනයෙන් අද මෙම නවීන ලෝකයේ අභියෝග මැද ගමන් කරමින් සිටින පැවිදි සොයුරියන්ගේ ජීවිත දෙවියන් වහන්සේට පක්ෂපාති වීමේ වැදගත් කමත් අපගේ මුවෙහි නැගෙන සිනහ රැල්ලකින් පවා අන් අයගේ ජීවිත ආලෝකමත් කළ හැකි බවත් ඒ තුළ අපට දේව කැඳවීම් ලබාගත හැකි බවත් පෙන්වා දෙන ලදී.

එදා සිට අද දක්වා අපට පැමිණෙන සෑම අභියෝගයක් ම ජය ගනිමින් අපගේ සේවාවන් කරගෙන යාමට අප සැමට ශක්තියක් වූ මගපෙන්වූවා වූ දෙවි මහෝතත්මයාණන්ට අපගේ ප්‍රශංසාවත්, මහිමයත් අත්වේවා.......

**ගරු ශිරානි ෆොන්සේකා පැවිදි සොයුරිය**
කැළණිය

# උත්කෘෂ්ඨ කිතුනු පෞරුෂත්වයක සමාප්තිය

සිහිලැති වාතලයෙන් විකසිත වන සොබාදම් දිනිතියගේ ගම් පියසක් වූ වැලිකන්න ග්‍රාමයේ ප්‍රථම උපාධිධාරියා වීමේ දුර්ලභ වරය ලබාගත් ජෝ රූපසිංහ මහතාණන් වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම උත්කෘෂ්ඨ පෞරුෂත්වයක ප්‍රතිරූපයක් වැන්න. පුද්ගලයෙක් දුටුවිට අව්‍යාජ සිනා රැල්ලකින් මුව මඬල සරසාගත් ඔහු සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයෙක් විය.

එපමණක් නොව ඉංග්‍රීසි මාධ්‍යයෙන් කොළඹ 10 සා. ජෝශප් විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ ඔහු සිය ශාස්ත්‍රවේදි උපාධිය හිමිකර ගත්තේ පේරාදෙණිය ලංකා විශ්ව විද්‍යාලයෙනි. චතුර ලෙස ඉංග්‍රීසි බස හැසිරවීමෙහි නිපුණයකුවූ ඔහු නිරහංකාර බවින් අනූන අයෙකි. එපමණක් නොව ඒ මහතාණන් ජීවිතය දෙස බැලුවේ උපේක්ෂා වෙනි. උපතින්ම ධනවතකු වුවද හෙතෙම කිසි විටෙක එය ආභරණයක් කර නොගත්තේය. සරසවියේදී ආර්ථික විද්‍යාව, දර්ශනය යන විෂයයන් හදාල ඔහු අන්‍යාගම් දෙස බලන ලද්දේ මහෝත්තම දෙවිඳුන්ගේ දෑතේ ඇඟිලි ලෙසිනි.

මාරි අතුකෝරල මෙනවියගේ අතගත් ඔහුගේ විවාහ ජීවිතයද දෙවිඳුන්ගේ ආශිර්වාදයෙන් වෑහෙන්නක් විය. හිතෛෂි දියණියගෙත්, කේසර සහ ප්‍රිණිත් යන පුතුන්ගේත් ආදරණීය පියාණන් වීමේ භාග්‍යය ලැබූ ඔහු මානව හිතවාදියෙක් විය.

දේශීය සංස්කෘතියට නිබඳව ඇලුම් කළ ඔහු ගත කළේ අල්පේච්ඡ දිවි පෙවතකි. එහෙත් ඔහු අද අප අතර නැත. "මිනිසා නැසිය හැකිය. එහෙත් ඔහු පරාජය කළ නොහැකි"යැයි ජගත් කීර්තිධර ලේඛකයකු වු අර්නස්ට් හෙමිංවේ ප්‍රකාශ කර ඇත.

මරණය නම්වූ තාවකාලික අඳුර මගින් ඔබ නසා ඇති වුවද සකල මහා විශ්වයේ උල්පත වූ දෙවියන් වහන්සේගේ අද්විතීය වුත් අසම සම වූත් ආලෝකය අත්දකින්නට ඔබ අප හැම ගොස් ඇත්තේ නිමේෂයකටය. ඔබ පරාජය වී නොමැත. අප ඔබට සගසුව පතන්නේ හමුවේ දිනෙක ඒ ලස්සන ලොවෙහි ඔබ යන යථාර්ථය පසක් කර ගනිමිනි.

**මලින්ත බෝපෙආරච්චි**
දළුගම

## නිවැරැදි කිරීමක්

"පානදුරට පහනක් වූ කිතුනු ගිහියා - මග්ගොන පීටර් ගුරුන්නාන්සේ" යන මැයෙන් පසුගිය සැප්තැම්බර් 20 වන දින ඥානාර්ථ ප්‍රදීපය පත්‍රයේ පළවු ලිපියේ මා පිළිබඳව හැඳින්වීමේදී මා පාර්ලිමේන්තු මැති සබයට බඳවා ගැනුනු සිංහල මාධ්‍ය හැන්සාඩ් වාර්තාකරුවන් අතර පළමුවැන්නා බව සඳහන් කර තිබීම නිවැරදි නොවේ. මා පාර්ලිමේන්තු වාර්තාකරුවකු වශයෙන් බඳවා ගැනීමට පෙර සිංහල මාධ්‍ය හැන්සාඩ් වාර්තාකරුවන් 5 දෙනකු බඳවාගෙන තිබිණි. එවැනි ලිපියක් ප්‍රදීපය පුවත්පතට සැපයීම පිළිබඳව විශ්‍රාමලත් විදුහල්පති පී. ඩී. ජී. ක්ලේමන්ට් මහතාට මම ස්තුතිවන්ත වෙමි. - **ඩබ්ලිව්. එම්. ප්‍රනාන්දු - කනුවන**

# පැවිදි දිවියේ 25 වසර සමරන ප්‍රැන්සිස්කාන නිකායේ ගරු පියසීලි ප්‍රනාන්දු පැවිදි සොයුරිය

**මග්ගොන, මුංහේන පාරේ පදිංචිව සිටි, එච්. නෝරිස් ප්‍රනාන්දු සහ ඇස්. මේරි නෝනා යුවලගේ පවුලේ දරු දැරියන් හත් දෙනාගෙන් හතරවැනි දරුවා වන ගරු පියසීලි පැවිදි සොහොයුරියගේ පැවිදි දිවියේ විසිපස් වසර පූර්ණ වීමේ සමරු උලෙළ, පසුගිය දා මග්ගොන සා. මරියා දෙව්මැඳුරේදී පැවැත්වුනි.**

උපතින්ම බෞද්ධ ආගමික පවුලක් ලෙස හැඳින්විය හැකි වුවද, එතුමිය තම කුඩා අවධියේ සිට කිතුනු ආගම කෙරෙහි මහත් ලැදියාවක් දැක්වූවාය. එතුමිය තම මූලික අධ්‍යාපනය ලැබුවේ, එදා මග්ගොන එඬේරගොඩ පාසල නමින් හැඳින්වු, දැනට සම්බුද්ධරාජ විදුහල නමින් හැඳින්වෙන පාසලේය. ඉන්පසු කළුතර - වේලාපුර බාලිකා විදුහලෙන් අධ්‍යාපනය හැදෑරු එතුමිය. කළුතර - නාගොඩ සුරදූතික නිකායේ ගරු සොහොයුරියන්ගේ නිවාසයේ ශිෂ්‍යාවක් වශයෙන් වසර කීපයක් එහි ඉගෙනීමේ කටයුතු වල යෙදුනාය. එම කාලය තුළදී කතෝලික ආගම හැදෑරීමේ



ආශාවක් ඇය තුළ වූ බැවින්, එම පැවිදි සොහොයුරියන් ගෙන් කිතු දහම පිළිබඳ දැනුම ප්‍රගුණ කර ගැනීමෙන් පසු ප්‍රසාද ස්නාපනය ලබාගත්තේ, තම පවුලේ මව්පිය, සොහොයුරු. සොහොයුරියන්ගේ, බලවත් විරුද්ධතාවය මැද වුවද, පසුව එම විරුද්ධත්වය ඔවුන් කෙරෙන් බැහැර වූ බව එතුමිය පැවසුවාය. එම කන්‍යාරාමයේදී වැඩ කටයුතුවල නිරත වී සිටින කාලය තුළදී, පැවිදි සොහොයුරියක් වීමේ ආශාවක්, ඇයගේ සිත තුළ වර්ධනය වූ නිසා, එම අභිලාෂය ඉටුකර ගැනීමට, 1989 දී රාජගිරියේ පිහිටි මරිය තුමියගේ ප්‍රැන්සිස්කාන නිකායේ ආධුනිකයන් පුහුණු කිරීමේ කන්‍යාරාමයට ඇතුලු වූවාය. එහිදී ලැබූ මනා පුහුණුවෙන් අනතුරුව, 1991 ජනවාරි මස 4 වැනි දින එතුමියගේ පළමු වේදහාර ගැනීමද 1997 දී සදාකාලික වේදහාර ගැනීමද සිදුවිය. එම කාල පරිච්ඡේදය තුළ එතුමිය හැටන්, පොලොන්නරුව, මඩකලපුව, බොරැල්ල, රාජගිරිය, මොරටුව (ජීවනී) හා දෙහිඅත්තකන්ඩිය යන කන්‍යාරාමයන්හි සේවයේ යෙදුනාය. ඇය දැනට බොරැල්ල ප්‍රාදේශාධිපතිනි නිවාසයේ සේවයේ යෙදෙන්නීය.

බොදුනු පවුලක ඉපදී, කිතුනු පැවිදිවරියක් වීමට එතුමියව තෝරාගත් දෙව්පියාණන්ට මුළු හදින් තුති පුදන බවත්, මෙම පසුබිම නිර්මාණය කර ගැනීමට අවශ්‍ය සහය ලබාදුන්, මග්ගොන හිටපු මීසම් සේවක. ගරු බැසිල් වික්‍රමසිංහ පියතුමා ඉතා ගෞරවයෙන් සිහිපත් කරන බවත් එතුමිය පැවසුවාය.

එතුමියගේ ජුබිලි මංගල උලෙළ ප්‍රැන්සිස්කාන තෙවන නිකායේ ප්‍රාදේශාධිපති, අතිගරු මාර්ක් ප්‍රනාන්දු පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලද අතර, මග්ගොන මීසම් සේවක ගරු ඉෂාන් ප්‍රමීන කන්නන්ගර පියතුමන්ගේ මූලිකත්වයෙන් හා මීසම් ජනතාව විසින් සංවිධානය කරන ලදි.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

# සමාජ සේවකයා සමුගනී



**දෙහිගහපිටිය දේවස්ථානයේ පුරාවසර 7 ක් භාණ්ඩාගාරික ලෙස සේවය කළ පිලිප් රාජපක්ෂ මහතා පසුගිය දා අප අතරින් සමුගත්තේය.**

1932 අගෝස්තු 23 දා දෙහිගහපිටියේ ඩේවිඩ් ලියෝ සලමන් රාජපක්ෂ යුවලට උපන් කුළුදුල් දරුවා පිලිප් රාජපක්ෂ නම් විය. දෙහිග හපිටිය රෝ. ක. විදුහලින් සිය ප්‍රාථමික අධ්‍යාපනය ලබා අවිස්සාවේල්ල සා. මරියා මහ විද්‍යාලයෙන් සිය උසස් අධ්‍යාපනය අවසන් කළ මෙතුමා අවිස්සාවේල්ල කැළනිවැලි ක්‍රීඩා සමාජයට බැඳී වොලිබෝල්, කඩුළුපැනීම්. හා උසපැනීමේද දක්ෂ ක්‍රීඩකයකු ලෙසද කටයුතු කළේය.

රජයේ වෙළඳ දැන්වීම් මිලට ගැනීමේ දෙපාර්තමේන්තුවේ ගබඩා නිලධාරි ලෙස 30 වසරක සේවයෙන් විශ්‍රාම ගිය පිලිප් රාජපක්ෂ මහතා දරුවන් 4 දෙනෙකුගේ දයාබර පියෙකු හා ආදර සැමියෙකි.

දෙහිගහපිටිය දේවස්ථානයේ ලේකම් වරයෙක් ලෙස හා පුරා 7 වසරක් භාණ්ඩාගාරික ලෙස මිලකළ නොහැකි සේවයක් සිදුකළ හෙතෙම ඔහුගේ අයවැය වාර්තා විනිවිද දකින හා ඉතා උසස් අන්දමින් ඉදිරිපත් කළේය. ඔහුගේ අය වැය වාර්තා වර්තමානයට අභියෝගයක් හා ආදර්ශයකි.

දෙහිගහපිටිය මීසම් බලප්‍රදේශය තුළ අනුන්ගේ දුක වේදනාව තම වේදනාව බවට පත්කරගත් මේ අභිමානවත් සමාජ සේවකයා අපෙන් සමුගත්තද? දෙවිඳුන් සමඟ මොක් සුව විඳිනු නොඅනුමානය.

**ජයසිරි ප්‍රනාන්දු**
දෙහිගහපිටිය

සැමට සරණ ... 1 පිටුවෙන්

ස්වර්ගස්ථ වී වදාළ ගරු බර්නි සිල්වා පැවිදි සොයුරියගේ අප්‍රතිහත ධෛර්යයෙන් අතිගරු ජෝ ද මැල් පියතුමාගේ මඟ පෙන්වීමෙන් ඇරැඹි මේ කිතුනු දයා සේවාව මේ වන විට විවිධ ක්ෂේත්‍ර ගණනාවක් කරා විහිද ගොස් තිබේ. රජත ජයන්ති සමරුව නිමිත්තෙන් ඔක්තෝබර් 01 දා විශේෂ වැඩසටහනක් පැවැති අතර ඔක්තෝබර් 05 වැනිදා කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ජයන්ති මෙහෙය පැවැත්විය. ශ්‍රී ලංකාවේ අපෝස්තලික තානාපති අති උතුම් ජෝශප් ස්පිටෙරි අගරදගුරු හිමිපාණන් ඇතුළු ආරාධිත අමුත්තන් රැසක් ඊට එක්වූහ. දිළිඳුන් අතර දිළිඳුන් සොයා යමින් මිනිස් බව පමණක් පෙරටු කරගෙන ඇරැඹි සැමට සරණ සේවාව මේ දක්වා දීර්ඝ ගමනක් පැමිණියේ දේව සංරක්ෂණය නිසා බැව් දෙසුම් වලදී තහවුරු විය.

ජේසු නිකායික ... 1 පිටුවෙන්

පැමිණ යට කී ක්ෂේත්‍රයන් අරබයා කරන ලද්දා වූ අනර්ග සේවාව හේතුවෙනි. පිදිය යුත්තන් පිදුම් ලැබිය යුතුය යන යථාර්ථය පසක් කරමින් කැළණි විශ්ව විද්‍යාලයීය පුදබිමෙහි ශාස්ත්‍රීය සම්භාවනාවට සම්ප්‍රාප්ත වූ මෙතුමා හට විශේෂයෙන් ඉතිහාසය හා පාලිභාෂාව යන විෂය ක්ෂේත්‍රයන්ට ඉටු කළ ශාස්ත්‍රීය මෙහෙවර වෙනුවෙන් “මංජුසාව” උපහාරය පුද කරන ලදි. පූජ්‍ය මහාචාර්ය නාබිරිත්තන්කඩවර ඥානරතන හිමියන් හා විශ්‍රාමික මහාචාර්ය ගරු ඇලෝසියස් පිරිස් ජේසු නිකායික පියතුමන් විසින් ප්‍රධාන දේශනයන් සිදු කළ අතර ඉතිහාස අධ්‍යයන ක්ෂේත්‍රයට මෙතුමා කළ සේවය අරබයා මහාචාර්ය කේ. එම්. පී. කුලසේකර මහතාණන් විසින් විද්වත් පඬිරුවන ඇගයීමට ලක් කළේය. අන්තර් ආගමික සහජීවනයේ විචිත්‍රත්වය විදහාලමින් සංවිධානය වූ මෙම උපහාර මහෝත්සවයේදී මෙතුමාණන්ට සමරු පලකය හා මංජුසාව පිළිගැන්වීමට අමතරව ඇස්. ගොඩගේ මැතිතුමන් අතින් පර්නියෝලා පියතුමන් විසින් රචිත ශාස්ත්‍රීය සම්භාවනාවට පාත්‍ර වූ පාලි ව්‍යාකරණ ග්‍රන්ථය පිළිගැන්වීම හා “ක්‍රිසංසා” ශාස්ත්‍රීය සඟරාව පිළිගැන්වීම එදින සිදුවූ විශේෂ අංගයන් ය. මෙතුමාගේ දිවි ගමනේ පිය සටහන් හා සබැඳි සොඳුරු මතකයන් ආවර්ජනය කරමින් නිර්මාණය වූ වාර්තා චිත්‍රපටය හා පියතුමන්ගේ සේවය ඇතුළත් පොත් පිංච පිළිගැන්වීම ද එදින සිදුවිණ.

කොළඹ - කටුනායක ... 1 පිටුවෙන්

2013 ඔක්තෝබර් 27 වන දින විවෘත වීමට නියමිත කොළඹ - කටුනායක අධිවේගී මඟ දැක බලා ගන්නට 22, 23, 24 යන දිනයන්හි ජනතාව එහි පෙළ ගැසෙන විට මීසම් මට්ටමින් දේවමාතා බැතිබර පෙරහරක් පැවැත්වීමට ආරාධනා කරයි.

අගරදගුරු පදවියේ උතුරු කලාපය ආවරණය කරමින් කතෝලික ගම් බිම් මැදින් දිව යන මේ අධිවේගී මඟෙහි “කතෝලික ලකුණ” සංකේතවත් කරමින් එකී මීසම්වල පියතුමන් සියලු මීසම් ජනතාව සමඟ මේ දින තුන තුළ මරිය බැතිය විදහා දක්වමින් අධි වේගී මඟටත්, රජයටත් ආශිර්වාද කරන්න පෙළ ගැසිය යුතු බවට මතක් කර ඇතැයි පදවි ආරංචි මාර්ග සඳහන් කරයි.

ගිහි සහභාගිත්වයේ ... 1 පිටුවෙන්

සංග්‍රාමය මුල් කොට දේව දයාවේ භක්තියටත් වින කරන නිසා සභා නායකත්වය ඒ පිළිබඳව විමසිලිමත් විය යුතු අතර මුද්‍රණ අවසරයකින් තොරව කතෝලික නමින් පොත් පත් පල කිරීමට ඉඩ ලබා දීම පිළිබඳව ඒ ඒ පදවි වල රදගුරුතුමන්ගේ නිහඬතාවය ප්‍රශ්නයක් මතු කරන බවද දැඩිව අවධාරණයට ලක් කර සිටී.

## ගම්පහ සා. පීතරයේ ශ්‍රවණාගාරය ප්‍රතිසංස්කරණය කර විවෘත කැරේ

ගම්පහ සා. පීතර විද්‍යාලයේ අභිනවයෙන් ප්‍රතිසංස්කරණය කොට විවෘත කරනු ලබන විද්‍යාලීය ශ්‍රවණාගාරය මේ මස 15 වන දින ගම්පහ සා. පීතර විදුහලේ ආරම්භකයා වන අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් විශ්‍රාමික අගරදගුරු හිමිපාණන් විවෘත කොට කතෝලික පාසල් සාමාන්‍යාධිකාරි ගරු රංජිත් මදුරාවල පියතුමා විසින් ආසිරි ගැන්වීමට නියමිතය. මෙය අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන්ගේ නාමයට කැපකිරීමට ද නියමිතය.

ජපමාල මාසයෙන් ... 5 පිටුවෙන්

ජපමාල මාසය ගෙවීයත්ම සුපුරුදු රටාවට හුරුවන සමහර කතෝලිකයෝ ගෙයි මැද සාලයට එක් රැස්වී “රූපවාහිනිය” “දෙවියන්” කර ගැනීමට හුරු වෙති. පෙ.ව. 7.00 සිට 10.00 - 10.30 පමණ වනතුරු රූපවාහිනියෙන් විකාශනය කෙරෙන “ටෙලි නාට්‍යය මාලාව”න්ට පවුලේ දෙමාපියන්ගේ සිට කුඩා දරුවා දක්වා වශී වන අයුරු බොහෝ පවුල් වලින් දක්නට ලැබෙන්නකි. මේ අතර වර්තමානයේ ද පවුල් යාච්ඤාවේ දිනපතා යෙදෙන්නෝ ද නැත්තේ නොවේ. එවැනි පවුල් විශේෂාකාරයෙන් මරියෝත්තමාවන් ගේ මැදහත්කමින් දෙව් මහෝත්තමයාණන්ගේ ප්‍රසාදයට ලක් වනු නොඅනුමානය. කතෝලික පවුල් වලින් දේව කැඳවීම් ලබා ජේසු සමිඳු මිදි උයනේ සේවයට ඇතුළත් වන්නෝ ද අනිවාර්යයෙන්ම පවුල් යාච්ඤාවේ යෙදෙන්නෝ වෙති.

එම නිසා සෑම නිවෙසකම “පවුල් ජපමාලය” සඳහා විනාඩි 20 - 25 ක කාලයක් රූපවාහිනිය අක්‍රිය කර තබන්නට මේ “ජපමාලය මාසය” තුළ තිරසාර තීන්දුවක් ගනිමු. දේවමාතාවෝ අපට සරණය වෙති; ශක්තිය වෙති; ආරක්ෂාව වෙති; ස්වර්ගීය ගමනට “ඉණිමඟ” වෙති. ඉදිරි “මරිය වසර” ට මෙම “ජපමාල මාසය” කදිම පූර්ව සූදානමක් කර ගනිමු.

දේව සැලැස්ම ... 12 පිටුවෙන්

මීට අතිරේකව එම විශ්ව ප්‍රකාශනය ආගමික අයිතිය, සදාචාර හා සංස්කෘතික, ආර්ථික අයිතිය, සමිති සමාගම් පිහිටුවීමේ අයිතිය වැනි අයිතීන් රැසක් ගැන අවධාරණය කරයි. ඒ නිසා ජලය ඉල්ලා කරන අයදීම් හෝ මිනිස් ජීවිත පැවැත්මට අදාළ ඔවුන්ගේ අයිතීන් සම්බන්ධයෙන් ජනතාව නඟන අඳෝනාවක් ද සුළු පිරිසකගේ ආත්මාර්ථකාමී අරමුණු උදෙසා දේශපාලන දෘෂ්ටි කෝණ වලින් නොබලා ඔවුන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම ඕනෑම රජයක වගකීමකි. ලෝක සාමය විශ්ව ප්‍රකාශනය සමස්ත ලෝකයටම අදාළ වන්නකි. අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සඳහන් කරන්නේ ද ඒවා ගැනය. ව්‍යවස්ථාව රැකීමට සෑම පාලනයක්ම බැඳී සිටී. ඒ නිසා පසුගිය ප්‍රදීප කතු වැකියේ උධෘතයකින් මෙය නිමාවට පත් කරනු කැමැත්තෙමි. “ඕනෑම ප්‍රශ්නයකට විසඳුම් සෙවීමේදී ජන ජීවිතය ව්‍යාකූල වන අයුරින් නීතිය අතට ගෙන ක්‍රියා කිරීම මෙන්ම බලය අයුතු ලෙස භාවිත කොට එවැනි විරෝධතා මර්ධනය කිරීම කිසිසේත්ම අනුමත කළ නොහැක්කේ ය.”

## විදුහලින් සමුගනී



මීගමුව සා. මරියා මහ විද්‍යාලයේ විදුහල්පති මැක්ස්වල් ඩොනල්ඩ් මහතාගේ අවසන් කටයුතු තිඹිරිගස්කටුව නෙළුම්පිටිය දේවස්ථානයට අයත් සුසාන භූමියේදී විශාල ජනතාවකගේ සහභාගිත්වයෙන් සිදුකෙරිණි.

නෙළුම්පිටිය ශු. පාවුළු මුනිඳුන්ගේ දේවස්ථානයේදී අගරදගුරු පදවි අධ්‍යාපන අධ්‍යක්ෂ සහ කතෝලික පෞද්ගලික පාසල් සාමාන්‍යාධිකාරි ගරු රංජිත් මදුරාවල පියතුමන් ඇතුළු ගරු පියවරුන් විසින් ආගමික වතාවත් ඉටු කරන ලදි. **(රේමන් අපොන්සු)**

## බයිබල් කොමිසම 15 දා රැස්වේ

කොළඹ අගරදගුරු පදවි බයිබල් කොමිසමේ රැස්වීමක් ඔක්. 15 වැනිදා ප.ව. 4.00 ට කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ඇක්වයිනස් සරසවි විද්‍යායතනයේ කාදිනල් කුරේ ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ. සියලු සාමාජිකයන්ට ඊට සහභාගි වන්නැයි අගරදගුරු පදවි බයිබල් අපෝස්තලික සේවාවේ අධ්‍යක්ෂ ගරු දොන් ඇන්ටන් සමන් හෙට්ටිආරච්චි පියතුමා නිවේදනය කරයි.

## පැවිදි දිවියේ ස්වර්ණ ජයන්තිය සමරන සුරදූතික නිකායේ පැවිදි සොයුරියෝ



ගරු මේරි ෆිලෝතියා



ගරු මේරි ක්‍රිසෙන්සියා

ගරු මේරි ෆිලෝතියා සහ මේරි ක්‍රිසෙන්සියා පැවිදි සොයුරියන්ගේ පැවිදි දිවියේ 50 වසර සැමරීමේ තුති පිදීමේ දිව්‍ය යාගය ඔක්. 18 දින කොළඹ සහයක රදගුරු අති උතුම් මැක්ස්වෙල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් කළුතර, නාගොඩ සා. මයිකල් දෙව්මැඳුරේදී සිදුකෙරේ.

## ජාතික තරුණ රැළිය ඔක්. 19

ජාතික කතෝලික තරුණ සංගමය විසින් සංවිධානය කරනු ලබන ජාතික තරුණ රැළිය ඔක්. 19 දින තේවත්තේ ජාතික බැසිලිකා පුදබිමේදී පෙ.ව. 9.00 ට ආරම්භවීමට නියමිතය. තරුණ දූ පුතුන්ට ආරාධනා!

**ගුවන් විදුලියෙන් නත්තල් බැති ගී තරගයක්**

**2013 නත්තල් මංගල්‍යය නිමිත්තෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මෙවරත් නත්තල් බැති ගී තරගයක් සංවිධානය කරනු ලැබේ. ඔබ කණ්ඩායමත් ඊට සහභාගි වීමට කැමති නම් විස්තර ඉල්ලා පහත ලිපිනයට එවන්න.**

**ලේකම්, කිතුනු උපදේශක සභාව,**
**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, කොළඹ 07**

## මේ අන්‍යාගමික නිවාස සංකීර්ණයට එරෙහිව සියළු කතෝලික බලවේග එකට එක්වී පෙළ ගැසිය යුතුයි

### ‘කිතු හඬ’ කතෝලික දහම රැක ගැනීමේ ජාතික ව්‍යාපාරය කියා සිටී

වැල්ල පල්ලිය කාර්මෙල් මාවතේ ඉදිකිරීමට සැලසුම් කර ඇති අන්‍යාගමික නිවාස සංකීර්ණ මාලාව ඉදිකිරීමට එරෙහිව සිය විරෝධය දක්වන ලෙස ‘කිතු හඬ’ කතෝලික දහම රැක ගැනීමේ ජාතික ව්‍යාපාරය කතෝලික ජනතාවගෙන් ඉල්ලා සිටී. කතෝලිකයින් බහුතරයක් වෙසෙන ‘කිතුනු ජන මූල ප්‍රදේශයක්’ වන වත්තල දිසාව මේ වන විටත් අන්‍යාගමික කොටසක් ආක්‍රමණය කරමින් සිටින බවත්, කතෝලික ව්‍යාපාරිකයින් වෙනුවට රජ කරන්නේ අන්‍යාගමික ව්‍යාපාරිකයින් වන අතර වත්තල දිසාවේ කතෝලික ජන ඝණත්වය වෙනස් කරමින් කතෝලික ජනතාව සුළුතරයක් බවට පත් කරමින් කතෝලික ජන පදනම වෙනස් කිරීමට මෙවැනි දැවැන්ත නිවාස සංකීර්ණ ඉදිකිරීමෙන් සිදුවන බවත්, මීගමුව, හලාවත, ජා ඇල, වත්තල වැනි පාරම්පරික කතෝලික ගම්මාන මේ නිසා විනාශ වෙන බැවින් මේ සදහා කතෝලික හා බෞද්ධ ජනතාව එකමුතුව සංවිධානය කළ විරෝධතාවට සිය සංවිධානයද සහාය දක්වන බවත් ‘කිතු හඬ’ කණ්ඩායම ප්‍රකාශ කර සිටී.

## සාමකාමී උද්ඝෝෂණයක්



**වත්තල - වැල්ලපල්ලිය මීසමට අයත් පල්ලියවත්ත කාර්මෙල් මාවතේ පවුල් 250 ක් පමණ වූ පදිංචිකරුවන්ට සෞඛ්‍යමය, පාරිසරික හා සමාජයීය යනාදී ගැටලු රැසක් ඇති කරවමින් ස්වභාවික ජලය බැස යාම් අහුරා ගොඩ කරන ලද අක්කර තුනක පමණ භූමි භාගයක ඉදිකිරීමට යෝජිත නිවාස 880 ක මහල් නිවාස ව්‍යාපෘතියට විරෝධය පෑමේ සාමකාමී උද්ඝෝෂණ ව්‍යාපාරයක් ඉකුත් ඉරිදා (06) පෙරවරුවේ පැවැත්විණ.**

පල්ලියවත්ත දේවස්ථානය අසලින් පටන්ගෙන ඇලකන්ද මංසන්ධියට පැමිණ ජන හමුවක් පවත්වා අදාළ යෝජිත භූමි භාගය දක්වා මෙම විරෝධතා පා ගමන “කාර්මෙල් මාවත සුරැකීමේ සංවිධානය” විසින් සංවිධානය කොට තිබිණි. එහිදී මේ සඳහා නායකත්වය දෙමින් වැල්ලපල්ලිය මීසම් සේවක ගරු ෆීලික්ස් මල්ලවාරච්චි පියතුමා ජනතාව ඇමතූ අයුරු “ප්‍රදීප” කැමරාවට මෙසේ හසුවිය.

ජා-ඇල කලාපීය නාහිමි අතිගරු ශාන්ති කුමාර් වැලිවිට, වත්තල දිසානායක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමන් ද, බලගල අශෝකාරාමාධිපති පූජ්‍ය බටගල්ලේ පඤ්ඤාකිත්ති හිමි, හේකිත්ත සිරි සුගතධම්ම විහාරාධිපති වෙන්නප්පුවේ චන්ද්‍රනන්ද හිමි, හේකිත්ත ගංගාතිලක විහාරාධිපති සරු බිම සීවලි හිමි ඇතුළු ගිහි පැවිදි විශාල පිරිසක් මීට සහභාගි වූහ. **(ස්ටැනිස්ලස් පයස්)**

## සුදතුම් වරම් ලබන ඔබ කතෝලික සභාවට ආලෝකයකි



**පසුගියදා බඩල්ගම මීසමේ තරුණ දරුවන් 110 කට අභිවෘද්ධි ආලේපය සක්‍රමේන්තුව ලබා දෙමින් කොළඹ සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණෝ මෙලෙස ප්‍රකාශ කළහ.**

“මෙම තරුණ දරුවන් සුදතුම් වරමින් පිරෙද්දී සභාවට ආලෝකයක් සේම මේ තරුණ දූ පුතුන් අන් අයට ආදර්ශයක් විය යුතු බවද උන්වහන්සේ තවදුරටත් ප්‍රකාශ කර සිටියේ ය.

එහිදී බඩල්ගම මීසම් සේවක ගරු ඇන්ටන් රංජිත් පියතුමා ද, දොන් බොස්කෝ ආයතනයේ උප අදියුරු ගරු රොෂාන් මිරැන්ඩා පියතුමා ද, කොළඹ සහායක වතු පරිපාලක ජූඩ් ටෙනිසන් පියතුමා ද සමඟින් සුදතුම් වරම් යදින අවස්ථාව සේයාරුවෙන් දැක්වේ. **(කේ. අබේසේකර)**

## මරිය හමුදාව වැඩ අරඹයි

ජා-ඇල, මා එළිය මීසම් සංඝය තුළ මෙවර මරිය වසර මුල් කොට ගනිමින් සෑම නිවසක්ම ආවරණය වන පරිදි දේව මාතා භක්තිය ආරම්භ කිරීමට මා එළිය ජ්‍යෙෂ්ඨ මරිය හමුදාව කටයුතු කරයි.

ආත්මික අධ්‍යක්ෂ ගරු නිහාල් රුද්‍රිගු පියතුමන්ගේ මඟ පෙන්වීමෙන් ඔක්තෝබර් මස 13 වන දින මෙම ආධ්‍යාත්මික ව්‍යායාමය ආරම්භ වන අතර එය දෙසැම්බර් 08 කන්‍ය මරියාවන්ගේ නිර්මල පිළිසිඳීමේ මංගල්‍යය දක්වා දිව යනු ලබයි. එලෙසම කනිෂ්ඨ මරිය හමුදා ස්ථාපිත කිරීමේ කාර්යය ද අඛණ්ඩව ඉටු කිරීමට මා එළිය ජ්‍යෙෂ්ඨ මරිය හමුදාව ප්‍රතිඥා දී ඇත. **(ධම්මිකා බණ්ඩාර)**

# "දිව්‍ය සත්ප්‍රසාදය කිතුනු දිවියේ එකම ශක්තියයි"

## (ඇතුගල්පුර රදගුරු හිමිපාණෝ මග්ගොනදී පවසති)



මිනිස් ජීවිතය ජීවත් කරවීමට ආහාර අවශ්‍යවන්නාසේම, ආධ්‍යාත්මික ජීවිතය ශක්තිමත් කිරීමට දිව්‍ය පෝෂණය අවශ්‍යය. එදා ක්‍රිස්තුස් වහන්සේ තම ජීවිත යාගය පුද කිරීමට පෙර දිනයේ තමන් වහන්සේගේ ගෝලයන් සමග අන්තිම රාත්‍රී භෝජනය පැවැත්වූයේ, එම යාගික සිදුවීම දිනපතා සිහිගන්වනු පිණිස දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීමෙන්ය. අපගේ ජීවිත ගමනට පණ පොවන්නේ දිව්‍ය සත්ප්‍රසාදය තුළ වැඩ වසනා කිතු සමිඳාණෝය. දිව්‍ය භෝජනයෙන් තොර, ජීවිතයක් අපට නොමැත. එහෙත් ඇතැම් අය අද දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට දෙන ගෞරවය දෙවැනි තැනට පත්කරවමින්, සාන්තුවරයන්ට, සුව මෙහෙයන්ට මුල් තැන දෙමින් ඒ පසුපස හඹා යාම අතිශයෙන් කනගාටුවට කරුණකි. අපගේ උතුම් නමස්කාරය පිදිය යුත්තේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේටය. සුදතුම් පියතුමන් විසින් මෙම වසර විශ්වාසයේ වසර වශයෙන් ප්‍රකාශයට පත්කර ඇත්තේද ජනතාව වඩ වඩාත් දෙවිඳුන් කෙරෙහි ළඟා කර ගැනීමට හැකි වනු පිණිස යයි, ඇතුගල්පුර රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ පැවසූහ.

රදගුරු හිමි එසේ පැවසූවේ, මග්ගොන ප්‍රැන්සිස්කන් නිවාසයේ පැවති, අසීසියේ සාන්ත ප්‍රැන්සිස් මුනිඳුන්ගේ 80 වැනි වාර්ෂික මංගල සන්ධ්‍යා මෙහෙයේදීය. මග්ගොන ප්‍රැන්සිස්කන් නිවාසයේ අධ්‍යක්ෂ ගරු ජුඩ් අසන්ත පැ.තු.නි. පියතුමන්ගේ මූලිකත්වයෙන් ගරු සහෝදරතුමන්ගේ සහයෝගයෙන් මෙම උළෙල අර්ථවත් අන්දමින් පැවැත්වුණි. **(ඩී. ඇන්සලම් ප්‍රනාන්දු)**

## සදසරණ නුවානයේ 55 වසර ජයන්තිය



මොරටුව සදාසරණ නුවානය 1958 ඔක්තෝබර් 29 වැනි දින මරිය සෙන්පතියකු වූ මීසම් සේවක ගරු එඩ්මන් ජේ.ප්‍රනාන්දු පියතුමාගේ අනුබලය සහ මග පෙන්වීම හා මරියානුවන්ගේ නොමසුරු සහයෝගය ඇතිව විශාල ජනකායක් මැද ආරම්භ විය. සදාසරණ මෑණියන් පුදන්නට පැමිණි සැදැහැවතුන් සඳහා දෙව්මැඳුරේ දකුණු පස ඇකුම්කළ මණ්ඩපයක් ඉදිකර තිබුණි. එහි මුදුනෙහි "මෙන්න ඔබේ මෑණියෝය" යනුවෙන් සඳහන්ව තිබුණි. මේ මණ්ඩපය 1983 පැවැති රජත ජයන්තිය නිමිත්තෙන් ගරු ලෝරන්ස් පෙරේරා පියතුමා නවීකරණය කරනු ලැබීය.

මොරටුව සදාසරණ නුවානය ආරම්භ කර වසර 55 සපිරීම නිමිත්තෙන් ඔක්තෝබර් 30 වන බදාදා එය සැමරීමට මීසම් සේවක ගරු බර්ට්‍රම් රංජිත් පියතුමාගේ මග පෙන්වීම මත මරිය හමුදාව සියළු කටයුතු ක්‍රියාත්මක කරමින් සිටී. **(රංජිත් කුරේ, සනී ෆ්‍රැන්සිස් ප්‍රනාන්දු**



මීගමුව නව අධිකරණ සංකීර්ණය අභිනවයෙන් විවෘත කිරීම නිමිත්තෙන් මීගමුව නීතිඥ සංගමය සංවිධානය කළ ආගමික මෙහෙයක් එම අධිකරණ සංකීරණයේදී සිදු කරන ලදී. උතුරු කොළඹ කලාපීය නාහිමි අතිගරු පැට්‍රික් පෙරේරා පියතුමා සමග එක්ව මහවීදියෙ මීසම් සේවක ගරු ශ්‍රියානන්ද ප්‍රනාන්දු, තිල්ලන්දූව මීසම් සේවක ගරු ඇතනේසියස් සමරසිංහ පියතුමා දේව මෙහෙය පැවැත්වූ අයුරු.

**(රේමන් අපෝන්සු)**

## වේල්ගම දෙව්විමනේ වාර්ෂික මංගල උළෙලට මහ සෙනගක් !

හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස් සහ සහයක ගරු රොෂාන් චමින්ද පියතුමන්ගේ මග පෙන්වීම අනුව ධර්මදූත කලාපීය නාහිමි අතිගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් හංවැල්ල මීසමට අයත් අනිකුත් සභාවල සහභාගිත්වයෙන් "ජයලත් අප ස්වාමිදුව වන දේවමාතාවන්ගේ" දෙව් විමනේදී අති උත්කර්ෂවත්ව මංගල දිව්‍ය යාගය පැවැතුනි.

රමණීය භූමි භාගයක පිහිටා ඇති එක් අන්තයකින් කැළණි ගංගා කොමළිය ගලා බසින භාග්‍යවත් ජුසේ වාස් පිය සටහනින් පෝෂණය වූ ඉපැරණි කිතුනු සංඝයකින් පැවත එන ජයලත් අප ස්වාමිදුවගේ දෙව් විමන අද රමණීය දැකුම් කළු නව දෙව් මැඳුරක් බවට පත්ව ඇති අතර මෙම මංගල උලෙළට විශාල ජනකායක් සහභාගි වූහ.

**(ඇග්නස් විජේතුංග)**



පමුණුගම මීසමේ ඒකකවලට දෙව්මව්ගේ ප්‍රතිමාව වැඩම කරවීමේ උත්සවය පමුණුගම සේද උයන කුඩා දෙව්මැඳුරේ සිට ආරම්භ කළහ. මෙදින සේද උයන මීගමුව කලපුව ආශ්‍රිතව කොඩිගස ඔසවා කටයුතු ඇරඹීය. පමුණුගම මීසම් සේවක ගරු ආනන්ද විතාන පියතුමා ඔක්තෝබර් මාසයේ සැලැස්ම විස්තර කළ අයුරු.

මේ මාසය තුළ තමා වෙනුවෙන් නොව අන් අය උදෙසා යාච්ඤා කරන ලෙසත් විශේෂයෙන් දෙව්මව්ට අපහාස කරන අයටත් අප සභාවෙන් කැඩීගිය අප සහෝදරයන් වෙනුවෙනුත් දෙව්මව් යදින ලෙසත් ඉල්ලා සිටියේය. ගරු රසික ලෝරන්ස් පියතුමා සමග මෙදින විශාල පිරිසක් සේද උයනට එක්රැස්වූහ.

**(බෙන්ජමින් කිරිහෙට්ටි)**



දේව මාතා මංගල්‍යය සනිටුහන් කරමින් හංවැල්ල මීසමේ කිතුනු ජනතාව එතුමියගේ ප්‍රතිමාව රැගෙන මෙසේ වීදි සංචාරය කළේ නිරිපොල දේවස්ථානයේ සිටය. හංවැල්ල මීසමේ පහත්ගම ශුද්ධවූ ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුරේ පැවති විශේෂ දේව මෙහෙය සඳහා සහභාගි වූ කිතුනු ජනතාව නිරිපොල සිට ගමන් කළහ. හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස්, සහයක ගරු රොෂාන් චමින්ද පියතුමන්ද මහත් කැපවීමකින් මෙවර පෙරහර සංවිධානය කරන ලද අතර ඊට හංවැල්ල මීසමේ සියලු කිතුනු ජනතාවගේ පූර්ණ සහයෝගය ලැබිණ.

**(නිහාල් ආර්. වෙත්තසිංහ)**


**අන් කවරක් හා සමාන නොවන අධ්‍යාත්මික වන්දනා ගමන් ක්වෙස්ට් සමගින් විශිෂ්ට වන්දනා චාරිකා සොයා යන්න.**

**ශුද්ධවූ දේශය** — 08 දින චාරිකාව



ජෙරුසෙලම
නාසරෙත්
මළමුහුද
ජෙරිකෝව
සමගින්
කේබල් කාර් චාරිකාව
සහ තවත් බොහෝ දේ..

ජෝර්දානය
බෙතානිය
ටයිබීරියස්
කානා
බෙත්ලෙහෙම්

රු. 169,000/-

2014 පිටත්වීම් :
ජන. 21 / පෙබ. 25 / මාර්තු 06 / අප්‍රේ. 09 / මැයි 23 / ජූනි 13

09 දින චාරිකාව
**ඉතාලියේ සිද්ධස්ථාන චාරිකාව**



රෝමය
වතිකානය
පාද්රේ පියෝ
ලැන්ෂියානෝ
පාදුවා
අසීසිය
ලොරෙටෝ
රෝස කුසුම

විශේෂ බැහැදැකීම් :
පිළිකා රෝගීන්ගේ ආරක්ෂක සාන්තුවර
සා. පෙරිග්‍රීනු ලිසියෝසි තුමා
අමතරව විවිධ ආගමික ස්ථාන කරා
බැහැදැකීම්

රු. 239,000/-

පිටත්වීම :
2013 නොවැම්බර් 26

දැන් ! 11 දින ආධ්‍යාත්මික වන්දනා චාරිකාව
**පාතිමා සහ ලූර්දු**
නේවර්ස් ලිස්බන් වලට අමතරව පැරිසියේ නගර චාරිකාවක්
2014 පාස්කුව වරප්‍රසාද මැද
ලූර්දුවේ හා පාතිමාවේ ගත කරන්න.

2013 නොවැ. 30 ට
පෙර වෙන්කර ගෙන
රු. 20,000/-
වට්ටමක් ලබා ගන්න.

රු. 310,000/-

විශේෂ පිටත්වීම :
2014 අප්‍රේල් 09

දැන් ! 11 දින ආධ්‍යාත්මික චාරිකාව
විශේෂ පිටත්වීම :
2014 අප්‍රේල් 12
**ලූර්දුව**



රෝමය
වතිකානය
පාදුවා, අසීසිය
රෝස කුසුම
නේවර්ස්
පැරීසිය පුරා
දිනක නගර සංචාරය

රු. 310,000/-

ලූර්දුවේ දී 2014 පාස්කුව
ආසිරි මැද ගත කරන්න.

2013 නොවැ. 30 ට පෙර වෙන්කරවාගෙන රු. 20,000/- වට්ටමක් ලබා ගන්න.

(Q13N4808)

අපගේ සියලු වන්දනා චාරිකාවලට ඇතුළත් දෑ ගුවන් ගාස්තු / නවාතැන් / සියලු ආහාර / ප්‍රවාහනය / අවට සිරිනැරඹීමේ චාරිකා / තෝරාගත් චාරිකා සඳහා පසු ගෙවීමේ ක්‍රම
"Easy Payment Schemes on Selected Tours"

**ක්වෙස්ට් ඩෙස්ටිනේෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ්**
අංක 119 A, කාසල් වීදිය, කොළඹ 08. | දු.ක. : +94112671785-6 | ෆැක්ස් : +94112671787
ඊමේල් : lalanee@qwestdestinations.com හෝ darshi@qwestdestinations.com
වෙබ් අඩවිය : www.qwestdestinations.com

Qwest Destinations. Where you begin your quest for the ultimate Vacation
Nations TrustBank
IATA

## සෙබස්තියන් විදුහලේ එකමුතු පා ගමන



සාන්ත සෙබස්තියන් විදුහල අප මව්බිමට විශිෂ්ට පුරවැසියන් බිහිකිරීමේ ලා වැදගත් ස්ථානයක පසුවේ. මෙය රාජ්‍ය සහය ඇතිව පවත්වාගෙන යන පෞද්ගලික පාසලකි. මොරටුව පුරවරයේ ළමුන් 3200 ක් මෙම පාසලේ අධ්‍යාපන කටයුතු වල නිරතවේ. නව සහශ්‍රයට ගැලපෙන ආකාරයට පාසල ඉදිරියට ගෙන යාම අප අරමුණයි. ළමුන්ගේ කුසලතා ඉස්මතු කරගත හැකි වනසේ නව තාක්‍ෂණය සහ ක්‍රම ශිල්ප මත ඉදිරිගමනේදී ඔවුනට අත්වැලක් වීම අප අරමුණයි. නව පංති කාමර 08 ක් සහ බැඩ්මින්ටන් පිටි 2 ක් පාසලට එක් කිරීමට අප සැලසුම් කර ඇත. ඒ සඳහා 2013 ඔක්තෝබර් 26 සෙනසුරාදා උදේ 7.30 ට ඇරඹෙන එකමුතු පා ගමන හා සංගීතමය වැඩසටහන් මගින් අවශ්‍ය මූල්‍ය ආධාර එක්කර ගැනීම අප අරමුණ වේ. මෙදින 1500 ක පමණ පිරිසකගේ සහභාගීත්වයද සිසු දරුවන්ගේ හා ආදි ශිෂ්‍යයන්ගේ සහයද හිතවත් නරඹන්නන්ගේ පැමිණීම ද ඉතා අගය කරමු. මෙම පා ගමන හා සංගීතමය වැඩසටහන් තුළින් අවශ්‍ය අරමුණ සාක්ෂාත් කර ගැනීම අප සියල්ලන්ගේ බලාපොරොත්තුව වේ.

**විදුහල්පති - ගරු බොනී ප්‍රනාන්දුපුල්ලේ පියතුමා**

### වර්තමානයෙන් බිඳක්...

2003 වසර ශාන්ත සෙබස්තියන් විදුහලට ඓතිහාසික වසරක් විය. අවු. 75 ක පමණ ද ලාසාල් සහෝදර තුමන්ගේ පාලන යුගය 2003 වසරේ අවසන් කර පාසල නැවත කොළඹ අගරදගුරු තුමාට බාරදෙන ලදී. එතැන් පටන් විදුහලට නව යුගයක් උදාකර දුන් ගරු බොනී ප්‍රනාන්දුපුල්ලේ පියතුමා පාසලේ සියළුම වගකීම් තමා වෙත පවරා ගත්තේය. පාසලේ සියළුම අංශ එක හා සමානව අධ්‍යයනය කර පසුව පාසල ශීඝ්‍ර දියුණුවක් කරා මෙහෙය විය. ඉපැරණි ගොඩනැගිලි බිඳ වැටුණි, නව සිව්මහල් ගොඩනැගිලි කිහිපයක් ඉදිවිය. පාසල් විනය අධ්‍යාපන තත්වය සිසුන්ගේ අධ්‍යාපන තත්වය ළමුන්ගේ අධ්‍යාපන ප්‍රතිඵල සියල්ලම එක ලෙස දියුණු විය. පාසල නව මාවතක් කරා යොමු විය. එපමණක් නොව ක්‍රීඩා අංශය ද ඉතා උසස් තත්වයකට ගෙන එමින් 2013 වසර 17 න් පහළ පාසල් ක්‍රිකට් අනුශූරතාව දිනීමේ වාසනාව පාසලට උදාකර දෙන ලදී. මෙවර 2013 ඔක්තෝබර් 26 වෙනි සෙනසුරාදා උදේ 7.30 ට ඇරඹෙන මෙම පාසල් පා ගමන ඉදිරි ගමනට අත්වැලක් වනු ඇත. තවද මෙම ඉදිරි ගමන දේව වරප්‍රසාදය පිරි නව යුගයක් උදාවේ යන්න අපේ පැතුම වේ.

**(ආන්ජලෝ සිල්වා, උප සභාපති, ආදි ශිෂ්‍ය සංගමය)**

## ගරු පියතුමා ශාස්ත්‍රපති උපාධිය හිමිකර ගනී



ගරු ක්‍රිෂාන්ත ජයලත් නි.ම.නි. පියතුමා ඕස්ට්‍රේලියාවේ "කේන්මිලර්" උපදේශන හා මනෝචිකිත්සක උසස් අධ්‍යාපන ආයතනයෙහි වසර දෙකහමාරක් අධ්‍යාපනය ලබා, පවුල් සබඳතා බිඳ වැටීම් වලදී ප්‍රතිකර්මයක් ලෙස ගැනෙන, කෙටි කාලීන සක්‍රීය මනෝ චිකිත්සාව යටතේ "වක්‍රාකාර වැරදි පුහුණු රටා" (Cyclical Maladaptive Patterns) පිළිබඳ සිද්ධාන්තය යොදා ගන්නා ආකාරය ගැන, සමීක්ෂණයක යෙදී, නියමිත නිබන්ධනය ඉදිරිපත් කර, එම උසස් අධ්‍යාපන ආයතනයෙන් උපදේශන හා මනෝ චිකිත්සාව පිළිබඳ "ශාස්ත්‍රපති" උපාධිය හිමිකරගෙන ඇත.

එතුමා සිය අධ්‍යාපන කටයුතුවලට අමතරව මෙල්බන් රදගුරු පදවියේ, සොරෙන්ටෝ මීසමේ සහයක පියතුමා ලෙස සේවය කර තිබේ. තවද මෙල්බන් නුවර අවට නගර වල වෙසෙන ශ්‍රී ලාංකීක සංක්‍රමණිකයන්ගේ අධ්‍යාත්මික අභිවෘද්ධිය සඳහා ද සිය කාලය හා ශ්‍රමය වැය කර ඇත. ගරු ක්‍රිෂාන්ත ජයලත් නි.ම.නි. පියතුමා දැනට ජා-ඇල කණුවන "සහන මැඳුර" උපදේශන මධ්‍යස්ථානයේ සහය අධ්‍යක්ෂවරයා ලෙස උපදේශන සේවාවේ යෙදී සිටී.



අභිවෘධි ආලේපය ලබන දෙමව්පියන් සඳහා පෝෂණ වැඩසටහනක් පසුගියදා බොරලැස්ස දේවස්ථානයේදී පැවැත්වින. තාරුණ්‍යය තරුණ මනස පවුල හා පවුල් ජීවිතය යන මැයෙන් දේශන මාලාවක් එදින පුරාම දෙමාපියන් වෙත ලබා දෙන ලදී.

මීසම් සේවක ගරු ඇලෙක්ස් වීරසූරිය පියතුමාගේ මඟපෙන්වීම යටතේ සංවිධානය කර තිබූ මෙම පෝෂණ වැඩසටහන සඳහා හලාවත පවුල් සේවා අධ්‍යක්ෂ ගරු අශෝක් ප්‍රියන්ත පියතුමා හා ජාතික විවාහ හමු මෙහෙයුම් සංසයේ පැට්රික් + විනිෆ්‍රෙඩ්, ටෙරන්ස් + ඩොනිටා යන යුවල්ද සහභාගි විය. එම වැඩසටහනේදී අධ්‍යක්ෂ ගරු අශෝක් ප්‍රියන්ත පියතුමා දෙමාපියන් අමතා කථාකරන අයුරු.

**(ඩබ්.පී. ටෙරන්ස් ප්‍රනාන්දු)**

## කඩලාන දොන් බොස්කෝ සමිතිය ස්වර්ණ ජයන්තියට සැරසේ

1963 වසරේදී කඩලාන ශා. අන්තෝනි දෙව්මැඳුරේ මීසම් සේවකව සිටි ස්වර්ගස්ථ වූ ගරු ජූලියස් විජේසූරිය පියතුමා ග්‍රාමයේ තරුණයන් පිරිසක් එක් කරගෙන පිහිටුවා ගත් සාන්ත දොන් බොස්කෝ සමිතියට වසර 50 සපිරීමේ උත්කර්ෂවත් ස්වර්ණ ජයන්තිය නොවැම්බර් 03 දිනට යෙදී ඇත.

එදින අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් දෙවිඳුන්ට තුති පිදීමේ සංවත්සර දිව්‍ය පූජාව සවස 6.00 ට පැවැත්වෙන අතර සවස 5.30 ට සැපත්වන සහයක රදගුරු හිමිපාණන්ව දේවස්ථානයේ දකුණු පසින් ඇති දොරටුව අසලින් පිළිගෙන මීසම්වාසීන් හා පරිත්‍යාගශීලීන්ගේ දායකත්වයෙන් ඉදිකරන ලද නව අලංකාර මණ්ඩපය විවෘත කිරීමට නියමිතය. මේ මණ්ඩපයේ ඉහලින් තැන්පත් කරන ලද ශාන්ත අන්තෝනි මුනිතුමාගේ ප්‍රතිමාව දේවස්ථානයට ලබාදී ඇත්තේ සාන්ත දොන් බොස්කෝ සමිතිය විසිනි.

තරුණ සමිතියක්ව පැවති මෙම සමිතියට විවිධ බාධා එල්ලවිය. මෙම බාධක මනාව අවබෝධකර ගත් මොරටුව දිසා නායක අතිගරු ලලිත් පෙරේරා පියතුමා තරුණයන්ට පමණක් සාමාජිකත්වය ලබා ගත හැකිව තිබූ මෙම සමිතියේ බන්ධනය වෙනස් කර එය මීසමේ පුරුෂ පක්ෂයට විවෘත සමිතියක් වශයෙන් යලි පණගැන්වීම සමිතිය ඉදිරියට ගෙන යෑමට මනා පිටුවහලක් විය.

ග්‍රාමයේ පොදු කටයුතු රාශියක් දුප්පත් ජනතාව ඉලක්ක කරමින් සිදු කෙරෙන අතර කඩලාන ශාන්ත අන්තෝනි විදුහල යළි පණ ගැන්වීමේ කර්තව්‍යයට ගරු පියතුමාට විශාල ශක්තියක් ලබා දුන් සමිති අතර ප්‍රධාන සමිතියක් බවටද පත්ව ඇත. මෙම සමිතියේ සාමාජිකත්වය දරන ප්‍රබල සාමාජිකයකු එම විදුහලේ විදුහල්පති ලෙස කටයුතු කරමින් පාසල විශාල ප්‍රගතියකට පත්කර තිබීම මෙම සංවත්සර වසරේදී ඉතිහාසයට එක්වන විශේෂ කරුණක් වී ඇත.

මීසමේ උඳුවප් නත්තල් අසිරිය නමැති වාර්ෂික නත්තල් උත්සවය පැවැත්වීමේ කාර්ය ගරු පියතුමා භාරදී ඇත්තේද සාන්ත දොන් බොස්කෝ සමිතියටය. වසර 50 සපිරෙන විශේෂ දිනයේදී සිදුවෙන තවත් විශේෂ සිද්ධියක්වන්නේ වසර 25 සංවත්සරය මහත් අභිමානයෙන් සැමරීමේ අවස්ථාවේදී මෙම සමිතියේ සභාපති ධූරය හෙබවූ අනිල් ප්‍රනාන්දු මහතාටම මෙම සංවත්සර උත්සවයටත් එම ධූරයේ සිට පැවැත්වීමේ භාග්‍ය උදාකරදීමට දෙවිඳුන් මැදිහත් වී ඇති ආකාරයයි.

**(සුමිත් මාර්ක් ද සිල්වා)**

## රාගම ලෙංචියාවත්ත දහම් පාසල් ගොඩනැගිල්ල ඔක්. 16 දා ආසිරි ගැන්වෙයි.

රාගම මීසමට අයත්, ලෙංචියාවත්ත ක්‍රිස්තු රජාණන්ගේ දෙව්මැඳුරේ අභිනව දහම් පාසල් ගොඩනැගිල ඔක්තෝබර් 16 වන බදාදා සවස 5.00 ට එම දෙව්මැඳුරේදී කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන දිව්‍ය පූජා යාගයක් අනතුරුව විවෘත කර ආසිරි ගැන්වෙයි.

මේ ගොඩනැගිල්ල අංග සම්පූර්ණව නිම කර ගැනීමට අති උතුම් අගරදගුරු හිමිපාණන් විශේෂ මූල්‍යමය දායකත්වයෙක් දුන් බවත්, ඊට අමතරව ලෙංචියාවත්ත සැදැහැවත් හා ප්‍රදේශයේ පරිත්‍යාගශීලීන් දුන් සහයෝගය හා දායකත්වය ද අගය කළ යුතු බවත් රාගම මීසම් සහයක සහ ලෙංචියාවත්ත දෙව්මැඳුර භාරව කටයුතු කරන ගරු නලින් සුරාජ් පියතුමා "ඥානාර්ථ ප්‍රදීපයට පැවසීය.

**(සී.ආර්. ඩික්සන් ඇන්ටනි)**



කොළඹ අගරදගුරු පදවි ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරය මුහුණ දී තිබූ අර්බුදකාරී තත්ත්වය විසඳීම සඳහා කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් පත් කරන ලද කොමිසමේ විමර්ශන කටයුතු නිම වීමෙන් පසු අගරදගුරු හිමිපාණන් විසින් එම ව්‍යාපාරයේ උපාධ්‍ය වශයෙන් පත් කරන ලද ගරු නිලන්ත හේෂාන් ප්‍රනාන්දු පියතුමන් පදවි විධායක කමිටුව විසින් චාම් අන්දමින් පිටකොටුව 6 වැනි පාවුළු මධ්‍යස්ථානයේ දී පිළිගන්නා ලදී. සභාපති හෙක්ටර් සහ දයානි පීරිස් යුවළගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම රැස්වීමේදී ගරු පියතුමා සහභාගී වූවන් අමතන අයුරු හා සහභාගි වූවන්ගෙන් කොටසක් මෙහි වෙති.

**(සී.ආර්. ඩික්සන් ඇන්ටනි)**



බෝපිටිය වැල්ලබඩ පිහිටුවා ඇති නාවික හමුදා කඳවුරේ නිලධාරීන් සැම දෙවිඳුන්ට තුති දීමේ දිව්‍ය පූජාවක් බෝපිටිය සා. නික්ලස් මුනි දෙව්මැඳුරේදී මීසම් සේවක ගරු එරින්ටන් සිල්වා පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කිරීමෙන් පසු මීසමේම පුත් නාවික රණවිරුවකු ගරු සිරියා පැවිදි සොයුරිය මග සුහද කතාබහක යෙදී සිටි අයුරු.

**(ක්‍රිස්ටි ඔස්මන් පෙරේරා)**

## විල්පත ශු. ජූඩ් මුනි මංගල්‍යය සරුයි

අගුණවිල මීසමට අයත් විල්පත ශු. ජූඩ් තදේවුස් මුනිතුමන්ගේ දේවස්ථානයේ වර්ෂික මංගල්‍යය මෙවර හලාවත පදවි පරිපාලක අතිගරු පැට්‍රික් විජේසිංහ පියතුමන්ගේ මූලිකත්වයෙන් පැවැත්විණි.

මීසම් සේවක ගරු අනුර ගම්ලත් පියතුමා කටයුතු සංවිධානය කළ අතර පෙරදින සන්ධ්‍යා මෙහෙය විල්පත ග්‍රාමයෙන් බිහි වූ දේශනාවාදී ගරු රොෂාන් තිසේරා පියතුමන්ගේ මෙහෙයවීමෙන් පැවැත්විණි.

ශුද්ධවූ ජූඩ් තදේවුස් මුනි තුමන්ගේ ප්‍රතිමාව රැගත් පෙරහර ගොක් රැහැනින් හා පුන් කලසින් මනස්කාන්ත ලෙස සැරසූ මාර්ගය ඔස්සේ වීදි සංචාරය කොට අවසානයේ ගමටත්, රටටත් ආගම් හා ජාතීන් අතර සහජීවනයත්, සාමයත් උදාවේවායි පතා ජූඩ් මුනි ප්‍රතිමාවෙන් බැතිමතුන් ආසිරි ගැන්විය.

**(පීටර් කැමිලස් සුබසිංහ)**



නිට්ටඹුව ශා. අන්තෝනි දෙව්මැඳුරට අයත් ශා. වින්සෙන්තිද පාවුලා කොන්පරසය මගින් සෑම මාසයකම රජයේ පිංපඩි ලාභීන්ට උදෑසන තේ හා බනිස් සංග්‍රහයක් පවත්වයි. නිට්ටඹුව තැපැල් කාර්යාලීය පරිශ්‍රයේදී පැවති අවස්ථාවකට උප තැපැල් ස්ථානාධිපති ඇම්.ඒ. ඇන් ජයශාන්ත හා ඇන් විමලසිරි මහත්වරුද එම සංගමයේ උප සභාපති හෙන්රි ජයතිලක හා විනිප්‍රිඩා ප්‍රනාන්දු කුසුමලතා පීරිස් යන සාමාජිකාවන්ද සහභාගි වූ අයුරු.

**(සේයා : ඔස්වල්ඩ් ස්ටැන්ලි, සටහන : ඇන්ටනි මොරගොඩ)**

## කන්ද උඩරට දයා සේවා සංවත්සර රැස්වීම

සාන්ත වින්සෙන්ති ද පාවුලා සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම හා නිලවරණය පසුගියදා මහනුවර රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පදවි අධ්‍යක්ෂ ගරු සුදත් රෝහණ පියතුමාගේ අධීක්ෂණය මත ගැටඹේ ගිහි අපෝස්තලික සේවා මධ්‍යස්ථානයේදී පැවැත්විණි.

එහිදී නව සභාපති සිල්වෙස්ටර් සෙබස්තියන්, ලේකම් ශාන්ති ජම්බුගේ, භාණ්ඩාගාරික ලාල් මඩසේකර පත් වූ අතර ව්‍යාපෘති නිලධාරී ජෝර්ජ් 2016 දක්වා පත්විය.

මේ අවස්ථාවට ආත්මීක පියවරුන්ද, ජාතික සභාව නියෝජනය කරමින් සභාපතිනි ලියෝනි ප්‍රනාන්දු සොයුරියද ලේකම් රොෂාන් ගුණරත්න සොයුරාද, පදවියේ සෑම කොන්ෆරන්සයක නියෝජිතයින් පස් දෙනා බැගින් ද සහභාගි වූහ.

**(ශාන්ති ජම්බුගේ)**



පසුගියදා ජර්මනියේ පැවති ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ ජාත්‍යන්තර මහා සභා රැස්වීමේදී ශ්‍රී ලංකා ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ හිටපු ජාතික සභාපතිවරයකු වූ ඇන්ටනි මංචනායක මහතා අන්තර් ජාතික විධායක කමිටුවේ ජාත්‍යන්තර විධායක සාමාජික ලෙස නිතරගයෙන් තෝරා පත් කරගනු ලැබින. අනතුරුව ශ්‍රී ලංකාවට පැමිණි ඒ මහතා මට්ටක්කුලිය නි.ම.නි. කේන්ද්‍රයේදී උත්සවශ්‍රීයෙන් පිළිගනු ලැබින. ඡායාරූපයෙන් දැක්වෙන්නේ එහි ජාතික උපාධ්‍ය ගරු රන්ජන්මාල් මොරායස් පියතුමා විසින් සමරු පදක්කමක් පලඳවන අයුරුයි. ඡායාරූපයෙ වමේ සිට ජාතික ලේකම් සුධර්මා පෙරේරා ජාතික සභාපති තියබෝල්ඩ් සමරතුංග ශ්‍රී ලංකා ජාත්‍යන්තර සම්බන්ධීකාරක ශිරාන් මෛත්‍රී, ජාතික භාණ්ඩාගාරික ඩේමියන් ප්‍රනාන්දු යන මහත්ම මහත්මීහුද වෙති.

**(අජිත් පෙරේරා)**

## වැලිවිට සාන්ත විසෙන්ති පාවුලා 30 වැනි සංවත්සරය

වැලිවිට සාන්ත මරියා දෙව්මැඳුරේ සාන්ත විසෙන්තිද පාවුළු සමිතියේ තිස්වන සංවත්සර දිව්‍ය පූජා යාගය හා උපහාර උත්සවය ජුසේවාස් දේව ධර්ම නිකේතන අදියුරු ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මෙදින ග්‍රාමයෙන් සමිඳු මිදි උයනේ සේවයට කැපවූ පූජක පුතුන් හා පැවිදි සොයුරියන් බිහි කළ ආදරණීය දෙමාපියන් හට උපහාරයද, මීසමට කළ සේවය වෙනුවෙන් ගිහි මහත්ම / මහත්මීන් කීපදෙනෙකුට උපහාරයද සාන්ත විසෙන්තිද පාවුළු සමිතිය වෙනුවෙන් තිස් වසරක කැපවීම වෙනුවෙන් සාමාජික උපහාරයද සිදුකරන ලදී. මෙම උළෙල සඳහා මීසමේ පූජක පුතුන් වන ගරු සුදත් සිල්වා හා ගරු ඩෙනිස් ඉද්දමල්ගොඩ (නි.ම.නි.) පියතුමා සමගින් මීසම් සේවක ගරු අර්නස්ට් ද මැල් පියතුමා සහභාගි විය.

**(සුසිල් හැරිසන්)**